TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

# මැතිවරණ ව්‍යාපාරවල මූල්‍යකරණයේදී ශ්‍රී ලංකාවේ සුළුතර ප්‍රජාවන්හි කාන්තා අපේක්ෂිකාවන් මුහුණ දෙන අභියෝග පිළිබඳ අධ්‍යයනය

2026



# මැතිවරණ ව්‍යාපාරවල මූල්‍යකරණයේදී ශ්‍රී ලංකාවේ සුළුතර ප්‍රජාවන්හි කාන්තා අපේක්ෂිකාවන් මුහුණ දෙන අභියෝග පිළිබඳ අධ්‍යයනය

2026



TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

# මැතිවරණ ව්‍යාපාරවල මූල්‍යකරණයේදී ශ්‍රී ලංකාවේ සුළුතර ප්‍රජාවන්හි කාන්තා අපේක්ෂිකාවන් මුහුණ දෙන අභියෝග පිළිබඳ අධ්‍යයනය - 2026

Research by: Social Scientists' Association

Design: Haritha Dahanayaka

Transparency International Sri Lanka
366, Nawala Road, Nawala,
Rajagiriya,
Sri Lanka.

Phone: +94 11 4 369 781
Fax: +94 11 2 865 777
Email: tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

Twitter: twitter.com/tisrilanka
LinkedIn: lk.linkedin.com/company/tisrilanka
Facebook: facebook.com/tisrilanka
Instagram: instagram.com/transparency_sri_lanka
YouTube: youtube.com/tisrilankatube

Transparency International Sri Lanka (TISL) is an independent, non-governmental, non-profit and nonpartisan organisation with a vision of Sri Lanka in which government, politics, business, civil society and the everyday lives of citizens are free from corruption. As the fully accredited national chapter in Sri Lanka of the Berlin-based Transparency International (TI), TISL partners and works with TI and its chapters world-wide.

# අන්තර්ගතය


**අධ්‍යයනයේ පසුබිම** 2

**ඇගයීමේ ක්‍රම සහ සීමා** 3
**ලේඛන හා තොරතුරු පර්යේෂණය** 3
**ආනුභවික දත්ත එක්රැස් කිරීම** 3
**දත්ත විශ්ලේෂණය** 4
**සීමා** 4

**ලේඛන හා තොරතුරු සමාලෝචනය** 5
**හැඳින්වීම** 5
**ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය පිළිබඳ ඓතිහාසික දළ විශ්ලේෂණය** 5
**කාන්තාවන්ගේ ආර්ථික අසමානතාවය සහ මූල්‍යමය අනාරක්ෂිතභාවය** 7
**ව්‍යුහාත්මක හා සංස්කෘතික බාධක** 8
පීතෘමූලිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මත 8
සමාජ ගතානුගතිකත්වයේ කාර්යභාරය සහ කලාපීය විචලනය 9
අන්තර් ආංශිකතාව සහ දෙයාකාරයකින් වෙනස්කොට සැලකීම 9
**දේශපාලන පක්ෂවල ගතිකත්වය සහ අපේක්ෂකයින් තේරීම** 9
විනිවිදභාවයෙන් තොර අභ්‍යන්තර පාලනය සහ අවිධිමත් තේරීම 9
ස්ත්‍රී පුරුෂ සමාජභාවී සහ අන්තර්ආංශික බැහැර කිරීම 10
පක්ෂයේ දොරටු රැකීම සහ පුරුෂත්වකරණය වූ නායකත්වයේ සම්මත 10
උපායමාර්ගික සංඥාවාදය සහ දුර්වල කෝටා ක්‍රියාත්මක කිරීම 10
**නෛතික සහ ප්‍රතිපත්ති රාමුව වල සීමාවන්** 11
**කෝටා ප්‍රතිසංස්කරණ සහ සංකේතාත්මක නියෝජනය** 12
**සන්සන්දනාත්මක සාහිත්‍යය** 13

**සොයාගැනීම්** 14
**දේශපාලනය තුළ කාන්තාවන් මුහුණ දෙන අභියෝග** 14
ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංචලනය සහ සදාචාරය අවේක්ෂණය 14
කාන්තා දේශපාලන කර්තෘත්වයේ කලාපීය වෙනස්කම් 15
සංකේතාත්මකව සමස්තය ඇතුළත් කිරීම සහ අත්හැරුණු කණ්ඩායම් නියෝජනය 18
තර්ජන, හිරිහැර, සහ අසමාන අවදානම් 18
ආර්ථික අවාසිය සහ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය 18

**මැතිවරණ ව්‍යාපාර මූල්‍යයෙහි මූලාශ්‍ර** 20
පෞද්ගලික සම්පත් 20
අනුග්‍රාහක ජාල 21
දේශපාලන පක්ෂවල සහයෝගය 24

**මැතිවරණ තරගය තුළ මැතිවරණ ව්‍යාපාර මූල්‍යයෙහි කාර්යභාරය** 26
මැතිවරණ ව්‍යාපාර මූල්‍ය නියාමනය වැදගත් වන්නේ මන්ද? 27
**මැතිවරණ ව්‍යාපාර මූල්‍ය රෙගුලාසි වලට අනුකූල වීම** 29
වියදම් කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කම් 29
නෛතික සාක්ෂරතාවය සහ දැනුවත්භාවය 30
ආගන්තුක සත්කාර කිරීම් එදිරිව මැතිවරණ ව්‍යාපාර සඳහා වියදම් කිරීම් 31

**සාරාංශගත කරුණු** 33

**නිර්දේශ** 34
ඡන්දදායකයින් සමඟ සම්බන්ධ වීම 34
කාන්තා දේශපාලනඥයින් සමඟ සම්බන්ධ වීම 36
බලධාරීන් සමඟ සම්බන්ධ වීම 37
දේශපාලන පක්ෂ සමඟ සම්බන්ධ වීම 39

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** 41

# අධ්‍යයනයේ පසුබිම

කාන්තා දේශපාලන අයිතිවාසිකම් ප්‍රගමනය කිරීමේදී මුල් කාලීනව ගත් වැදගත් පියවර පිළිබඳව ශ්‍රී ලංකාව නිදසුනක් ලෙස ගනු ලබයි. 1931 දී සර්වජන ඡන්ද අයිතිය ලබාදුන් ආසියාවේ මුල්ම රටවලින් එකක් වන අතර, 1960 දී රට ලොව ප්‍රථම කාන්තා අගමැතිනිය තෝරා පත් කර ගනිමින් ගෝලීය ඉතිහාසයක් ඇති කළේය. මෙම සංකේතාත්මක ජයග්‍රහණ තිබියදීත්, දේශපාලන ක්‍රියාවලීන්හි කාන්තාවන්ගේ හරයාත්මක සහභාගිත්වය දශක ගණනාවක් තිස්සේ සීමිතව පවතී.

2016 දී පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය සඳහා 25% ක අනිවාර්ය කෝටාවක් හඳුන්වාදීමත් සමඟ සැලකිය යුතු ප්‍රතිපත්තිමය වෙනසක් සිදු විය. 2018 පළාත් පාලන මැතිවරණ අතරතුර ක්‍රියාවට නංවන ලද මෙම ප්‍රතිසංස්කරණය, ප්‍රාදේශීය දේශපාලනයට පිවිසෙන කාන්තාවන් සංඛ්‍යාව සැලකිය යුතු හා පෙර නොවූ විරූ අයුරින් වැඩි කිරීමට හේතු විය. සංඛ්‍යාත්මකව ගත් කල, මෙම කෝටාව කාන්තාවන් දහස් ගණනකට දේශපාලන කාර්යාලවල දොරටු විවෘත කිරීම සාර්ථක ලෙස සිදු කළ අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ප්‍රථම වරට මැතිවරණයකට ඉදිරිපත් වූ අය වූහ.

කෙසේ වෙතත්, ප්‍රාදේශීය මට්ටමින් වැඩි වූ නියෝජනය අර්ථවත් දේශපාලන සවිබල ගැන්වීමක් බවට පරිවර්තනය වී නොමැත. මතු වන සාක්ෂිවලින් පෙනී යන්නේ, විශේෂයෙන් ආන්තික ප්‍රජාවගෙන් පැමිණෙන කාන්තා දේශපාලනඥයින්, ඵලදායී ලෙස මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට, සහ තේරී පත් වූ පසු සැබෑ බලපෑමක් ඇති කිරීමට ඇති හැකියාවට බලපාන සැලකිය යුතු ව්‍යුහාත්මක සහ ප්‍රායෝගික බාධක වලට අඛණ්ඩව මුහුණ දෙන බවයි (මැතිවරණ පද්ධති සඳහා වන ජාත්‍යන්තර පදනම [IFES], 2022). මේවා අතර, මැතිවරණ මූල්‍ය සඳහා ප්‍රවේශය තීරණාත්මක, එහෙත් ගවේෂණය නොකළ, සාධකයක් ලෙස කැපී පෙනේ.

ප්‍රාදේශීය මට්ටමින් පවා, ප්‍රචාරක කටයුතු සඳහා වන මූල්‍ය අවශ්‍යතා පරාසයක් පවතී: අනෙකුත් කරුණු අතර, ද්‍රව්‍ය මුද්‍රණය කිරීම, රැස්වීම් සංවිධානය කිරීම, ප්‍රවාහනය සහ ආධාරක ජාල ඒකරාශී කිරීම යනාදිය පවතී. පුරුෂාධිපත්‍ය දරන පක්ෂ ව්‍යුහයන්, දේශපාලන මූල්‍යකරණ ප්‍රවාහ කෙරෙහි ඇති සීමිත ප්‍රවේශය, සහ කාන්තාවන්ගේ සංචලනය සහ මහජනයා සමඟ සම්බන්ධවීම කෙරෙහි ඇති සමාජ-සංස්කෘතික සීමාවන් යන සියල්ල කාන්තා දේශපාලනඥයන් මුහුණ දෙන මූල්‍ය අවාසි වලට දායක වේ. බොහෝ දෙනෙකුට, ප්‍රචාරණය සඳහා සම්පත් නොමැතිකම ඔවුන්ගේ මැතිවරණ තරගකාරීත්වය අඩපණ කරනවා පමණක් නොව, දේශපාලන ක්ෂේත්‍රයට පිවිසීමට මුළුමනින්ම බාධාවක් ලෙස ක්‍රියා කරයි.

මෙම අධ්‍යයනය 2023 දී සම්මත කරන ලද ප්‍රධාන ව්‍යවස්ථාදායක වර්ධනයක් වන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත කෙරෙහි ද අවධානය යොමු කළේය. මෙම නීතිය මඟින් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල වියදම් සඳහා අනිවාර්ය සීමා හඳුන්වා දුන් අතර, සියලුම අපේක්ෂකයින් තම ප්‍රචාරක වියදම් ප්‍රකාශ කර වාර්තා කළ යුතු ය. මෙම ප්‍රතිසංස්කරණය මැතිවරණ ක්‍රියාවලි තුළ සැමට සමාන අවස්ථා සහිත අවකාශයක් ප්‍රවර්ධනය කිරීම මෙන්ම, වැඩි විනිවිදභාවයක් සහ වගවීමක් ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගෙන ඇතත්, සම්පත් කෙරෙහි අසමාන ප්‍රවේශයක් ඇති අපේක්ෂකයින්, විශේෂයෙන්, ආන්තික ප්‍රජාවගේ කාන්තාවන් කෙරෙහි එහි බලපෑම, පැහැදිලි නැත.

මෙම සන්දර්භය තුළ, පළාත් පාලන මට්ටමින් තරග කරන ආන්තික ප්‍රජාවගෙන් එන කාන්තාවන් අත්විඳින මැතිවරණ ප්‍රචාරක කටයුතුවල මූල්‍යකරණ අභියෝග පරීක්ෂා කිරීමට මෙම අධ්‍යයනය උත්සාහ කරයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, මූල්‍ය සහ දේශපාලන සහභාගීත්වය අතර අන්තර්-ක්‍රියාකාරිත්වය ගවේෂණය කිරීමෙන්, ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන සහභාගීත්වය සඳහා වඩාත් සාධාරණ හා බලදායීකරන පරිසරයක් පෝෂ්‍ය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ප්‍රයත්නයන් දැනුවත් කළ හැකි අවබෝධයක් ජනනය කිරීම අධ්‍යයනයේ අරමුණයි. කෙසේවෙතත්, මෙම අධ්‍යයනය මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ මූල්‍ය දුර්වලතාවය, ජනවාර්ගිකත්වය හෝ සීමාවන්ට යටත් කරන සංස්කෘතික සම්මතයන් නිසා වරප්‍රසාද නොලත් ආන්තික කාන්තාවන් කෙරෙහි බව ද සඳහන් කිරීම වැදගත් ය. එබැවින්, අධ්‍යයනයේ සොයාගැනීම් දේශපාලන සංස්කෘතිය තුළ වඩා හොඳින් ස්ථානගත වී සිටින සහ කාලයත් සමඟ, වඩාත් සාර්ථක දේශපාලන ගමන් පථ සකස් කර ගැනීමට සමත් වූ කාන්තාවන් හට සම්පූර්ණයෙන්ම අදාළ නොවිය හැකිය.

# ඇගයීමේ ක්‍රම සහ සීමා

මෙම අධ්‍යයනය පශ්චාත්-ප්‍රත්‍යක්ෂවාදී පර්යේෂණ ප්‍රවේශයක් අනුගමනය කරයි. එය විෂයානුබද්ධ යථාර්ථයක පැවතීම පිළිගන්නා අතරම, සංකීර්ණ සමාජ සංසිද්ධි අවබෝධ කර ගැනීමේ දී පුද්ගලබද්ධ (ආත්මීය) අත්දැකීම්වල වටිනාකම ද හඳුනා ගනී. මෙම සුසමාදර්ශය විශේෂයෙන් දේශපාලන සහභාගිත්වයේ සහ මැතිවරණ ප්‍රචාරණ මූල්‍යකරණයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී මාන ගවේෂණය කිරීමට හොඳින් ගැළපේ. මෙහිදී තමා ජීවිතය තුළ ලත් අත්දැකීම් සහ සන්දර්භීය සාධක තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

පළාත් පාලන මට්ටමින් මැතිවරණ ප්‍රචාරණ මූල්‍ය කෙරෙහි ප්‍රවේශ වීමේ දී කාන්තා දේශපාලනඥයින් මුහුණ දෙන අභියෝග පිළිබඳ ගැඹුරු සහ සියුම් අවබෝධයක් ලබා ගැනීම සඳහා පර්යේෂණ සැලසුම ගුණාත්මක ක්‍රම ඒකාබද්ධ කරයි. අධ්‍යයනයට ප්‍රධාන අදියර තුනක් ඇතුළත් වේ:

# ලේඛන හා තොරතුරු පර්යේෂණය

ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන සහභාගීත්වය සහ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණයට අදාළ ශාස්ත්‍රීය සාහිත්‍යය, ප්‍රතිපත්ති ලේඛන සහ සිවිල් සමාජ වාර්තා පිළිබඳ පුළුල් සමාලෝචනයකින් මෙම අධ්‍යයනය ආරම්භ විය. මෙම අදියර සන්දර්භීය රාමුව ස්ථාපිත කිරීමේ දී සහ ආනුභවික අවදිය මෙහෙයවීම සඳහා ප්‍රධාන තේමා හඳුනාගැනීමේ දී තීරණාත්මක විය.




## ආනුභවික දත්ත එක්රැස් කිරීම

ප්‍රාථමික ගුණාත්මක දත්ත එක්රැස් කිරීමේ ක්‍රම දෙකක් භාවිත කරන ලදී:

වෙන් වෙන්ව කළ ගැඹුරු සම්මුඛ සාකච්ඡා (IDIs): කාන්තා සහ පිරිමි දේශපාලනඥයින් යන දෙපිරිසම සමඟ පවත්වන ලදී. මෙම සම්මුඛ සාකච්ඡා පෞද්ගලික ආඛ්‍යාන, මැතිවරණ ප්‍රචාරණයේදී ලත් අත්දැකීම්, අරමුදල් රැස්කිරීමේ උපායමාර්ග සහ මූල්‍ය ආධාර ලබා ගැනීමේදී වටහාගත් බාධක කෙරෙහි අවධානය යොමු කළේය.

ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා (KIIs): මේවා දේශපාලන විශ්ලේෂකයින්, සිවිල් සමාජ නියෝජිතයින් සහ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සංවිධානවල සාමාජිකයන් සමඟ පවත්වන ලදී. මෙම සම්මුඛ සාකච්ඡා මගින් දේශපාලනඥයින්ගෙන් රැස් කරන ලද පුද්ගල මට්ටමේ දත්තවලට අනුපූරකව, මැතිවරණ ප්‍රචාරක මූල්‍ය සඳහා කාන්තාවන්ට ප්‍රවේශවීමට බලපාන ව්‍යුහාත්මක සහ ආයතනික සාධක පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙන ලදී.

සම්මුඛ පරීක්ෂණ 36 ක් පවත්වන ලදී:

- කාන්තා පළාත් පාලන දේශපාලනඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා 24 ක්,
- පිරිමි පළාත් පාලන දේශපාලනඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා 7 ක් (සංසන්දනාත්මක මූලික පාදමක් ලෙස),
- කාන්තා ප්‍රධාන තොරතුරු සපයන්නන් සහ විශේෂඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා 6 ක්,
- පිරිමි ප්‍රධාන තොරතුරු සපයන්නන් සහ විශේෂඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා 3 ක්,

ජනවාර්ගිකත්වය, දේශපාලනික සන්දර්භය සහ සමාජ-ආර්ථික තත්ත්වයන් අනුව කලාපීය විවිධත්වය පිළිබිඹු කිරීම සඳහා තෝරා ගන්නා ලද, කොළඹ, මඩකලපුව, යාපනය, බදුල්ල සහ මොණරාගල යන ප්‍රදේශවල සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. මෙම මෙම දිස්ත්‍රික්ක විවිධ සුළුතර සහ බහුතර ප්‍රජාව හරහා සංසන්දනාත්මකව පරීක්ෂා කර බැලීම සඳහා ද ඉඩ සැලසීය.

## දත්ත විශ්ලේෂණය

සියලුම සම්මුඛ සාකච්ඡා තේමාත්මක විශ්ලේෂණය සහ ආඛ්‍යාන විශ්ලේෂණ ශිල්පීය ක්‍රමවල එකතුවක් භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. තේමාත්මක විශ්ලේෂණය මඟින් පුනරාවර්තනය වන රටා සහ බාධක හඳුනා ගැනීමට හැකි වූ අතර, ආඛ්‍යාන විශ්ලේෂණය මඟින් කාන්තාවන් විසින් මූල්‍යමය සීමා කිරීම් මඟහරවා ගැනීමේ දී ලත් තනි පුද්ගල අත්දැකීම් සහ ඒ සඳහා භාවිතා කරන ලද උපායමාර්ග සමඟ වඩාත් ගැඹුරින් සම්බන්ධ වීමට ඉඩ සැලසුණි.

## සීමා

මෙම අධ්‍යයනය පළාත් පාලන දේශපාලනය තුළ කාන්තාවන් මුහුණ දෙන මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණ අභියෝග පිළිබඳව වටිනා අවබෝධයක් ලබා දෙන අතර, සීමා කිහිපයක් පිළිගත යුතුය:

විෂය පථය සහ පරිමාණය: මෙම අධ්‍යයනය දිස්ත්‍රික්ක පහක් පුරා සම්මුඛ සාකච්ඡා 36 කට සීමා වේ. මෙය ගැඹුරු අධ්‍යයනයකට ඉඩ සලසන නමුත්, මුළු රට පුරා ඇති අත්දැකීම්වල සම්පූර්ණ විවිධත්වය ග්‍රහණය කර නොගනු ඇත. විශේෂයෙන් තෝරාගත් ස්ථානවල නියෝජනය නොවන සුවිශේෂී දේශපාලනික හෝ ජනවිකාසන ලක්ෂණ සහිත ප්‍රදේශවල එසේ විය හැක.

මාතෘකාවේ සංවේදී ස්වභාවය: මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය, විශේෂයෙන් අවිධිමත් මාර්ග, පක්ෂ ගතිකය සහ අභ්‍යන්තරව සිදුවන වෙනස් කොට සැලකීම් පිළිබඳව සාකච්ඡා කිරීම සංවේදී විය හැකිය. සමහර සහභාගිවන්නන් තොරතුරු සම්පූර්ණයෙන්ම හෙළිදරව් කිරීමට පසුබට විය හැකි අතර, එමඟින් දත්ත වල පරිපූර්ණත්වය සීමා විය හැකිය.

මෙම සීමා තිබියදීත්, ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය මට්ටම තුළ කාන්තාවන්ගේ දේශපාලනය හා සම්බන්ධවීම සීමා කරන මූල්‍ය බාධක පිළිබඳව මෙම අධ්‍යයනය වටිනා අවබෝධයක් ලබාදෙයි. විවිධ කලාප කෙරෙහි අවධානය යොමු කිරීමෙන් සහ අපේක්ෂකයින්ගේ සහ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ දෘෂ්ටිකෝණයන් ඇතුළත් කිරීමෙන්, ආන්තික ප්‍රජාවන්හි කාන්තාවන් සඳහා මැතිවරණ ව්‍යාපාර මූල්‍යයෙහි භූ දර්ශනය පිළිබඳ පදනම් සහිත, සහ සන්දර්භය කෙරෙහි සංවේදී අවබෝධයක් මෙම පර්යේෂණය මඟින් ලබා දෙයි.

# ලේඛන හා තොරතුරු සමාලෝචනය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කාන්තාවෝ, විශේෂයෙන් ජනවාර්ගික හා ආගමික සුළුතර ප්‍රජාවන්ගෙන් පැමිණෙන කාන්තාවෝ, මැතිවරණ දේශපාලනයට පිවිසීමට උත්සාහ දැරීමේ දී සංකීර්ණ ව්‍යුහාත්මක හා පද්ධතිමය බාධක සමූහයකට මුහුණ දෙති. වඩාත්ම බලගතු, එහෙත්, අඩුවෙන් අධ්‍යයනය කර ඇති අභියෝග අතර, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය හා සම්බන්ධ අභියෝග වේ. ආර්ථික අසමානතාවය, පක්ෂ අරමුදල් කෙරෙහි ඇති සීමිත ප්‍රවේශය, විනිවිදභාවයෙන් තොර නාමයෝජනා ක්‍රියාවලි සහ ව්‍යුහාත්මකව බැහැර කිරීමේ වඩාත් පුළුල් රටා සුළුතර කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය සැලකිය යුතු ලෙස සීමා කරයි. ස්ථාපිත බල ව්‍යුහයන්ගෙන් පිටත සිටින අය බැහැර කිරීමට නැඹුරු වන සේවාදායකවාදය, පීතෘමූලික සම්මතයන් සහ පක්ෂපාතිත්වය පදනම් කරගත් ජාල මඟින් විදහා දක්වන, ශ්‍රී ලංකාවේ ගැඹුරින් ගැබ්ව ඇති දේශපාලන සංස්කෘතිය මඟින් මෙම අභියෝග තවදුරටත් ශක්තිමත් කරයි.

කොඩිකාර (2011) ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ දේශපාලනයේ "පරස්පර විරෝධතාවක්" ඉතා අනර්ඝව විස්තර කළේය: කාන්තා අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සාක්ෂරතාවයේ සැලකිය යුතු ජයග්‍රහණ තිබියදීත්, දේශපාලන නියෝජනය දකුණු ආසියාවේ රටවල් අතර අවම මට්ටමක පවතී. මෙම පරස්පරතාව පිළිබිඹු කරන්නේ විධිමත් ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල, විශේෂයෙන් කාන්තාවන් සඳහා, සමස්තය ඇතුළත් කරන සහභාගීත්වයක් ලබා ගැනීම සඳහා ඇති සීමිත බලපෑමයි. (වික්‍රමසිංහ සහ කොඩිකාර, 2012; IFES, 2022). 2022 වන විට, කාන්තාවන් පාර්ලිමේන්තුවේ ආසන වලින් 5.3% ක් පමණක් දැරූ අතර, පළාත් පාලන තනතුරු වලින් 2% කටත් වඩා අඩු ප්‍රමාණයක් හිමි කර ගෙන, ශ්‍රී ලංකාව ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතා දර්ශකවල නේපාලය සහ බංග්ලාදේශය වැනි කලාපීය සාමානයන්ට වඩා පසුපසින් ස්ථානගත විය (IFES, 2022). කෙසේ වෙතත්, 2024 පාර්ලිමේන්තු මැතිවරණය සුළු වෙනසක් පෙන්නුම් කළේය. ජාතික ජනතා බලවේගය (NPP) සන්ධානය ඓතිහාසික ආසන 159 ක බහුතරයක් ලබා ගත් අතර, එය මෙතෙක් වාර්තා වූ ඉහළම කාන්තා මන්ත්‍රීවරුන් සංඛ්‍යාව සමඟින්, ඍජුවම තේරී පත් වූ කාන්තාවන් 21 දෙනෙකු සහ ජාතික ලැයිස්තුව හරහා පත් කරන ලද තවත් කාන්තාවන් කිහිපදෙනෙකු සමඟින්, සමස්ත කාන්තා නියෝජනය 9.8% දක්වා ඉහළ නැංවීය (මැතිවරණ දෙපාර්තමේන්තුව, 2024).

මෙම ලේඛන හා තොරතුරු සමාලෝචනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආර්ථික ආන්තීකරණය, දේශපාලන පක්ෂවල භාවිතාවන්, සහ දේශපාලන සංස්කෘතිය යන කරුණු, ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යයෙහි භූ දර්ශනය සහ සුළුතර කාන්තාවන්ගේ මැතිවරණ අපේක්ෂාවන් හැඩගස්වන ආකාරය විවේචනාත්මකව විමසා බලයි.

## ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය පිළිබඳ ඓතිහාසික දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණ භාවිතයන්ගේ මූලයන් බ්‍රිතාන්‍ය පාලනය යටතේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රථම වරට හඳුන්වා දුන් යටත් විජිත සමය දක්වා දිව යයි. 1947 කවුන්සිලයේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) නියෝගය (Ceylon Order) සමඟ මැතිවරණ මූල්‍ය පිළිබඳ විධිමත් රෙගුලාසි ස්ථාපිත කරන ලද අතර, එය නිදහසින් පසු යුගයේ පාර්ලිමේන්තු මැතිවරණ සඳහා අඩිතාලම දැමීය. මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් අවදිවලදී, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය ඉතා සුළු කටයුත්තක් විය. දේශපාලන පක්ෂ යම් සැලසුම් සංවිධාන සහයෝගයක් ලබා දුන්නද, බොහෝ අපේක්ෂකයෝ තම ව්‍යාපාර වලට අරමුදල් සැපයීම සඳහා ප්‍රධාන වශයෙන් පුද්ගලික සම්පත් මත විශ්වාසය තැබූහ.

වුඩ්වර්ඩ් (1969) ගේ මූලික කෘතිය, ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණයේ මුල්කාලීන ගතිකත්වය පිළිබඳ වටිනා අවබෝධයක් ලබාදෙන අතර, රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භක කාල පරිච්ඡේදය තුළ දේශපාලන අරමුදල්වල අතිශයින් පුද්ගලාරෝපිත හා බණ්ඩනය වූ ස්වභාවය ඉස්මතු කරයි. එකල, ප්‍රධාන දේශපාලන පක්ෂ, එනම් එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) යන පක්ෂ දෙකම, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය සඳහා සංවිධානාත්මක, ආයතනික මූලාශ්‍රවලට වඩා පුද්ගල ධනය මත දැඩි ලෙස විශ්වාසය තැබීය. එක්සත් ජාතික පක්ෂයට, සංසන්දනාත්මකව වඩා

හොඳ සම්පත් තිබුණද, මූල්‍ය සහයෝගය කිසිසේත් ඒකාකාරී නොවීය. කොළඹ දිස්ත්‍රික්ක සහ බස්නාහිර පළාතේ තවත් ප්‍රදේශ කිහිපයක් හැර, එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයින්ට තමන්ගේම සංවිධානය මත විශ්වාසය තැබීමට සිදු වූ බව වුඩ්වර්ඩ් සඳහන් කරයි (1969). මෙයින් ඇඟවෙන්නේ, අපේක්ෂකයෙකු හට ඵලදායී ලෙස ප්‍රචාරක කටයුතු කිරීමේ හැකියාව නිර්ණය කරන පුද්ගලික මූල්‍ය ශක්තිය සහ දේශීය ජාල, විමධ්‍යගත සහ අසමාන පද්ධතියක් තුළ පැවති බවයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මූල්‍යමය සහයෝගය සඳහා ක්‍රියාත්මක වූයේ ඊටත් වඩා අඩු ආයතනික යාන්ත්‍රණ සමගිනි. එහි මුල් වසරවල මැතිවරණ ව්‍යාපාර අරමුදල් බොහෝ දුරට එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ පෞද්ගලික ධනයෙන් ආවරණය විය.

කේන්ද්‍රීය වශයෙන් පක්ෂ සම්බන්ධීකරණය අවම මට්ටමක පැවති අතර, වුඩ්වර්ඩ් පවසන පරිදි මධ්‍යම කාර්යාලයට අපේක්ෂකයින්ට ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටපත් ලබාදීමට වඩා වැඩි යමක් කළ නොහැකි විය (1969). මෙසේ පුද්ගලික සම්පත් මත යැපීම සහ මධ්‍යගත මූල්‍ය යටිතල පහසුකම් නොමැති වීම, මුල් කාලීන මැතිවරණ ව්‍යාපාර මූල්‍ය භාවිතාවන්, පද්ධතිමය පක්ෂ සහයෝගයට වඩා ප්‍රභූ ධනය සහ අවිධිමත් සැකසුම් මඟින් හැඩගැසුණු ආකාරය අවධාරණය කරයි.

කාලයත් සමඟ, දේශපාලන ක්‍රමය පරිණත වී, මැතිවරණ තරඟය තීව්‍ර වූ විට, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය වඩාත් විමධ්‍යගත හා තරඟකාරී ව්‍යවසායයක් බවට පරිණාමය විය. දේශපාලන පක්ෂ සහ තනි අපේක්ෂකයින් යන කණ්ඩායම් දෙකම ස්වාධීනව අරමුදල් ඒකරාශී කිරීමට පටන් ගත්තේය. මෙය බොහෝ විට අවිධිමත් සහ විනිවිදභාවයෙන් තොර මාර්ග හරහා සිදු විය (වැලිකල, 2015). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා සමානුපාතික නියෝජනය (PR) සහ මනාප ඡන්ද ක්‍රම හඳුන්වාදීම සැලකිය යුතු වෙනසක් ඇති කළේය. මැතිවරණ වඩාත් තරඟකාරී වූවා පමණක් නොව, මැතිවරණ ව්‍යාපාර කටයුතුවල අවධානය ද වෙනස් විය. අපේක්ෂකයෝ තවදුරටත් තරග කළේ ප්‍රතිවාදී පක්ෂවලට එරෙහිව පමණක් නොව, මනාප ඡන්ද සඳහා එකම පක්ෂය තුළ සිටින සෙසු අපේක්ෂකයින් සමඟ ද තරග කළහ (පීරිස්, 2023).

මෙම පක්ෂ තුළ ඇති වූ අභ්‍යන්තර තරඟය ප්‍රචාරක වියදම් සැලකිය යුතු ලෙස වැඩි කළේය. ආකර්ශනීය සහ දෘශ්‍යමාන ව්‍යාපාර අත්‍යවශ්‍ය වූයේ පක්ෂය ප්‍රවර්ධනය කිරීමට පමණක් නොව, පුද්ගලික ඡන්ද පදනම ඉහල නැංවීමට ද අවශ්‍ය විය. පක්ෂයේ කාර්යසාධනය ශක්තිමත් කරන අතරම, තම පුද්ගලික මනාප ඡන්ද උපරිම කිරීමේ මෙම ද්විත්ව දිරිගැන්වීමේ ව්‍යුහය, මැතිවරණ ව්‍යාපාර සඳහා පුද්ගලික මූල්‍ය ආයෝජන සඳහා ඇති අවශ්‍යතාවය තීව්‍ර කළේය. පීරිස් (2023) නිරීක්ෂණය කළ පරිදි, සමානුපාතික නියෝජනය යටතේ දේශපාලනය තරඟකාරී ලෙස පුද්ගලීකරණය කිරීමෙන්, මැතිවරණ ඉහළ මට්ටමේ අභිප්‍රායයන්, ඉහළ වියදම් සහිත තරඟ, බවට පරිවර්තනය කළ අතර, එය දේශපාලන ක්‍රියාවලිය මුදලට අගයක් දෙන දෙයක් බවට පත් කළේය.

1977 දී හඳුන්වා දුන් ආර්ථික ලිබරල්කරණ ප්‍රතිසංස්කරණ, මැතිවරණ මූල්‍යකරණයෙහි භූ දර්ශනය තවදුරටත් සංකීර්ණ කළේය. ආර්ථිකය විවෘත කිරීමත් සමඟ, බොහෝ විට ආයතනික අනුග්‍රාහකත්වයන්, අනුග්‍රාහක ජාල සහ නිල නොවන පරිත්‍යාග හරහා පෞද්ගලික ප්‍රාග්ධනය විශාල ප්‍රමාණයක් දේශපාලන ක්ෂේත්‍රයට ඇතුළු විය (වෙනුගෝපාල්, 2011). මෙම වර්ධනයන් මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය වඩාත් තරඟකාරී කිරීම පමණක් නොව, දූෂණයට සහ සේවාදායකවාදයට ද වැඩි වැඩියෙන් ගොදුරු විය. විනිවිද පෙනෙන නියාමන රාමුවක් නොමැතිකම ගණන් හිලවු නොමැති අරමුදල් භාවිතය තවදුරටත් පහසු කළ අතර, එමඟින් ධනවත් අපේක්ෂකයින් සහ මූල්‍ය සම්පත් සඳහා සීමිත ප්‍රවේශයක් ඇති අය අතර සැලකිය යුතු විෂමතා ඇති විය (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා, 2015).

මෙම පරිණාමය දේශපාලන නියෝජනය කෙරෙහි අසීමිත ප්‍රතිවිපාක ඇති කර තිබේ. මැතිවරණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වෙනුවෙන් ඉහළ යන පිරිවැය, පක්ෂ නාමයෝජනා ලබා ගැනීම සහ මැතිවරණ සාර්ථකත්වය සඳහා, මූල්‍ය ප්‍රාග්ධනය ඇත්ත වශයෙන්ම පූර්ව අවශ්‍යතාවයක් බවට පත් කර ඇත. ධනය සහ අනුග්‍රාහක ජාල වෙත ප්‍රවේශය ඇති අපේක්ෂකයින්ට පක්ෂ ප්‍රභූන් වැඩි මනාපයක් දක්වන අතර, නවකයින්ට, විශේෂයෙන් කාන්තාවන්ට සහ සුළුතර අපේක්ෂකයින්ට දේශපාලන ක්ෂේත්‍රයට ඇතුළුවීම අතිශයින් දුෂ්කර කරයි (වික්‍රමසිංහ සහ කොඩිකාර, 2012). වික්‍රමසිංහ සහ කොඩිකාර (2012) සඳහන් කළ පරිදි, මැතිවරණ දිස්ත්‍රික්ක සමානුපාතික නියෝජනය යටතේ විශාල

පරිපාලන ඒකක බවට ව්‍යුහාත්මකව විපරිවර්තනය කිරීම මඟින් ඡන්ද කැන්වසින් කිරීම වඩාත් තීව්‍ර ලෙස සම්පත් අවශ්‍ය කරන්නක් බවට පත් කර ඇති අතර, එය සියලුම අපේක්ෂකයින්ට අභියෝගයක් වන නමුත්, සාමාන්‍යයෙන් වඩා අඩු ආර්ථික ප්‍රාග්ධන මට්ටම් සහ වඩා අඩු ආයතනික සම්බන්ධතා ඇති කාන්තාවන්ට විශේෂයෙන් දැරිය නොහැකි බරක් වේ.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, අද ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණ පද්ධතිය ආයතනික පරිණාමය, දේශපාලනික තරඟකාරිත්වය සහ ආර්ථික විපරිවර්තනය පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් පිළිබිඹු කරයි. සාපේක්ෂව මධ්‍යස්ථ, පුද්ගලීකරණය වූ මැතිවරණ ක්‍රමයක් ලෙස ආරම්භ වූ දෙය, ධනවත් දේශපාලන ප්‍රභූන් විසින් ආධිපත්‍යය දරන, ඉහළ පිරිවැය සහිත, ඉහළ අභිප්‍රායයන් සහිත තරඟයක් දක්වා වර්ධනය වී ඇත. මෙම වෙනසෙහි ප්‍රතිවිපාක විශේෂයෙන් කැපී පෙනෙන්නේ, පක්ෂ ව්‍යුහයන්ගෙන් සහ මූල්‍ය ආධාර යාන්ත්‍රණයන්ගෙන් ක්‍රමානුකූලව බැහැර කර ඇති ආන්තික ප්‍රජාවගේ කාන්තාවන් සඳහා ය.

## කාන්තාවන්ගේ ආර්ථික අසමානතාවය සහ මූල්‍යමය අනාරක්ෂිතභාවය

ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන සහභාගිත්වය කෙරෙහි ඇති ප්‍රධාන හා අඛණ්ඩව පවතින බාධකයක් වන්නේ මූල්‍ය සම්පත් සඳහා ඔවුන්ට ඇති සීමිත ප්‍රවේශයයි. එය මැතිවරණවලට තරග කිරීමට සහ දේශපාලන හා සම්බන්ධවීම පවත්වා ගෙන යාමට ඔවුන්ට ඇති හැකියාව සැලකිය යුතු ලෙස සීමා කරයි. බොහෝ විද්වතුන් නිරීක්ෂණය කර ඇති පරිදි, ආර්ථික ප්‍රාග්ධනය මැතිවරණ දේශපාලනයේ සැපයුම් අවශ්‍යතාවයක් පමණක් නොව, ධනය සහ අනුග්‍රහය වැඩි වැඩියෙන් විපාක ලබා දෙන දේශපාලන භූ දර්ශනයක දෘශ්‍යතාව, නීත්‍යානුකූලභාවය සහ සාර්ථකත්වය සඳහා බොහෝ විට පූර්ව අවශ්‍යතාවයකි (වික්‍රමසිංහ සහ කොඩිකාර, 2012; වැලිකල, 2015).

ආර්ථික සහභාගිත්වය අතින් ශ්‍රී ලංකාවේ කාන්තාවෝ තවමත් අසමානුපාතිකව අවාසි සහගත තත්ත්වයක පසු වෙති. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට (2022) අනුව, පිරිමින්ගෙන් 70.5% ක් වන ශ්‍රම බලකායට සංසන්දනාත්මකව කාන්තාවන්ගේ සහභාගිත්වය පවතින්නේ 32.1% ක් පමණි. එපමණක් නොව, කාන්තාවන් සඳහා විරැකියා අනුපාතය 5% ක් පමණ වන අතර, එය පිරිමින්ට මෙන් දෙගුණයකට ආසන්නය (ජනලේඛන හා සංඛ්‍යාලේඛන, 2022). රැකියාවල නියුතු අය අතර පවා, කාන්තාවන් බොහෝ විට ඇඟලුම් නිෂ්පාදනය, ගෘහ සේවය සහ වතු ශ්‍රමය වැනි අඩු වැටුප් සහිත, අවිධිමත් හෝ අස්ථිර අංශ වල සංකේන්ද්‍රණය වී ඇති අතර, එමඟින් ආදායම් එක්රැස් වීම, ඉතිරිකිරීම් හෝ මූල්‍ය ස්වාධීනත්වය සඳහා අවස්ථාවක් ලබා නොදේ (ගුණතිලක, 2013; ජයවර්ධන, 1986).

දේපළ හිමිකාරිත්වය සහ උරුමය වටා ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන් මඟින් මෙම ආර්ථික අවදානම්භාවය තවත් උග්‍ර කරයි. ණය ලබා ගැනීම, මැතිවරණ පරිත්‍යාග අත්කර ගැනීම හෝ දේශපාලන පක්ෂ විසින් වගකීම් සහිත අපේක්ෂකයින් ලෙස සැලකීම සඳහා බොහෝ විට පූර්ව අවශ්‍යතා වන ඉඩම් හෝ ඉහළ වටිනාකමක් ඇති වත්කම් කෙරෙහි හිමිකම් කීමට කාන්තාවන්ට ඇති ඉඩකඩ අඩු ය (ද මෙල්, පීරිස්, සහ ගෝමස්, 2013). ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල යෙදීමට හෝ දේශපාලන ව්‍යාපාර තුළ කාලය සහ සම්පත් ආයෝජනය කිරීමට ඇති හැකියාව තවදුරටත් සීමා කරමින්, බොහෝ කාන්තාවෝ වැටුප් නොගෙවන රැකවරණ කටයුතු වල බර ද දරති (කෝට්ටේගොඩ, 2023).

මෙම ආර්ථික අසමානතාවයන්, විශේෂයෙන් දෙමළ, මුස්ලිම් සහ වතු දෙමළ ප්‍රජාවන්හි ආන්තික ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම්වල කාන්තාවන් අතර වඩාත් උග්‍ර වේ. ව්‍යුහාත්මක වෙනස්කොට සැලකීම, ඓතිහාසික ආන්තිකකරණය සහ භූගෝලීයව හුදකලාවීම, රාජ්‍ය හා පෞද්ගලික අංශ යන දෙකෙහිම රැකියා, මූල්‍ය සේවා සහ අධ්‍යාපනය වෙත ඔවුන්ගේ ප්‍රවේශය සීමා කර ඇත. උදාහරණයක් ලෙස, වතු අංශයේ කාන්තාවෝ රටේ අඩුම වැටුප් ලබන සේවකයින් අතර වන අතර, ඔවුන්ගේ සංචලනය සහ ප්‍රජා ජීවිතයේ සහභාගීත්වය දැඩි ලෙස සීමා කරන භාෂාමය, අවකාශීය සහ සමාජීය බාධක වලට මුහුණ දෙති (ජයවර්ධන, 2017). ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජනවාර්ගිකත්වය, සහ පන්තිය පිළිබඳව ඇති මෙම අන්තර්ඡේදනය ඉලක්කගත ව්‍යුහාත්මක මැදිහත්වීම් නොමැතිව ජය ගැනීමට අපහසු මූල්‍යමය වශයෙන් බැහැර කිරීමේ බහුවිධ ස්ථර නිර්මාණය කරයි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, විශේෂයෙන් ආන්තික ජනවාර්ගික සහ කම්කරු පන්ති පසුබිම්වලින් එන කාන්තාවන්, ප්‍රවර්ධන ද්‍රව්‍ය මුද්‍රණය කිරීම, රැස්වීම් සංවිධානය කිරීම, ප්‍රචාරක කාර්යමණ්ඩලය බඳවා ගැනීම සහ විශාල ඡන්ද කොට්ඨාශ හරහා ගමන් කිරීම ඇතුළු මැතිවරණ දේශපාලනයට සම්බන්ධ ඉහළ වියදම් පියවා ගැනීමට අරගල කරති (වික්‍රමසිංහ සහ කොඩිකාර, 2012). බොහෝ දුරට පුරුෂාධිපත්‍යය දරන පක්ෂ අරමුදල්, ව්‍යාපාර ප්‍රදායක ජාල සහ අවිධිමත් අනුග්‍රාහක මාර්ග කෙරෙහි ඇති සීමිත ප්‍රවේශය මඟින් මෙම මූල්‍ය බාධක තවත් උග්‍ර වේ. එබැවින් දේශපාලන ක්‍රමයෙහි පෞද්ගලිකව ලබා ගත් ප්‍රචාරක මූල්‍ය මත වැඩිවෙමින් පවතින යැපීම, පවතින අසමානතාවයන් ගැඹුරු කරයි, කාන්තාවන්ට අසමානුපාතික ලෙස අවාසිදායක වෙයි. මන්දයත්, පුද්ගලික සහ පක්ෂ සම්පත් සඳහා වන ඔවුන්ගේ ප්‍රවේශය අඛණ්ඩ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවයන් මඟින් සීමා කර ඇති බැවිනි (අතුකෝරල, 2021; එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල [UNFPA], 2025).

සාරාංශයක් ලෙස, ශ්‍රම බලකායේ අඩු සහභාගීත්වය, ආදායමේ අසමානතාවය, වත්කම් වලට ඇති සීමිත හිමිකාරිත්වය සහ දේශපාලන මූල්‍ය ජාලවලින් බැහැර කිරීම යන කරුණු අන්තර්ඡේදනය වීම, දේශපාලන වෘත්තීන්ට ඇතුළු වීමට සහ කල් පවත්වා ගැනීමට කාන්තාවන්ට ඇති හැකියාව දැඩි ලෙස සීමා කරයි. මෙම ආර්ථික බාධක ආමන්ත්‍රණය නොකළහොත්, මූල්‍ය අනාරක්ෂිතභාවය දොරටු පාලකයෙකු ලෙස දිගටම කටයුතු කරමින්, විශේෂයෙන් ආන්තික ප්‍රජාවන්ගෙන් පැමිණෙන කාන්තාවන් මැතිවරණ දේශපාලනය තුළ අර්ථවත් ලෙස සහභාගී වීම වළක්වයි.

## ව්‍යුහාත්මක හා සංස්කෘතික බාධක

ආර්ථික අසමානතාවයෙන් ඔබ්බට, පුරුෂාධිපත්‍යය, සමාජ ගතානුගතිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී බල සම්බන්ධතා තුළ මුල් බැසගත් ව්‍යුහාත්මක සහ සංස්කෘතික බාධක, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය සහ දේශපාලන සහභාගීත්වය කෙරෙහි කාන්තාවන්ට ඇති ප්‍රවේශයට සැලකිය යුතු ලෙස බාධා කරයි. මෙම සීමා ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය සහ සමාජීය සම්මත තුළ ගැඹුරින් ගැබ්ව ඇති අතර, එමඟින් දේශපාලනය පුරුෂ වසමක් වන බවට පවතින අවබෝධය සාමූහිකව ශක්තිමත් කර, විධිමත් ආයතන සහ බලයෙහි අවිධිමත් ජාල යන දෙකෙන්ම කාන්තාවන් කොන් කිරීමට ලක් කරයි.

### පීතෘමූලිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මත

ශ්‍රී ලංකාවේ පීතෘමූලික ව්‍යුහයන්ගේ කල් පවතින බලපෑම දේශපාලන මූල්‍යයෙන් කාන්තාවන් බැහැර කිරීම හැඩගැස්වීමේ දී කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරයි. (වික්‍රමසිංහ සහ කොඩිකාර, 2012). ස්ත්‍රීවාදී ආයතනිකවාදයෙන් උකහා ගනිමින්, කෘක් සහ මැකේ (2011) වැනි විද්වතුන් තර්ක කරන්නේ පුරුෂාධිපත්‍යය දරන දේශපාලන ජාල, අනුග්‍රාහක පද්ධති සහ නායකත්වය පිළිබඳව ඇති සංස්කෘතික අපේක්ෂාවන් වැනි අවිධිමත් ආයතන, කාන්තාවන්ගේ දේශපාලන කර්තෘත්වය සීමා කිරීම සඳහා විධිමත් නීති ඔස්සේ ක්‍රියාත්මක වන බවයි. මෙම අවිධිමත් සම්මතයන් "විශ්වාසනීය" අපේක්ෂකයෙකු ලෙස සැලකෙන්නේ කවුරුන්ද යන්න අණ කරයි. මෙහිදී බොහෝවිට සිදුවන්නේ, මූල්‍යමය ප්‍රාග්ධනය, ප්‍රභූ ජාල සහ දේශපාලනික පවුල් උරුමයන් වෙත ප්‍රවේශය ඇති පිරිමින්ට වරප්‍රසාද ලබා දීමයි.

ශ්‍රී ලාංකික සන්දර්භය තුළ, පීතෘමූලික සම්මත දේශපාලන පක්ෂ තුළ ආයතනිකකරණය වී ඇතිවා පමණක් නොව, ඒවා ප්‍රජා සහ පවුල් ව්‍යුහයන් හරහා ද ක්‍රියාත්මක වේ (ද මෙල්, පීරිස්, සහ ගෝමස්, 2013). විශේෂයෙන් ගතානුගතික කලාප තුළ, කාන්තාවන් බොහෝ විට පොදු ජීවිතය තුළ නිරත වීමෙන් අධෛර්යමත් කරනු ලබයි. උතුරු සහ නැගෙනහිර පළාත්වල, දශක ගණනාවක ගැටුම්, හමුදාකරණය සහ සංස්කෘතික ගතානුගතිකත්වය මගින් කාන්තාවන්ගේ සංචලනය, මහජන දෘශ්‍යතාව සහ මැතිවරණ ප්‍රචාරණ කටයුතු ආශ්‍රිත සම්පත් වෙත ප්‍රවේශය තවදුරටත් සීමා කර ඇත (බණ්ඩාරගේ, 2010).

### සමාජ ගතානුගතිකත්වයේ කාර්යභාරය සහ කලාපීය විචලනය

සමාජ ගතානුගතිකත්වය, විශේෂයෙන් ග්‍රාමීය සහ පශ්චාත්-යුධ ප්‍රජාව තුළ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මත ශක්තිමත් කිරීමේ දී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි (ද අල්විස්, 1995). එවැනි සැකසුම් තුළ, මහජන නායකත්ව භූමිකාවන් බොහෝ විට කාන්තාවන්ට, විශේෂයෙන් පවුල් හෝ දේශපාලන පෙළපතක් නොමැති අයට, නුසුදුසු ලෙස සැලකේ. මෙම සංස්කෘතික අපේක්ෂා කාන්තාවන්ට නිදහසේ මැතිවරණ ව්‍යාපාර කිරීමට, ප්‍රසිද්ධියේ කතා කිරීමට හෝ බොහෝ විට පුරුෂාධිපත්‍යය දරන ප්‍රජා ජාලවලින් අරමුදල් ලබා ගැනීමට ඇති හැකියාව සීමා කරයි. ගෙට්ස් (2003) තර්ක කරන පරිදි, ගෞරවනීයභාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සදාචාරය පිළිබඳ සංස්කෘතික මතවාදයන් මගින්, සමාජීයව ගොඩනගන ලද හැසිරීම පිළිබඳව වන ප්‍රමිතීන්ට සහ සදාචාරය පිළිබඳ පරීක්ෂාවට කාන්තාවන් ලක් කිරීමෙන්, ඔවුන්ගේ දේශපාලන කර්තෘත්වය සීමා කරයි, එය ඡන්දදායකයින්ගේ සංජානන සහ මූල්‍යමය පිටුබලය යන දෙකටම බලපෑම් කළ හැකි ය.

එපමණක් නොව, උතුරු සහ නැගෙනහිර වැනි කලාපවල පශ්චාත්-යුධ දේශපාලනික පරිසරය කාන්තාවන්ට නිශ්චිත අභියෝග නිර්මාණය කර ඇත. මෙම ප්‍රදේශ වල කාන්තාවෝ බොහෝ විට පිරිමි ඥාතීන්ගේ මරණ හෝ අතුරුදහන්වීම් හේතුවෙන් අවශ්‍යතාවයෙන් නායකත්ව භූමිකාවන් භාර ගනිති. නමුත් පසුව ඔවුන් අපකීර්තියට පත්ව හෝ හරයාත්මක දේශපාලන ක්‍රියාකාරීන් ලෙස සැලකීම වෙනුවට සංකේතාත්මක ලෙස සලකනු ලබයි (ශ්‍රීදරන්, 2024).

### අන්තර්ආංශිකතාව සහ 'දෙයාකාරයකින් වෙනස්කොට සැලකීම

සුළුතර කාන්තාවන්ගේ අත්දැකීම්, ව්‍යුහාත්මක බාධක තේරුම් ගැනීම සඳහා අන්තර්ඡේදනය වන ප්‍රවේශයක වැදගත්කම විදහා දක්වයි. කිම්බර්ලේ ක්‍රෙන්ෂෝ (1989) විසින් හඳුන්වා දෙන ලද අන්තර්ආංශිකතාව පිළිබඳ සංකල්පය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජනවාර්ගිකත්වය, ආගම සහ පන්තිය, වැනි අතිච්ඡේදනය වන අනන්‍යතා ආන්තිකකරණය සංකීර්ණ කරන ආකාරය අවධාරණය කරයි. ශ්‍රී ලංකාවේ, දෙමළ, මුස්ලිම් සහ වතු දෙමළ කාන්තාවෝ “දෙයාකාරයකින් වෙනස්කොට සැලකීම” ලෙස හැඳින්විය හැකි දෙයකට මුහුණ දෙති: එනම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ජනවාර්ගික-ආගමික අනන්‍යතාවය යන දෙකම මත පදනම් වූ බැහැර කිරීම ය. සීමිත අධ්‍යාපන අවස්ථා, අඩු රැකියා අනුපාතයන්, සීමිත සංචලනය, සහ දේශපාලන තීරණ ගැනීමේ අවකාශයන්ගෙන් බැහැර කිරීම තුළින් මෙම අන්තර්ජේදනය වන ආන්තිකකරණ ආකාරයන් ප්‍රකාශ වේ (වික්‍රමසිංහ සහ කොඩිකාර, 2012).

## දේශපාලන පක්ෂවල ගතිකත්වය සහ අපේක්ෂකයින් තේරීම

### විනිවිදභාවයෙන් තොර අභ්‍යන්තර පාලනය සහ අවිධිමත් තේරීම්

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ මැතිවරණ දේශපාලනයට ප්‍රවේශය හැඩගැස්වීමේ දී කේන්ද්‍රීය, එහෙත් බොහෝ විට විනිවිදභාවයෙන් තොර සහ බැහැර කිරීමේ කාර්යභාරයක් ඉටු කරයි. රට විධිමත් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී සම්මතවලට අනුගත වුවද, අභ්‍යන්තර පක්ෂ පාලනය බොහෝ දුරට විනිවිදභාවයෙන් තොරව සහ නියාමනයකින් තොරව පවතී. අපේක්ෂකයින් තේරීම සාමාන්‍යයෙන් මෙහෙයවනු ලබන්නේ ක්‍රමානුකූලව නීතිරීති සකස් කරන ලද සංග්‍රහයක් හෝ ප්‍රමිතිගත ක්‍රියාපටිපාටි මත නොව, ඒ වෙනුවට පක්ෂ නායකයින්ගේ සහ විධායක කමිටුවල අභිමතය මත රඳා පවතී (ලියනගේ, 2108). බොහෝ ප්‍රධාන පක්ෂවලට අභ්‍යන්තර ඡන්දය ප්‍රකාශ කිරීමේ යාන්ත්‍රණ හෝ විධිමත් තේරීම් ව්‍යුහයන් නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස, නාමයෝජනා ලබා ගැනීම සඳහා අපේක්ෂකයින් පක්ෂ ප්‍රභූන් සමඟ පුද්ගලික සබඳතා වර්ධනය කිරීම හෝ අරමුදල් රැස් කිරීමේ ධාරිතාව සහ මහජන දෘශ්‍යතාව ප්‍රදර්ශනය කිරීම වැනි අවිධිමත් මාර්ග හරහා යා යුතු ය. මෙම අවිධිමත් ක්‍රියාවලීන් පක්ෂ නායකත්වයට සැලකිය යුතු පාලනයක් ක්‍රියාවේ යෙදවීමට ඉඩ සලසයි. මෙය බොහෝ විට ව්‍යංග නමුත් පුළුල් ලෙස අවබෝධ කරගෙන ඇති නිර්ණායක මත පදනම් වේ. සිරිවර්ධන (2022) ට අනුව, අපේක්ෂකයින් ප්‍රධාන වශයෙන් ඇගයීමට ලක් කරනු ලබන්නේ, පක්ෂ නායකත්වය කෙරෙහි ඇති ඔවුන්ගේ පක්ෂපාතිත්වය, පක්ෂයට මූල්‍යමය වශයෙන් දායක වීමට ඇති හැකියාව, බලගතු ප්‍රදායක ජාල වෙත ඔවුන්ට ඇති ප්‍රවේශය සහ මාධ්‍ය සමඟ උපායශීලී ව්‍යාපාර පවත්වා ගෙන යාමේ හැකියාව මත ය. මෙම ලිඛිත නොවන නීති මගින් මූල්‍ය සම්පත් සහ

ප්‍රභූ සමාජ ප්‍රාග්ධනය සහිත අපේක්ෂකයින්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ, බොහෝ විට එය දේශපාලන නිපුණත්වය, බිම් මට්ටමේ නීත්‍යානුකූලභාවය හෝ හරයාත්මක ප්‍රතිපත්තිමය සම්බන්ධවීම් වලට පාඩු වන අන්දමින් සිදුවේ (බියාර්නෙගෝර්ඩ් Kenny, 2015).

## ස්ත්‍රී පුරුෂ සමාජභාවී සහ අන්තර්ආංශික බැහැර කිරීම

මෙම අවිධිමත් සහ මූල්‍යමය වශයෙන් මෙහෙයවනු ලබන තෝරා ගැනීමේ ක්‍රමය කාන්තාවන්ට, විශේෂයෙන් ජනවාර්ගික හා ආගමික සුළුතර ප්‍රජාවන්ට අසමානුපාතික ලෙස අවාසිදායක වේ. මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණයට ඇති සීමිත ප්‍රවේශය, පුරුෂ ආධිපත්‍යය දරන දේශපාලන අනුග්‍රාහක ජාල සහ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පක්ෂපාතීත්වයන් හේතුවෙන්, බොහෝ කාන්තාවන් නාමයෝජනා අවධියේ දී ක්‍රමානුකූලව ඉවත් කෙරෙති (වික්‍රමසිංහ සහ කොඩිකාර, 2012).

2024 පාර්ලිමේන්තු මැතිවරණය මේ සම්බන්ධයෙන් දුර්ලභ ඉදිරි ගමනක් ලබා දුන්නේය. මලයියාහ (වතු දෙමළ) කාන්තාවක් වන අම්බිකා සැමුවෙල්ගේ සාර්ථක අපේක්ෂකත්වය, අන්තර්ආංශික වශයෙන් වන බැහැර කිරීම පිළිබඳව ගැඹුරින් මුල් බැසගත් අභියෝග වලට උදාහරණයකි. වතු දෙමළ ප්‍රජාව ඓතිහාසිකව සමාජ-ආර්ථික ආන්තිකකරණයට සහ දේශපාලනික වශයෙන් නොසලකා හැරීමට මුහුණ දී ඇත (උයන්ගොඩ, 2012): සැමුවෙල්ගේ මැතිවරණ ව්‍යාපාරය දැඩි මූල්‍ය සීමාවන්ට සහ ආයතනික අවිශ්වාසයට මුහුණ දුන්නේ ය. ව්‍යුහාත්මක බැහැර කිරීම් ජය ගැනීම සඳහා ආයතනික සහයෝගය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ ජාතික ජනතා බලවේගයේ (NPP) ඉලක්කගතව සමස්තය ඇතුළත් කිරීමේ ප්‍රතිපත්ති හරහා ඇයගේ තෝරා පත්කර ගැනීම  බොහෝ දුරට කළ හැකිවිය (ස්කන්දකුමාර්, 2014). පක්ෂ මට්ටමේ ප්‍රගාමීය මැදිහත්වීම් ආන්තික කණ්ඩායම් වෙනුවෙන් අර්ථවත් අවස්ථා නිර්මාණය කළ හැකි ආකාරය මෙම සිද්ධියෙන් පෙන්නුම් කරයි (කොඩිකාර, 2010).

## පක්ෂයේ දොරටු රැකීම සහ පුරුෂත්වකරණය වූ නායකත්වයේ සම්මත

නාමයෝජනා ක්‍රියාවලියෙන් ඔබ්බට, දේශපාලන පක්ෂ මහජන නීත්‍යානුකූලභාවය සහ තෝරා පත්කර ගැනීමට ඇති හැකියාව සොයා බලා පාලනය කරන්නන් ලෙස ද සේවය කරයි. අපේක්ෂකයින් තේරීම පාලනය කරන අවිධිමත් සම්මත, නායකත්වය පුරුෂභාවය සමඟ සම්බන්ධ කරන පීතෘමූලික වටිනාකම් ශක්තිමත් කිරීමට පෙළඹෙයි. බියාර්නෙගෝර්ඩ් සහ කෙනී (2015) ඉස්මතු කරන පරිදි, මූල්‍ය ස්වාධීනත්වය, ප්‍රභූ සහතික සහ අනුග්‍රාහක සබඳතා ඇති පුද්ගලයින් පක්ෂ ව්‍යුහයන් තුළ වරප්‍රසාද ලත් අය වන අතර, මෙම සම්මතයන්ට අනුකූල නොවන අය කොන් කිරීමට ලක්වෙයි. මැතිවරණ සාර්ථකත්වය සඳහා අවශ්‍ය උපායමාර්ගික ආක්‍රමණශීලීත්වය හෝ සමාජ ප්‍රාග්ධනය නොමැති අය ලෙස කාන්තාවන් බොහෝ විට සලකනු ලබන අතර, එමගින් දේශපාලන බඳවා ගැනීම් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ධූරාවලියක් ශක්තිමත් කරයි.

## උපායමාර්ගික සංඥාවාදය සහ දුර්වල කෝටා ක්‍රියාත්මක කිරීම

සමහර පක්ෂ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කෝටා හඳුන්වා දී හෝ ප්‍රදායකයින්ට සහ ඡන්දදායක කොට්ඨාශයට ආයාචනා කිරීම සඳහා කාන්තා දේශපාලනඥයින් ප්‍රවර්ධනය කර ඇතත්, මෙම පියවර බොහෝ විට සංකේතාත්මකව සමස්තය ඇතුළත් කිරීමට සමාන වේ. කාන්තාවන් බොහෝ විට ජයග්‍රහණය කළ නොහැකි මැතිවරණ කොට්ඨාශවලට අනුයුක්ත කරනු ලබයි. මැතිවරණ අරමුදල් අහිමි කරනු ලබයි. නැතහොත් මැතිවරණයට ටික කලකට පෙර ප්‍රතිස්ථාපනය කරනු ලබයි. මෙම භාවිතාවන් සාධාරණත්වය කෙරෙහි වන අව්‍යාජ කැපවීමකට වඩා, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් කිරීම උපයෝගී කර ගැනීම පිළිබිඹු කරන භාවිතාවන් වේ (වික්‍රමසිංහ සහ කොඩිකාර, 2012). කෘක් සහ මැකේ (2011) තර්ක කරන පරිදි, එවැනි උපායමාර්ගික සංඥාවාදය පක්ෂවල මුල් බැසගත් බල අසමමිතිය පවත්වා ගනිමින්, සමස්තය ඇතුළත් කිරීම සඳහා වන බාහිර පීඩන තෘප්තිමත් කිරීමට උපකාරී විය හැකිය. ආයතනික ප්‍රතිසංස්කරණවලින් තොරව, කෝටාවක් මඟින් ඉවත් කිරීමට අදහස් කරන අසමානතාවයන්ම නැවත ඇති කිරීමේ අවදානමක් ඇත.

## නෛතික සහ ප්‍රතිපත්ති රාමු වල සීමා

ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාවලි තුළ මුදල් වල බලපෑම පිළිබඳව වර්ධනය වන සැලකිලිමත්වීම් තිබියදීත්, මැතිවරණ ව්‍යාපාර මූල්‍ය පාලනය කරන පුළුල් හා බලාත්මක කළ හැකි රාමුවක් ඓතිහාසිකව රටට නොතිබුණි. 2019 දී හඳුන්වා දුන් මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පත හරහා ප්‍රදායකයින් හෙළිදරව් කිරීම, වියදම් කිරීමේ සීමා සහ උල්ලංඝනය කිරීම් සඳහා දඬුවම් වැනි තීරණාත්මක ගැටළු විසඳීමට උත්සාහ කරන ලදී. 2022 දී කරන ලද සංශෝධනවලට වැඩි දියුණු කිරීම්, විශේෂයෙන්, අපේක්ෂකයින් දින 21 ක් ඇතුළත පශ්චාත් මැතිවරණ මූල්‍ය ප්‍රතිලාභ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් ඇතුළත් වූ නමුත්, යළි යළිත් සිදු වූ පාර්ලිමේන්තු ප්‍රමාදයන් සහ අඛණ්ඩව පැවති පැහැදිලි දේශපාලන කැමැත්තක් නොමැතිකම හේතුවෙන් පනත් කෙටුම්පත පනත බලාත්මක නොවී පැවතුණි. (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා [TISL], 2016; මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය කිරීමේ මධ්‍යස්ථානය [CMEV], 2017; TISL, 2023)

CMEV ඇතුළු සිවිල් සමාජ සංවිධාන, කෙටුම්පත් නීති කෙටුම්පත දේශපාලන මූල්‍යකරණය විමර්ශනය කිරීමට සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමට බලගතු යාන්ත්‍රණයක් ලෙස සැලකූහ. කෙසේ වෙතත්, පනත් කෙටුම්පතේ දිගුකාලීන අකර්මන්‍යය බව, සහ ව්‍යාපාර මූල්‍ය ලේඛන ප්‍රසිද්ධ ලියකියවිලිවලට වඩා රහසිගත ඒවා ලෙස සැලකීමත් සමඟ, වගවීම දැඩි ලෙස සීමා කෙරුණි. මැතක් වනතුරුම, අපේක්ෂකයින්ට හෝ දේශපාලන පක්ෂවලට ලැබෙන දායකත්වයන් නියාමනය කිරීම සඳහා කිසිදු බැඳීමක් සහිත නෛතික රාමුවක් නොතිබුණු අතර, ප්‍රචාරක වියදම් සඳහා බලාත්මක කළ හැකි සීමාවන් නොතිබුණි. (CMEV, 2017). මෙම හිඩැස් සාධාරණ මැතිවරණ තරගකාරිත්වය අඩපණ කළ අතර, දේශපාලන සහභාගීත්වය තුළ අසමානතාවයන් මුල් බැස ගැනීමට තුඩු දුණි.

2023 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය පිළිබඳ ප්‍රථම බලපාන නෛතික රාමුව වන 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත බලාත්මක කිරීමත් සමඟ, මෙම ව්‍යවස්ථාදායක භූ දර්ශනය වෙනස් විය. මෙම පනත මගින් ප්‍රධාන විධිවිධාන කිහිපයක් හඳුන්වා දෙන ලදී:

- වියදම් කිරීමේ සීමා: නාමයෝජනා අවසන් වීමෙන් පසු දින පහක් ඇතුළත, එක් ඡන්ද දායකයෙකු සඳහා වන අනුපාතය සහ ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව මත පදනම්ව ගණනය කරනු ලබන "අවසර ලත් මුදල් ප්‍රමාණයක්" නියම කිරීමට මැතිවරණ කොමිසමට බලය ඇත.

- ප්‍රදාන සීමා කිරීම්: දේශපාලන අපේක්ෂකයින්ට සහ පක්ෂ වලට රජයේ ආයතන වලින්, විදේශීය සංවිධාන වලින්, 50% ක් හෝ ඊට වැඩි විදේශීය හිමිකාරිත්වයක් ඇති සමාගම් වලින් සහ නිර්නාමික ප්‍රදායකයින්ගෙන් ප්‍රදාන ලබා ගැනීම තහනම් කර ඇත.

- මූල්‍ය හෙළිදරව් කිරීම: සියලුම අපේක්ෂකයින්, දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් දින 21 ක් ඇතුළත මැතිවරණ ව්‍යාපාරය ලද දායකත්වයන් සහ වියදම් පිළිබඳ සවිස්තරාත්මක, විගණනය කරන ලද වාර්තා ඉදිරිපත් කළ යුතු ය (TISL, 2023).

මෙයට අනුපූරකව, අගෝස්තු මාසයේ දී බලාත්මක කරන ලද 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මඟින්, නාමයෝජනා ලබා දෙන අවස්ථාවේ දී සියලුම අපේක්ෂකයින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම අනිවාර්ය කරන ලදී (ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, 2023). මෙම පනත් දෙක එක්ව දේශපාලනය තුළ මුදල්වල කාර්යභාරය නියාමනය කිරීමේ දී සැලකිය යුතු නෛතික ප්‍රගමනයක් පෙන්නුම් කරයි.

කෙසේ වෙතත්, මෙය ක්‍රියාත්මක කිරීමේ දී තීරණාත්මක අභියෝග පවතී. මැතිවරණ කොමිෂන් සභාව දැන් වියදම් සීමාවන් නියම කිරීමේ දී සහ මූල්‍ය හෙළිදරව් කිරීම් ලබා ගැනීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළද, එහි බලාත්මක කිරීමේ බලතල දුර්වලව පවතී. කොමිෂන් සභාව නීතිය ක්‍රියාත්මක කරන ආයතන (පොලීසිය) වෙත උල්ලංඝනයන් යොමු කිරීමට සීමා වී ඇත (පෙරේරා, 2024; TISL, 2023). ඊට අමතරව, තෙවන පාර්ශවීය සහ ඩිජිටල් ප්‍රචාරක වියදම් නියාමනයකින් තොරව පවතින අතර, පරිත්‍යාග

පිළිබඳ තථ්‍යකාලීන හෝ මැතිවරණයට පෙර හෙළිදරව් කිරීම සඳහා නෛතික අවශ්‍යතාවයක් නොමැත. මූල්‍ය වාර්තා, නීත්‍යානුකූලව අවශ්‍ය වන අතර, විනිවිදභාවය සහ ප්‍රජා අධීක්ෂණයට බාධා කරමින් ඉබේ ප්‍රසිද්ධ නොකරයි (හත්තොටුව, 2024).

විශේෂයෙන්ම, මතභේදාත්මක ගැටලුවක් වන්නේ නිල මැතිවරණ වියදම් සීමාවේ මට්ටමයි. 2024 අගෝස්තු 16 දිනැති ගැසට් නිවේදනයකට අනුව, සෑම ජනාධිපති අපේක්ෂකයෙකුටම ලියාපදිංචි ඡන්දදායකයෙකුට රුපියල් 109 ක් දක්වා වියදම් කිරීමට අවසර දී ඇති අතර, එය අපේක්ෂකයෙකුට ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.86 ක් (ඇමෙරිකානු ඩොලර් මිලියන 5 ක් පමණ) වේ. ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ පෙර නොවූ විරූ අයුරින් මෙම මුදල ඉතා අධික වන බවටත්, එය නීති සම්පාදනයේ සැබෑ ප්‍රතිසංස්කරණවාදී අරුත අඩපණ කරන බවටත් විචාරකයින් තර්ක කර ඇත. මෙය 2023 නීතියේ "සමච්චලයක්" ලෙස හත්තොටුව (2024) විස්තර කරන අතර, එවැනි ඉහළ මට්ටම් තිබීම ප්‍රතිසංස්කරණ-මනසක් සහිත සහ බිම් මට්ටමේ අපේක්ෂකයින් බැහැර කරන අතරම, ධනවත්ම පුද්ගලයින්ට වරප්‍රසාද ලබාදෙන දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කරන බවට තර්ක කරයි. ඔහුගේ මතය අනුව, මෙය 2022 අරගල ව්‍යාපාරය තුළ අපේක්ෂා කළ පරිදි අර්ථවත් පද්ධතිමය වෙනසක් ඇතිවීමේ හැකියාව ඵලදායී ලෙස අවහිර කරයි (හත්තොටුව, 2024).

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා (TISL) සහ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය කිරීමේ මධ්‍යස්ථානය (CMEV) වැනි සංවිධාන පවතින නීතියේ දුර්වලතා නිරන්තරයෙන් පෙන්වා දී ඇති අතර, මැතිවරණ ව්‍යාපාර මූල්‍ය තොරතුරු සඳහා මහජන ප්‍රවේශය ඉහළ නංවන ලෙස ඉල්ලා ඇත. ප්‍රධාන ව්‍යුහාත්මක දුර්වලතාවයක් වන්නේ 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත හෝ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරන මූල්‍ය හෝ වත්කම් ප්‍රකාශන විගණනය කිරීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත නොකිරීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස, අපේක්ෂකයින් විසින් අනාවරණය වීමේ කිසිදු අවදානමක් නොමැතිව සාවද්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරු ඉදිරිපත් කළ හැකිය. ශක්තිමත් විගණන විධිවිධාන, ඉහළ නංවන ලද මහජන ප්‍රවේශය සහ මැතිවරණ කොමිසම සඳහා වඩා වැඩි විමර්ශන අධිකාරියක් නොමැතිව, වත්මන් නෛතික රාමුවේ කාර්යක්ෂමතාව මූලික වශයෙන් අවදානමට ලක්ව ඇත (CMEV, 2017; TISL, 2023). තවද, ඉතා වැදගත්ම දුර්වලතාවයක් වන්නේ 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතෙහි, අපේක්ෂකයින්ට හෝ දේශපාලන පක්ෂ වලට මැතිවරණ ව්‍යාපාර ආශ්‍රිත සියලුම ආදායම් සහ වියදම් කැපවුණු ව්‍යාපාර බැංකු ගිණුමක් හරහා යොමු කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් ඇතුළත් නොවීමයි. එවැනි විධිවිධානයක් නොමැති විට, මූල්‍ය ප්‍රවාහ නිරීක්ෂණයට දුෂ්කර වන අතර, කිසිදු වාර්තාවක් නොමැති ගනුදෙනු සඳහා අවස්ථා නිර්මාණය කර, අපේක්ෂකයින්ට ඔවුන්ගේ වියදම්වල සැබෑ පරිමාණය සහ මූලාශ්‍රය සැඟවීමට ඉඩ සලසයි (TISL,2023).

## කෝටා ප්‍රතිසංස්කරණ සහ සංකේතාත්මක නියෝජනය

2017 අංක 16 දරන පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනත මඟින් පළාත් පාලන ආයතනවල කාන්තාවන් සඳහා 25% ක අනිවාර්ය කෝටාවක් හඳුන්වා දෙන ලදී. මෙය ඓතිහාසිකව කාන්තාවන් විධිමත් දේශපාලනයෙන් බැහැර කර තිබුණු සන්දර්භයක් තුළ විශාල ඉදිරි පියවරක් ලෙස පුළුල්ව සලකනු ලැබීය. 2018 පළාත් පාලන මැතිවරණය ශ්‍රී ලංකා ඉතිහාසයේ කාන්තා නියෝජනයේ විශාලතම සංඛ්‍යාත්මක වැඩිවීම සනිටුහන් කළ අතර, නගර සභාවලට කාන්තාවෝ 2,000 කට වඩා තේරී පත් වූහ. කෙසේ වෙතත්, ආයතනික හා ද්‍රව්‍යමය සහයෝගයක් නොමැතිවීම හේතුවෙන් මෙම කෝටාවේ බලපෑම බොහෝ දුරට සංකේතාත්මක වී ඇත. පීරිස් සහ ලේකම්වසම් (2020) තර්ක කරන පරිදි, අභ්‍යන්තර පක්ෂ ප්‍රජාතන්ත්‍රීකරණය, දේශපාලනික අධ්‍යාපනය සහ ධාරිතාව ගොඩනැගීම යන මේවායින් තොරව, කෝටා පිරිනැමීම සවිබලගැන්වීමේ සත්‍ය මෙවලම් වෙනුවට සංකේතාත්මක ඉඟි බවට පත්වීමේ අවදානමක් ඇත. තේරී පත් වූ බොහෝ කාන්තාවන් සභා කටයුතුවලදී නොවැදගත් ලෙස සලකන බවත්, සම්පත් අඩුවෙන් ලැබෙන බවත්, පිරිමි සගයන්ගේ එදිරිවාදිකම් වලට මුහුණ දෙන බවත් වාර්තා කර ඇත.

තවද, ජාතික මට්ටමේ ආයතන සඳහා කෝටා ක්‍රමය ව්‍යාප්ත කර නොමැත. ජාතික ජනතා බලවේගය (NPP) හරහා මෑතකදී අත්පත් කරගත් ජයග්‍රහණ තිබියදීත්, 2024 මැතිවරණය වන විට කාන්තාවන් සඳහා පාර්ලිමේන්තු නියෝජනය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක, එනම්, 10% ට වඩා මඳක් අඩුවෙන් පැවතුණි. (මැතිවරණ දෙපාර්තමේන්තුව, 2024). පක්ෂ අතර සම්මුතියක් නොමැතිකම සහ පක්ෂ ප්‍රභූන්ගෙන්

පැමිණෙන මුල් බැසගත් ප්‍රතිරෝධය හේතුවෙන් ජාතික මට්ටමේ කෝටාවක් සඳහා වන ඉල්ලීම් නැවත නැවතත් මඟ හැර ඇත (මුරගල පදනම, 2024).

## සංසන්දනාත්මක සාහිත්‍යය


උගතුන් කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය වැඩි වැඩියෙන් සලකන්නේ හුදෙක් නියෝජනය පිළිබඳ ප්‍රශ්නයක් ලෙස පමණක් නොව, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය සහ පක්ෂ විසින් සිදුකරනු ලබන වැළැක්වීම් හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවී බැහැර කිරීම යළි උපදවන, මුල් බැසගත් දේශපාලන-ආර්ථික ව්‍යුහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ය. කෘෂක් (2010) තර්ක කරන්නේ, මූල්‍ය හා සංකේතාත්මක ප්‍රාග්ධනය කෙරෙහි ස්ථාපිත කළ ප්‍රවේශයක් ඇති අයට වරප්‍රසාද ලබා දෙමින්, පුරුෂ ආධිපත්‍යය දරන අනුග්‍රාහක ජාල සහ ආයතනික සම්මතයන් අපේක්ෂකයින් තේරීම හැඩගස්වන බව ය. ආනුභවික අධ්‍යයන වලින් පෙනී යන්නේ කලාපය පුරා අවිධිමත් මැතිවරණ ව්‍යාපාර-අරමුදල් පද්ධති, විනිවිදභාවයෙන් තොර ප්‍රදානයන්, ප්‍රභූ පාලනයේ ඇති අනුග්‍රහයන්, සහ ඥාතීන් මත පදනම් වූ සේවාදායකවාදය මඟින් පෙනී යන අතර, එය කාන්තාවන්ට ව්‍යුහාත්මක අවාසි ඇති කරන බවයි (අග්‍රවාල්, 2021; WEDO, 2007). දේශපාලන පක්ෂවල සාමාජිකයින්ගෙන් අතිමහත් බහුතරය පිරිමින් වන අතර, එමඟින් තරගකාරී ව්‍යාපාර දියත් කිරීමට කාන්තාවන්ට ඇති හැකියාව සීමා කර, ඔවුන් හට පුද්ගලික ඉතිරිකිරීම් හෝ තාවකාලිකව රාජ්‍ය නොවන සංවිධාන වල සහාය මත යැපීමට හේතු වේ (නස්නීන් සහ මහමුද්, 2012; WEDO, 2007). මෙම මූල්‍ය සීමාවන් පීතෘමූලික සම්මතයන්, මැතිවරණ ප්‍රචණ්ඩත්වය සහ පක්ෂග්‍රාහී මාධ්‍ය රාමු සමඟ අන්තර්ජේදනය වන අතර, මේ සියල්ල අපේක්ෂකයින් ලෙස කාන්තාවන්ගේ දෘශ්‍යතාව සහ ස්වශක්තතාව තවදුරටත් සීමා කරයි (බියාර්නෙගෝර්ඩ් සහ සෙටබර්ග්, 2020). එහි ප්‍රතිඵලයක් ලෙස, ජලල්සායි (2013) සහ නස්නීන් (2018) සඳහන් කරන පරිදි, කාන්තාවන්ගේ සීමිත සහභාගිත්වය දේශපාලන අභිලාෂයක් නොමැතිකම නිසා නොව, දකුණු ආසියාවේ මැතිවරණ දේශපාලන ආර්ථිකය තුළ ගැබ්ව ඇති ව්‍යුහාත්මක බැහැර කිරීම නිසා සිදු වේ.

මැතිවරණ දේශපාලනයට සම්බන්ධ මූල්‍යමය දණ්ඩනය ජනවාර්ගික වශයෙන්, කුලය හෝ ආගමික වශයෙන් ආන්තික කණ්ඩායම්වල කාන්තාවන්ට විශේෂයෙන් දැඩි වේ. ඉන්දියාවේ දලිත් කාන්තාවන් පිළිබඳ අධ්‍යයනයන් මඟින් කුල අනුව වෙනස්කොට සැලකීමේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව අඩුවෙන් අරමුදල් ලැබීමේ “ද්විත්ව බරක්” හෙළිදරව් කරන අතර, එමඟින් ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් රජයේ පහළ ස්ථර වලට හෝ අභිමතය පරිදි අවම අයවැය සහිතව වෙන් කර ඇති ආසන වලට සීමා වේ (පායික්, 2018). පාකිස්ථානයේ සහ බංග්ලාදේශයේ, වෙන් කළ ආසන සහ කෝටා යාන්ත්‍රණයන් ව්‍යක්ත නියෝජනය වැඩි දියුණු කර ඇති නමුත්, මූල්‍යමය ප්‍රවේශය සම කර නොමැත: කාන්තාවන් නාමයෝජනා සහ මැතිවරණ අරමුදල් සඳහා පක්ෂ ප්‍රභූ මත දැඩි ලෙස යැපෙන අතර, සවිබලගැන්වීමට වඩා යැපීම ශක්තිමත් කරයි (නස්නීන් සහ මහමුද්, 2012). මෙම සන්දර්භයන් හරහා, අර්ථවත් ලෙස සමස්තය ඇතුළත් කිරීම පිණිස, මැතිවරණ ව්‍යාපාර මූල්‍ය පාලන තන්ත්‍රයන්ට කෙරෙන ව්‍යුහාත්මක වෙනස්කම් සමඟ, නියෝජනය පිළිබඳ ප්‍රතිසංස්කරණ එක් කිරීම, මූල්‍ය කෝටා හඳුන්වා දීම, විනිවිදභාවය සහ ප්‍රජා අධීක්ෂණය, විශේෂයෙන් සුළුතර ජනවාර්ගික, කුල සහ ආගමික ප්‍රජාවන්ගෙන් එන කාන්තාවන් සඳහා දේශපාලන සහභාගීත්වය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම අවශ්‍ය බවට විද්වත්තු තර්ක කරති (අග්‍රවාල්, 2021).

# සොයාගැනීම්

## දේශපාලනයේදී කාන්තාවන් මුහුණ දෙන අභියෝග

ශ්‍රී ලංකාවේ දේශපාලනයට පිවිසෙන කාන්තාවන් හට තමන්ගේ සහභාගීත්වය පමණක් නොව, දේශපාලන ක්ෂේත්‍රය තුළ ඵලදායී ලෙස තරඟ කිරීමේ හැකියාව ද හැඩගස්වන සංකීර්ණ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අභියෝග රැසකට මුහුණ දීමට සිදුව ඇත. මෙම අභියෝග දේශීය සංස්කෘතික සම්මත, පවුල් ව්‍යුහ සහ සමාජ අපේක්ෂාවන් හරහා පෙරහන් කරනු ලබන අතර, ඒවා දිස්ත්‍රික්ක පුරා වෙනස් වේ. නමුත් පුරුෂාධිපත්‍යය සහ සමාජීය පාලනය කාන්තා දේශපාලන කර්තෘත්වය සීමා කරන ආකාරය නිරන්තරයෙන් හෙළි කරයි. කාන්තාවෝ සමජාතීය කාණ්ඩයක් නොවෙති: පන්තිය, විවාහක තත්ත්වය, ආගම, භාෂාව සහ ප්‍රජා පසුබිම යන සියල්ලම ඔවුන් මුහුණ දෙන බාධක සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමට ඔවුන් යොදවන උපායමාර්ග වලට මැදිහත්වීම් කරයි.




### ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංචලනය සහ සදාචාරය අවේක්ෂණය

කාන්තාවන්ගේ සංචලනය සීමා කිරීම ශ්‍රී ලංකාව පුරා දේශපාලන සහභාගීත්වයට ඇති වඩාත්ම පැතිරුණු, එහෙත් බලගතු බාධකයක් ලෙස මතු වේ. දේශපාලනය දෘශ්‍යතාව, චලනය සහ ප්‍රතිචාරාත්මක බව ඉල්ලා සිටින අතර, එම ගුණාංග බොහෝ විට පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සම්මත සමඟ ගැටේ. මොණරාගල දී ලත් සොයාගැනීම්වලින් ඉස්මතු කරන්නේ දේශපාලන කටයුතු සඳහා නිරන්තරයෙන්ම රැඳී සිටීම අවශ්‍ය කරන බවයි: රැස්වීම්වලට සහභාගී වීම, ගෙයින් ගෙට යාම, භාණ්ඩ බෙදා හැරීම සහ වඩාත්ම වැදගත් ලෙස හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම සිදු වේ. කෙසේ වෙතත්, කාන්තාවන් සඳහා, පොදු ස්ථානවල එහාමෙහා යාම සමාජීය වශයෙන් පාලනය වන අතර, සදාචාරාත්මකව චෝදනාවන්ට ලක් වේ.

පිරිමි දේශපාලනඥයෙක් නිරීක්ෂණය කළ පරිදි:

"කාන්තාවන්ට දේශපාලනය කිරීම ඉතා අපහසුයි, මොකද ඔවුන්ට රාත්‍රියේ තනිවම තමන් කළ නොහැකි නිසා. රාත්‍රියේදී හදිසි අවස්ථා ඇතිවිය හැකි අතර, මිනිසුන් ඔබේ පැමිණීම අපේක්ෂා කරනවා ... කාන්තාවන්ට අවම වශයෙන් මූලික අවශ්‍යතාවයක් ලෙස බයිසිකලයක් හෝ පැදීමට හැකි විය යුතුයි."

මෙහිදී, සංචලනය යනු හුදෙක් කාර්යෝපාය පමණක් නොව සදාචාර ද වේ. තනිව ගමන් කරන අවිවාහක කාන්තාවන් අපකීර්තියට පත්වීමේ අවදානමක් ඇති අතර, වැන්දඹුවන් ඊටත් වඩා සියුම් පරීක්ෂාවට ලක් වේ. මොණරාගල ප්‍රාදේශීය කාන්තා අයිතිවාසිකම් සංවිධානයක විශේෂඥයෙකු පැහැදිලි කළ පරිදි:

"කාන්තාවන් පිළිබඳ කුඩා කටකතාවක් පවා විශාල අපකීර්තියක් ලෙස අතිශයෝක්තියට පත් කරනවා. විශේෂයෙන් වැන්දඹුවන් සම්පූර්ණයෙන්ම නිහඬ කරනවා; දේශපාලනය කිසිසේත් ඔවුන් සඳහා නොවෙයි."

මෙම සන්දර්භය තුළ, විවාහය දෙපැත්ත කැපෙන කඩුවක් බවට පත්වේ. එයට නීත්‍යානුකූලභාවය ලබා දිය හැකි ය, නැතහොත් සීමාවන් පැනවිය හැකි ය. පිරිමි දේශපාලනඥයෙක් අපේක්ෂිකාවන් දෙදෙනෙකු සංසන්දනය කළේය:

"තරුණ කාන්තා අපේක්ෂිකාවන් දෙදෙනෙක් සිටියා. එක් අයෙක් විවාහකයි, අනෙක් කෙනා විවාහ වුණේ නැහැ. අවිවාහක ගැහැණු ළමයාට මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ඇය සමඟ එන්න කවුරුත් හිටියේ නැහැ. ඇයට තනිවම කළමනාකරණය කළ හැකි සීමාව තුළ සියල්ල කිරීමට සිදුවුණා. ජයග්‍රහණය කළ අනෙක් කෙනා විවාහකයි, ඇගේ සැමියා ඇය යන සෑම ස්ථානයකටම ඇය සමඟ එනවා."

මේ අනුව, කාන්තා නීත්‍යානුකූලභාවය බොහෝ විට රඳා පවතින්නේ ස්වාමිපුරුෂයෙකු සිටීම හෝ ඔහුගේ අනුමැතිය මත වන අතර, එමඟින් කාන්තාවන්ට පොදු ජීවිතය තුළ සැරිසැරීමට පිරිමි භාරකාරත්වය අවශ්‍ය වන බවට පවතින පීතෘමූලික උපකල්පන ශක්තිමත් කරයි.

## කාන්තා දේශපාලන කර්තෘත්වයේ කලාපීය වෙනස්කම්

### යාපනය: ගැටුම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් විපරිවර්තනය වීම

යාපනයේ දශක ගණනාවක සිවිල් යුද්ධය සහ කාන්තා-මූලික පවුල්වල ව්‍යාප්තිය හේතුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සබඳතා යළි හැඩ ගැසී ඇත. යුද්ධය අතරතුර පිරිමින් දිගු කලක් නොපැමිණීම ප්‍රජා ජීවිතයේ සහ පොදු තීරණ ගැනීමේ දී කාන්තාවන්ගේ සහභාගිත්වය සාමාන්‍යකරණය කළ අතර, එමඟින් කාන්තාවන් මහජන දෘශ්‍යතාවට සහ නායකත්වයට වඩාත් හුරුපුරුද්ද වන තත්වයන් නිර්මාණය විය. පක්ෂ මඟින් කොන් කිරීමට එරෙහි වීමට ඔවුන් දැරූ සාමූහික උත්සාහයන් පිළිබඳව යාපනයේ කාන්තා දේශාපලනඥයෙක් මෙසේ පැවසුවාය:

"2018 මැතිවරණයට තරඟ කළ අපි දැන් එකට එකතු වෙලා. මෙවර ඔවුන් වැඩිහිටි කාන්තා අපේක්ෂිකාවන් ඉවත් කර, නව අපේක්ෂකයින් ගෙන ඒමට උත්සාහ කළා. නමුත් අපි එයට විරුද්ධ වුණා. අපි මාධ්‍ය සාකච්ඡා පවා පැවැත්වුවා. යුද්ධයෙන් පසු අපට ලැබුණු පුහුණුව අපගේ අයිතිවාසිකම් වෙනුවෙන් කතා කිරීමට සහ සටන් කිරීමට අපට විශ්වාසය සහ ශක්තිය ලබා දුන්නා."

යාපනයේ තවත් කාන්තා දේශපාලනඥයෙක් මෙසේ පැහැදිලි කළාය:

"අපි දේශපාලනයට පිවිසීමට බොහෝ කලකට පෙර සිටම මේ ප්‍රදේශයේ සමාජ සේවා කටයුතු කරමින් සිටියා. ජනතාව අපව හඳුනන්නේ යම් දෙයක් කළ යුතු විට, අපි සැමවිටම එහි සිටින බැවින්. එය කරදරයක සිටින පවුලකට උපකාර කිරීම හෝ ප්‍රජා උත්සව සංවිධානය කිරීම වැනි දෙයක් විය හැකියි. පක්ෂය තුළ පවා, පිරිමින් සමහර විට අපව පසෙකට තල්ලු කිරීමට හෝ අප අයිති නැති ලෙස ක්‍රියා කිරීමට උත්සාහ කරනවා. නමුත් අපි නිහඬව සිටින්නේ නැහැ. අපි අපගේ ස්ථාවරයේ සිටගෙන ආපසු සටන් කරනවා. ජනතාව අපව විශ්වාස කරන නිසා අපව පහසුවෙන් ඉවත් කළ නොහැකි බව ඔවුන් දන්නවා."

යුද්ධයෙන් ඇති කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ භූමිකාවන් ප්‍රතිව්‍යුහගත කිරීම, පක්ෂ තුළ පීතෘමූලික ආකල්ප පැවතුණද, යාපනයේ කාන්තා දේශපාලන සහභාගීත්වය සඳහා සමාජ පදනමක් නිර්මාණය කර ඇත. ඔවුන්ගේ ආඛ්‍යාන ගැටුම්, ප්‍රජා වැඩ, සහ සාමූහික ඒකරාශී වීම හරහා ගොඩනඟන ලද ස්ථිර දේශපාලන කර්තෘත්වයක් වෙත යොමු කරයි. එය වෙනත් ස්ථානවල නිරීක්ෂණය කරන යැපීම සහ බැහැර කිරීම සමඟ බලන කල තියුණු ලෙස වෙනස් වේ.

## කොළඹ: පන්තිය සහ පවුල් බලය

කොළඹ නගරයේ කාන්තා සහභාගීත්වය සදාචාරය පිළිබඳ සියුම් පරීක්ෂාව මගින් අඩුවෙන් ද, පන්ති වරප්‍රසාද සහ ප්‍රභූ ජාලයන් මගින් වැඩි වශයෙන් ද, විනිශ්චයට ලක් වේ. නාගරික කාන්තා පළාත් පාලන දේශපාලනඥයින් දේශපාලනිකව සම්බන්ධකම් සහිත හෝ ආර්ථික වශයෙන් ස්ථාවර පවුල් වලින් පැමිණෙන අතර, එමඟින් ඔවුන්ට නීත්‍යානුකූලභාවය සහ ආරක්ෂාව යන දෙකම ලැබේ.

කොළඹ කාන්තා දේශපාලනඥයෙක් පැහැදිලි කළ පරිදි:

"මගේ තාත්තා දේශපාලනඥයන්ට ගොඩක් උදව් කළා. ඔහු තරඟ කළේ නැතත්, ඔහු දේශපාලනඥයන් සමඟ බොහෝ සෙයින් සම්බන්ධ වී ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාර වලට උදව් කළා. ඔහු මිය ගියාට පස්සේ, මට තරඟ කරන්න කිව්වා. මට කොහොමටත් මගේ තාත්තාගේ ව්‍යාපාර තිබුණා, ඒ නිසා මම හිතුවා මගේ තාත්තා කළ දේ මම කරගෙන යන්න ඕනේ කියලා. මගේ සැමියාත් මගේ ඥාති සහෝදරයෙක්, ඔහු මේ අදහසට සහාය දුන්නේ මගේ තාත්තා දේශපාලනයට කොච්චර සම්බන්ධව සිටියාද කියලා ඔහු දන්න නිසා."

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ නියෝජිතයෙකු මෙම නාගරික ගතිකත්වය සංක්ෂිප්තව සාරාංශගත කළේය:

"කොළඹ දේශපාලනය මිල අධික හා ආක්‍රමණශීලීයි. මෙහි ජීවත් වන කාන්තාවන්ට මුදල් සහ ජාල තිබෙනවා. ඔවුන් බලගතුයි. නමුත් ඔවුන් පැමිණෙන්නේ බලවත් පවුල් වලින්."

ප්‍රජා කටයුතු හරහා ගොඩනඟා ගෙන ඇති යාපනයේ සමාජ නීත්‍යානුකූලභාවයට වෙනස්ව, කොළඹ කාන්තාවෝ ක්ෂේත්‍රයට ප්‍රවේශ වීම සඳහා උරුමයෙන් ලැබුණු ප්‍රාග්ධනය සහ දේශපාලන පෙළපත මත වැඩි වශයෙන් විශ්වාසය තැබීමට නැඹුරු වෙති.

## මඩකලපුව: ආගම පීතෘමූලිකත්වය සහ පරස්පර විරෝධී ස්වාධීපත්‍යය

මඩකලපුව වැනි මුස්ලිම් ප්‍රජාවන් තුළ, පවුල් පාලනය සහ ආගමික ආයතන යන දෙකෙන්ම කාන්තා දේශපාලන සහභාගීත්වය සීමා වී ඇත. ආගම, සදාචාරය සහ ප්‍රජා අපේක්ෂණය යන දෙකෙහිම අන්තර්ජේදනය විශේෂයෙන් සීමාවලට යටත් කෙරෙන පරිසරයක් නිර්මාණය කරයි.

මඩකලපුවේ පිරිමි දේශපාලනඥයෙකුට අනුව:

"පල්ලිය නිසා කාන්තාවන්ට දේශපාලනයට පිවිසීම අභියෝගාත්මකයි. ඒ සමගම, බොහෝ කාන්තාවන්ම දේශපාලනයට පිවිසීමට ලැජ්ජා වෙනවා. උදාහරණයක් වශයෙන්, කාන්තාවන් අඳින පළඳින ආකාරය සම්බන්ධයෙන් විශාල ගැටළුවලට මුහුණ දෙනවා. මුහුණ වසාගෙන සිටියහොත් ඔවුන්ට සමහර ආයතන වලට ඇතුළු වීමට අවසර නැහැ. මෙම ස්ථානවල සේවය කරන්නේ කාන්තාවන් ඉතා ස්වල්ප දෙනෙක්; බොහෝ විට ඉන්නේ පිරිමින්. දේශපාලනයේදීත් එය එසේම යි; බොහෝ විට ඉන්නේ පිරිමින්. මුස්ලිම් කාන්තාවන්ට ප්‍රචාරක කටයුතු වලට යාමට හෝ පිරිමින් සමඟ කෙලින්ම කතා කිරීමට ද නොහැකියි."

කෙසේ වෙතත්, පරස්පර විරෝධී ලෙස, දික්කසාදය හෝ වැන්දඹුභාවය ස්වාධීපත්‍යයේ අවකාශයන් විවෘත කළ හැකිය. මඩකලපුවේ කාන්තා දේශපාලනඥයෙක් මෙසේ පැවසුවාය:

"මම මුලින්ම දේශපාලනයට පිවිසෙන විට, මගේ පවුලේ අය එය අනුමත කළේ නැහැ. මගේ දෙමව්පියන්ට ඒත්තු ගැන්විය හැකිව තිබුණා. නමුත් මගේ සහෝදර සහෝදරියන් එයට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. ඒ කාලේ මම විවාහකයි, නමුත් පසුව ඔහු මාව රවටපු නිසා මට දික්කසාද වෙන්න සිද්ධ වුණා. ඒ වේලාවේ තමයි මට ඇත්ත වශයෙන්ම දේශපාලනයට සම්බන්ධ වෙන්න පුළුවන් වුණේ."

ඇය තවදුරටත් මෙසේ පැවසුවාය: “අපේ ආගමේ කියනවා අපි සමාජයට සේවය කළ යුතුයි කියලා. නමුත් පිරිමින් කැමති නැහැ කාන්තාවන් එවැනි දේවල් වලට සම්බන්ධ වෙනවාට. ආගම නෙවෙයි මේ බව කියන්නේ, පිරිමින් ඒක හදාගෙන තියෙන්නේ. මගේ දික්කසාදයෙන් පස්සේ, මට සමාජ වැඩ කරන්න සහ දේශපාලනයට සම්බන්ධ වෙන්න නිදහස ලැබුණා.”

මෙහිදී, කාන්තාවන්ගේ දේශපාලන කර්තෘත්වය මතුවන්නේ ආයතනික සහයෝගය හරහා නොව, පීතෘමූලික විවාහයේ බිඳවැටීම හරහා වන අතර, එය ස්වාධිපත්‍යය ඉල්ලා සිටිය හැකි පරස්පර විරෝධී මාර්ග විදහා දක්වයි.

### බදුල්ල: භාෂාව, අධ්‍යාපනය සහ මතු වී එන දෘශ්‍යතාව

බදුල්ලේ වතු ප්‍රදේශ තුළ, කාන්තා දේශපාලන සහභාගීත්වය පීතෘමූලික පවුල් ව්‍යුහයන් සහ භාෂාමය ධූරාවලිය යන දෙකම මඟින් හැඩගැසී ඇත. දේශපාලනිකව සම්බන්ධවීම බොහෝ විට ගෘහස්ත අපේක්ෂාවන් කඩාකප්පල් කරන අතර, කුටුම්භ තුළ ආතතිය ඇති වීමට තුඩු දෙයි. බදුල්ලේ එක් කාන්තා දේශපාලනඥයෙකු සිහිපත් කළ පරිදි:

“මගේ සැමියාට මම රැකියාවේ දී පිටත සිටිය යුතු අන්දම, හැම වෙලාවෙම පිරිමින් අතරේ සිටිය යුතු බව පිළිගන්න බැරිවුණා. අන්තිමේදී අපි වෙන් වුණා. නමුත් මම මැතිවරණය ජයග්‍රහණය කළාට පස්සේ ඔහු ආපසු ආවා.”

එබැවින්, දේශපාලන සාර්ථකත්වය, ආරම්භයේදී ගෘහස්ථ අධිකාරිය අස්ථාවර කිරීම සිදු කළද, අතීතයට සලකා බැලීමේ දී කාන්තාවන්ගේ පොදු භූමිකාවන් නීත්‍යානුකූල කරයි. ඓතිහාසිකව, වතු කාන්තාවෝ සීමිත අධ්‍යාපනයක් සහ සංචලනය සහිතව පෞද්ගලික අවකාශයන්ට සීමා වී සිටියහ. එහෙත් පරම්පරා වෙනස මෙම මායිම් වෙනස් කිරීමට පටන් ගෙන ඇත. බදුල්ලේ පිරිමි දේශපාලනඥයෙක් මෙසේ සඳහන් කළේය:

“අපේ අම්මලා උගත් අය නෙවෙයි. නමුත් දැන් අලුත් පරම්පරාවල ලොකු වෙනසක් තියෙනවා. වතුවල කාන්තාවන් වඩාත් විවෘත හා උගත් අය. ඒ නිසා ඔවුන්ට මේ දේවල් හැසිරවිය හැකියි. නමුත් සිදුවෙමින් පවතින්නේ අලුත් දෙයක්.”

බදුල්ලේ කාන්තාවන් දේශපාලනයට පිවිසීම හැඩගස්වන කැපී පෙනෙන සාධකයන් වන්නේ භාෂාවයි. ප්‍රමුඛ පරිපාලන භාෂාව වන සිංහල භාෂාව චතුර ලෙස කථා කිරීම සංස්කෘතික ප්‍රාග්ධනයේ තීරණාත්මක ආකාරයක් ලෙස ක්‍රියා කරයි. මලයියාහ දෙමළ කාන්තාවන් සඳහා, එය බොහෝ විට අපේක්ෂිකාවන් ලෙස තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වී ඇත. බදුල්ලේ කාන්තා දේශපාලනඥයෙක් මෙසේ පැහැදිලි කළාය:

“ගම්වැසියන්ට පළාත් පාලන ආයතන වලින් යමක් කරවා ගැනීමට අවශ්‍ය වූ විට, ඔවුන් මා වෙත එන්නේ මට සිංහලෙන් කතා කළ හැකි නිසා. ඔබට දේවල් කර ගැනීමට අවශ්‍ය නම් සිංහල දැන ගැනීම ඉතා වැදගත්.”

තවත් අයෙක් ප්‍රතිචාර දක්වමින් ප්‍රකාශ කළේ:

“අපි වතු ප්‍රදේශ වල ඉන්නේ, නමුත් අපි හැමවිටම සිංහල කතා කරන නිලධාරීන් සමඟ කටයුතු කරනවා. මට සිංහලෙන් කතා කරන්න පුළුවන් නිසා, ඔවුන් [ගම්වැසියන්] හැම විටම මගෙන් ඉල්ලන්නේ ඔවුන් සමඟ එන්න කියලා. මිනිස්සු මාව දැනගත්තේ එහෙමයි. පසුව මට තරඟ කරන්න කිව්වා.”

සිංහල භාෂාවෙන් කතා කිරීමට ඔවුන්ට ඇති හැකියාව රාජ්‍යය වෙත ප්‍රවේශ වීමට මැදිහත් වනවා පමණක් නොව, ඔවුන්ගේ ප්‍රජාවන් තුළ අත්‍යවශ්‍ය අතරමැදියන් ලෙස ඔවුන්ව උසස් කරයි. එහෙත්, මෙම භාෂාමය වාසිය ගැඹුරු අසමමිතියක් අවධාරණය කරයි. කාන්තාවන් දේශපාලනයට පිවිසීම බොහෝ විට සක්‍රීය වන්නේ ව්‍යුහාත්මක ඇතුළත් කිරීමකට වඩා සිංහල ආධිපත්‍යය දරන නිලධාරිවාදී ව්‍යුහයන්ට ඔවුන්ගේ ප්‍රයෝජනවත් බව මගිනි.

## සංකේතාත්මකව සමස්තය ඇතුළත් කිරීම සහ අත්හැරුණු කණ්ඩායම් නියෝජනය

දිස්ත්‍රික්ක හරහා කාන්තාවන් දේශපාලනයෙහි ඇතුළත් කිරීම බොහෝ විට සංකේතාත්මක ස්වරූපයක් ගනී. රාජ්‍යය විසින් අනිවාර්ය කරන ලද කෝටාව කාන්තා දේශපාලනඥයින් සංඛ්‍යාව වැඩි කර ඇති නමුත්, පීතෘමූලික බල ව්‍යුහයන් වෙනස් නොවී පවතී. මඩකලපුවේ පිරිමි දේශපාලනඥයෙකු පිළිගත් පරිදි:

"කාන්තාවන් පැමිණ වැඩ කිරීම අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ; ඔවුන්ට අවශ්‍ය වන්නේ කෝටාව සපුරාලීම පමණයි. ඔවුන්ට වැඩ කිරීමට ඉඩ නොදී ඔවුන්ගේ දරුවන්ගේ වගකීම් සහ අනෙකුත් ගෘහස්ත කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට ඉඩ සැලසීම අපගේ යුතුකමයි."

මෙම මතය විධිමත්ව ඇතුළත් කිරීමේ හිස් ස්වභාවය ග්‍රහණය කරයි. කාන්තාවන්ට මැතිවරණ ලැයිස්තුවලට ඇතුළත් විය හැකිය. නමුත්, තීරණ ගැනීමේ බලය පුරුෂ ආධිපත්‍යය යටතේ පවතී. මේ අනුව, සංකේතාත්මක නියෝජනය සමහර අවස්ථාවලදී සවිබලගැන්වීමේ මුවාවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ධූරාවලිය යළි උපදවන බව පෙනේ.

## තර්ජන, හිරිහැර, සහ අසමාන අවදානම්

කාන්තා දේශපාලනඥයින් ද බියවැද්දීම් සහ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන නමුත්, එහි තීව්‍රතාවය සහ ස්වරූපය කලාප අනුව වෙනස් වේ. මඩකලපුවේ, කාන්තාවන් කිහිප දෙනෙකු තම දේශපාලන කටයුතු වලදී පැහැදිලි තර්ජන එල්ල වූ බව වාර්තා කළහ:

"මට තර්ජනය කරමින් දුරකථන ඇමතුම් ආවා. ඔවුන් මගෙන් දේශපාලනයෙන් ඉවත් වන ලෙස ඉල්ලා සිටියා. මිතුරන් සහ නෑදෑයන් හරහා ඔවුන් මට තර්ජනාත්මක පණිවිඩ එව්වා මාව බිය ගන්වා දේශපාලනය කිරීම නවත්වන්න."

සෘජු ප්‍රචණ්ඩත්වයට වඩා, ප්‍රජා මට්ටමේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් කාන්තා සහභාගීත්වය නියාමනය කිරීමට නැඹුරු වන මොණරාගල, යාපනය හෝ බදුල්ල වැනි ප්‍රදේශ වල එවැනි සිදුවීම් අඩුවෙන් දක්කට ලැබුණි. කෙසේ වෙතත්, කොළඹ දී, නාගරික දේශපාලනයේ ආක්‍රමණශීලී සහ දැඩි තරඟකාරී ස්වභාවය කාන්තාවන් වෙනස් ආකාරයක එදිරිවාදීකම්වලට නිරාවරණය කරයි. මැතිවරණ ව්‍යාපාර බොහෝ විට දැඩි එදිරිවාදිකම්වලින් පිරී පවතින අතර, මෙම පුරුෂාධිපත්‍ය දේශපාලන භූමියට ඇතුළු වන කාන්තාවෝ වාචික හිරුහැරවලට පමණක් නොව ශාරීරික බිය ගැන්වීම්වලට ද මුහුණ දෙති.

කොළඹ ප්‍රදේශයේ කාන්තා දේශපාලනඥයෙක් මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය අතරතුර ප්‍රචණ්ඩත්වය පිළිබඳ තම අත්දැකීම් විස්තර කළාය:

"මැතිවරණ දිනයේදී, විරුද්ධ පක්ෂයේ පිරිමින් පිරිසක් මගේ කාර්යාලය අසල රැස්ව සිටියා. මම කාර්යාලයෙන් පිටව යන විට ඔවුන් කෑ ගසමින් මට යම් දේවල් කියන්නට පටන් ගත්තා. මම ඔවුන්ට මුහුණ දීමට උත්සාහ කළ විට, ඔවුන්ගෙන් එක් අයෙක් මාව තල්ලු කළා. මම වැටී දරුණු ලෙස තුවාල ලැබුවා. මාව රෝහලට ඇතුළත් කිරීමට සිදුවුණා."

තරඟකාරිත්වය, අනුග්‍රහය සහ පුරුෂ ආධිපත්‍යය තුළ මුල් බැසගත් කොළඹ දේශපාලන ආක්‍රමණශීලීත්වය කාන්තාවන්ට මුහුණදීමට සිදුවන ප්‍රචණ්ඩත්වයේ ආකාර බවට පරිවර්තනය වන ආකාරය ඇගේ අත්දැකීමෙන් ඉස්මතු වේ. මඩකලපුවේ බිය ගැන්වීම් බොහෝ විට සදාචාර හෝ ආගමික ස්වභාවයක් ගන්නා අතර, කොළඹ දී එය එදිරිවාදිකම් සහ දෘශ්‍යතාව යන නාගරික දේශපාලන ආර්ථිකය තුළ ගැබ්ව ඇති ශාරීරික හිරිහැර හරහා ප්‍රකාශ වේ.

## ආර්ථික අවාසිය සහ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය

සෑම කලාපයක් හරහා ම, සඵලදායී සහභාගීත්වය සඳහා ඇති වඩාත්ම අඛණ්ඩව පවතින බාධකයක් ලෙස කාන්තාවෝ මූල්‍ය බාධක හඳුනා ගත්හ. ශ්‍රී ලංකාවේ දේශපාලන තරඟකාරිත්වය ගැඹුරින් මූල්‍යකරණය වී ඇත. ව්‍යාපාර සඳහා පෝස්ටර්, ශබ්ද පද්ධති, රැලි, සහ ඡන්දදායකයින් ඒකරාශී කිරීම සඳහා අරමුදල් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, කාන්තා පළාත් පාලන දේශපාලනඥයින් හට බොහෝ විට අනුග්‍රාහක ජාල හෝ ස්වාධීන ප්‍රාග්ධනය කෙරෙහි ප්‍රවේශය නොමැත.

කාන්තා දේශපාලනඥයින් සමඟ සමීපව කටයුතු කරන සිවිල් සමාජ නියෝජිතයෙකුට අනුව:

"පිරිමින්ට සාප්පු හිමියන්ගෙන්, ප්‍රාදේශීය ව්‍යාපාරිකයින්ගෙන් හෝ ඔවුන් දන්නා පුද්ගලයින්ගෙන් වැඩි පරීක්ෂාවකින් තොරව ණයට ගැනීමෙන් තම වියදම් කළමනාකරණය කර ගත හැකියි. කෙසේ වෙතත්, කාන්තාවන්ට එසේ කිරීමට බැහැ; එසේ ණයට ගැනීම පහසුවෙන් ඕපාදූප බවට හැරෙනවා, මිනිසුන් කතන්දර නිර්මාණය කර එය නුසුදුසු සම්බන්ධතාවයක සාක්ෂි ලෙස භාවිත කරනවා."

කොළඹ හැර අනෙකුත් සියලුම දිස්ත්‍රික්කවල කාන්තා දේශපාලනඥයින් ගෙයින් ගෙට ගොස් ප්‍රචාරණය කිරීම වැනි ශ්‍රමය වැයවන, අඩු වියදම් ක්‍රම මත විශ්වාසය තැබීම විස්තර කළේ මෙසේ ය:

"මගේ පක්ෂයෙන් මට දින කාඩ්පත් කිහිපයක් ලැබුණා. මැතිවරණ ව්‍යාපාරය අතරතුර මා විසින්ම ගෙයින් ගෙන ගොස් ඒවා බෙදා දුන්නා. රැස්වීම් හෝ විශාල උත්සව සඳහා වියදම් කිරීමට මට මුදල් නැහැ."

තවත් අයෙක් මෙසේ පැවසුවාය:

"මට සල්ලි තිබුණා නම් මට දිනන්න තිබුණා. පක්ෂයෙන් මට දුන්නු පෝස්ටර් කිහිපයක් මම අලවලා, ගෙයින් ගෙන ගිහින් මිනිස්සුන්ට කතා කළා. ඒ ගෙවල් ගොඩක් දුරින් පිහිටා තිබුණු නිසා මට ඒවා ආවරණය කර ගන්න බැරි වුණා. නමුත් මම ඒවායින් බොහෝ දෙනෙක් බලන්න ගියේ මගේ බයිසිකලයෙන්. මට එච්චර වියදම් තිබුණේ නැහැ. මට උදව් කරන්න කාන්තාවන් දෙන්නෙක් ආවා"

ඊට වෙනස්ව, පිරිමි තම මැතිවරණ වියදම් පිළිබඳව විවෘතව සහ විශ්වාසයෙන් කතා කළහ:

"මම ලක්ෂ පහක් විතර වියදම් කළා. රැස්වීම් සංවිධානය කරන්න මට උදව් කළ අයට ගෙවන්න සිද්ධ වුණා, ශබ්ද පද්ධති මිල අධිකයි. එක රැස්වීමක් සඳහා ශබ්ද පද්ධතියක් කුලියට ගැනීමට රුපියල් 10,000 සිට 15,000 දක්වා මුදලක් වැය වෙනවා." (මඩකලපුව)

"පසුගිය පළාත් සභා මැතිවරණයේ සිට, මම ජනතාවට බොහෝ උපකාර කරනවා ..... පාරවල් සෑදීමට සම්බන්ධ වුණා..... එබැවින් මෙවර මට ඡන්දය ලබා ගැනීමට මිනිසුන් පොළඹවා ගැනීම පහසු වුණා. මම කුඩා රැස්වීම් සහ ක්‍රීඩා සමාජ රැස්වීම් කිහිපයක් පවත්වා ඔවුන්ගේ සහාය ඉල්ලා සිටියා. මගේ පක්ෂය පෝස්ටර් මුද්‍රණය කිරීමට සහ මැතිවරණ ව්‍යාපාරය පවත්වාගෙන යාමට මට යම් මුදලක් ලබාදුන් අතර, මම මගේම ව්‍යාපාර වලින්ද යම් මුදලක් වියදම් කළා." (යාපනය)

මෙම තියුණු වෙනස, ආර්ථික ප්‍රාග්ධනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සදාචාර සංකේතයන් දේශපාලන තරඟ කාරීත්වය හැඩගැස්වීම සඳහා අන්තර්ජේදනය වන ආකාරය අවධාරණය කරයි. පිරිමින්ට ධනය දෘශ්‍යතාව බවට පරිවර්තනය කළ හැකි අතර, කාන්තාවෝ ඡන්දදායකයින්ට සමීප වීම, ද්‍රව්‍යමය වශයෙන් අඩු ප්‍රතිලාභ සහ අඩු බලපෑමක් ඇති උපායමාර්ග මත විශ්වාසය තබති.


කෙසේ වෙතත්, කොළඹ නගරයේ ගතිකයන් තරමක් වෙනස් චිත්‍රයක් ඉදිරිපත් කරයි. නගරයේ ඉහළ තරඟකාරී සහ මුදලට අගයක් නියම කරන දේශපාලන සංස්කෘතිය සැලකිල්ලට ගෙන, පිරිමින් සහ කාන්තාවන් යන දෙපාර්ශවයම ශක්‍ය අපේක්ෂකයින් ලෙස රැඳී සිටීම සඳහා විශාල වශයෙන් වියදම් කිරීම අපේක්ෂා කරයි. මැතිවරණ වියදම්වල ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පරතරය මොණරාගල, යාපනය, මඩකලපුව හෝ බදුල්ල වැනි දිස්ත්‍රික්කවලට වඩා මෙහි අඩුවෙන් දක්නට ලැබේ. කොළඹ කාන්තා දේශපාලනඥයින් නිශ්චිත සංඛ්‍යා හෙළි නොකළ ද, ඔවුන්ගේ ස්වරය සහ විස්තර ඔවුන්ගේ පිරිමි සගයන්ගේ වියදම් හා සංසන්දනාත්මකව ගත් කල, සැලකිය යුතු වියදම් ඇඟවුම් කළේය. ඔවුන් මුදල් ගැන ප්‍රවේශමෙන් කතා කිරීමට නැඹුරු වූ අතර, බොහෝ විට ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාරවල ද්‍රව්‍යමය පරිමාණයට වඩා ඔවුන්ගේ "වෙහෙස මහන්සි වී වැඩ කිරීම" හෝ "කැපවීම" දෙසට සංවාදය යොමු කළහ. මෙයින් ඇඟවෙන්නේ කොළඹ වැනි ප්‍රදේශවල, විශේෂයෙන් කොළඹ මහ නගර සභා (MC) ප්‍රදේශය තුළ, ප්‍රමාණවත් මූල්‍ය ආයෝජනයකින් තොරව මැතිවරණ වලට සහභාගී විය නොහැකි බවයි.

එපමණක් නොව, කොළඹ කාන්තාවන් ඉතා ක්‍රියාශීලී සහ ස්වයංව මෙහෙයවන අය බව පෙනේ; ඔවුන් තරඟ කරන්නේ ඔවුන්ගේ නම් ලැයිස්තුවට එකතු කළ නිසා පමණක් නොව, ලැබුණු අවස්ථාවෙන් යම් ප්‍රයෝජනයක් ලබා ගැනීමට ක්‍රියාශීලීව උත්සාහ කරති. ඒ සමගම, අපගේ සොයාගැනීම් වලින් පෙන්නුම් කරන්නේ, කොළඹ මහ නගර සභා ප්‍රදේශයේ දේශපාලනයට පිවිසෙන කාන්තාවන් බොහෝ විට සාපේක්ෂව වරප්‍රසාද ලත් පසුබිම් වලින් පැමිණෙන බවත්, ඔවුන්ට පෞද්ගලික ධනයක් හිමි බවත්, තමන්ගේම ව්‍යාපාර ඇති බවත්, හෝ ග්‍රාමීය ප්‍රදේශවල ඔවුන්ගේ බොහෝ සගයන් මෙන් නොව, බලසම්පන්න ජාල වෙත ප්‍රවේශය ඇති බවත් ය.

## මැතිවරණ ව්‍යාපාර මූල්‍යයෙහි මූලාශ්‍ර

### පෞද්ගලික සම්පත්

පිරිමි බොහෝ විට තම මැතිවරණ ව්‍යාපාර වෙනුවෙන් මුදල් යෙදවීම සඳහා, රැස් කරගත් පුද්ගලික ධනය, පවුලේ වත්කම් හෝ ව්‍යාපාර වල වත්කම් භාවිත කරති. ශබ්ද පද්ධති කුලියට ගැනීම, විශාල රැලි පැවැත්වීම හෝ ඔවුන්ගේ දෘශ්‍යතාව සහ තරඟකාරීත්වය සැලකිය යුතු ලෙස වැඩි කරන ප්‍රචාරක ද්‍රව්‍ය බෙදා හැරීම වැනි දෘශ්‍යතාව වැඩි කරන, සහ විශාල ලෙස වැය කෙරෙන ක්‍රියාකාරකම් වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා, මෙම සම්පත් ඔවුන්ට නම්‍යශීලී බවක් ලබා දෙයි. ඊට වෙනස්ව, කාන්තාවන්ට එවැනි වත්කම් සඳහා බොහෝ දුරට ඇත්තේ වඩාත් සීමිත ප්‍රවේශයකි. ඔවුන්ගේ ප්‍රචාරක වියදම් බොහෝ විට ලැබෙන්නේ කුඩා පරිමාණ ව්‍යාපාර, පුද්ගලික ඉතිරිකිරීම්, ඔවුන්ගේ රන් ආභරණ උකස් කිරීම හෝ ස්වාමිපුරුෂයන් සහ අනෙකුත් පිරිමි ඥාතීන්ගේ මූල්‍ය ආධාර මගිනි.




සෑම කලාපයකම, කාන්තාවෝ තම ව්‍යාපාර වෙනුවෙන් මුදල් රැස් කිරීම සඳහා විවිධ උපායමාර්ග විස්තර කළ අතර, බොහෝ විට වත්කම් හිමිකාරිත්වය තුළ පවතින ගැඹුරින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සීමාවන් හෙළි කළහ. වඩාත් පොදු ක්‍රමයක් වූයේ රන් ආභරණ උකස් කිරීමයි, එය බොහෝ විට ඔවුන්ට සෘජුවම ප්‍රවේශ විය හැකි එකම දේපළයි. බදුල්ලේ කාන්තා දේශපාලනඥයෙක් පැහැදිලි කළ පරිදි, “මම මගේ ආභරණ මැතිවරණ ව්‍යාපාරය සඳහා උකස් කළා. මට ඒවා කවදා බේරා ගත හැකි වේදැයි මම දන්නේ නැහැ. මම එය නැවත බේරා ගැනීම ගැන සිතුවේවත් නැහැ.” එම දිස්ත්‍රික්කයේම තවත් කාන්තාවක් තම මවගේ ව්‍යාපාරය උපයෝගී කරගනිමින් කුඩා ණයක් ලබාගත් බව විස්තර කළාය: “ඔබ ව්‍යාපාරයක් කරන්නේ නම් බැංකු වලින් ණය දෙනවා, මගේ නමින් උකස් කිරීමට කිසිවක් නොමැති නිසා මම මගේ මවගේ ව්‍යාපාරය භාවිතා කර ණයක් ලබා ගත්තා.

මොනරාගල සහ මඩකලපුවෙන් ද ඒ හා සමාන වාර්තා අසන්නට ලැබුණු අතර, එහිදී කාන්තා දේශපාලනඥයින් පැවසුවේ ගමන් වියදම් පියවා ගැනීමට සහ මැතිවරණ කටයුතු අතරතුර ඔවුන් සමඟ එන අයට ආහාර මිලදී ගැනීම වෙනුවෙන් ආභරණ උකස් කළ බවයි. දේශපාලන ජීවිතයට කාන්තාවන්ගේ ප්‍රවේශය බොහෝ විට ඔවුන්ගේ පෞද්ගලික දේපළ ස්වල්පයට පාඩු කරමින් සිදුවන බවත්, ඔවුන්ගේ

ආරක්ෂාව සහ සමාජ තත්ත්වයේ සංකේත වන ආභරණ දේශපාලන පැවැත්මේ උපකරණ බවට පත් කරන බවත්, මෙම කතාන්දර මඟින් අවධාරණය කෙරේ.

කොළඹ දී, මෙම රටාව තරමක් වෙනස් ලෙස දිස් විය. කොළඹ කාන්තා දේශපාලනඥයින්ට පවුල් ව්‍යාපාර, කුඩා ව්‍යවසායයන් හෝ වැටුප් සහිත රැකියා හරහා ආදායම් ලබා ගැනීමට තිබූ මාර්ග වැඩි වූ අතර, එමගින් මූල්‍ය අනාරක්ෂිතභාවයට එරෙහිව යම් ස්වාරක්ෂකයක් ලබා දෙන ලදී. එහෙත්, මෙම කාන්තාවෝ පවා නිශ්චිත මුදල් ප්‍රමාණයන් හෙළි කිරීමට පසුබට වූහ. ඔවුහු බොහෝ විට මැතිවරණ ප්‍රචාරක වියදම් පිළිබඳව නොපැහැදිලි හෝ ප්‍රවේශම් සහගත වචන වලින් කතා කළහ. ඔවුන් නිශ්චිත සංඛ්‍යා පැහැදිලිව සඳහන් නොකළ අතර, ඔවුන්ගේ විස්තර වලින් සැලකිය යුතු වියදමක් ගම්‍ය විය. කොළඹ කාන්තා දේශපාලනඥයෙක් මෙසේ අදහස් දැක්වීය, "ඔබ දන්නවා, මිනිසුන් අපව දැකීම අපට අවශ්‍ය නම්, අපට බොහෝ දේ වියදම් කිරීමට සිදු වෙනවා. වියදම් නොකර කොළඹ දේශපාලනය කිරීමට බැහැ." මෙම කාන්තා අපේක්ෂිකාවන් කතා කළ ආකාරයෙන් ඇඟවුණේ, සම්පත් කෙරෙහි ඔවුන්ට පැවති ප්‍රවේශය සාපේක්ෂව විශාල වුවද, විවෘතව මුදල් පිළිබඳව සාකච්ඡා කිරීම, විශේෂයෙන් විශාල මුදල් ප්‍රමාණයන් පිළිබඳව සාකච්ඡා කිරීම සමාජීය වශයෙන් අපහසුතාවයට පත්වන සහ දේශපාලනික වශයෙන් සංවේදී වන බවයි.

මේ සියලු පසුබිම්වලදී, පිරිමි කැපී පෙනෙන ලෙස වෙනස් අත්දැකීමක් විස්තර කළහ. කිසිවෙකු ආභාරණ උකස් කිරීම හෝ ණය ගැනීම ගැන සඳහන් කළේ නැත. ඒ වෙනුවට, ඔවුන් විස්තර කළේ ඔවුන්ගේ ව්‍යාපාර වලින් හෝ කාලයත් සමඟ රැස් කරගත් පෞද්ගලික ධනයෙන් මුදල් ලබා ගැනීමයි. බදුල්ලේ පිරිමි දේශපාලනඥයෙක් ප්‍රකාශ කළ පරිදි, "මම ලක්ෂ පහක් පමණ වියදම් කළා. රැස්වීම් සංවිධානය කිරීමට මට උදව් කරන පුද්ගලයින්ට, ශබ්දය, මුද්‍රණය සඳහා මම ගෙවිය යුතුයි. මගේ ව්‍යාපාරයෙන් මම උපයන මුදල් මම භාවිත කළා." තවත් සමහරු "ඡායාරූප රාමු කිරීමේ සාප්පු", "වාහන කුලියට දීම", "ත්‍රිරෝද රථ ධාවනය" හෝ "උපකාරක පන්ති පැවැත්වීම" වැනි ඉපැයීම් භාවිතා කිරීම ගැන කතා කළහ. ව්‍යාපාරික ප්‍රාග්ධනය සහ දේපළ සඳහා පිරිමින්ට ඇති ප්‍රවේශය ඔවුන්ට වඩාත් පහසුවෙන් සහ විශාල පරිමාණයෙන් මැතිවරණ ව්‍යාපාර සඳහා අරමුදල් සපයා ගැනීමට හැකිවන ආකාරය මෙම වාර්තා වලින් ඉස්මතු කරයි.

කලාපීය කාන්තා අයිතිවාසිකම් සංවිධානයක් නියෝජනය කරන විශේෂඥ සම්මුඛ පරීක්ෂකවරියක් සාරාංශ ගත කළ පරිදි, "කාන්තාවන් තමන්ගේම නමින් දේපළ තබා ගන්නේ කලාතුරකිනි; ඉඩම් ඔප්පු පවා නියම වශයෙන් ලියාපදිංචි කරන්නේ ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් යටතේ. මැතිවරණ වියදම් සඳහා පිරිමින්ට ඉඩම් හෝ වෙනත් වත්කම් උකස් කළ හැකි වුවද, කාන්තාවන්ට එවැනි මූල්‍යමය මාර්ග නැහැ. බොහෝ අවස්ථාවලදී, කාන්තාවන් සතුව ඇති එකම වත්කම් වන්නේ කුඩා ප්‍රමාණයේ රන් ආභරණ වන අතර, ඒවා ද බොහෝ විට කළමනාකරණය කරනු ලබන්නේ හෝ පාලනය කරනු ලබන්නේ ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් විසින්."

වත්කම් හිමිකාරිත්වයේ මෙම ව්‍යුහාත්මක අසමානතාවය කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය ගැඹුරු ලෙස හැඩගස්වයි. බොහෝ කාන්තාවන්ට, මැතිවරණ දේශපාලනයට පිවිසීම යනු ණයට ඇතුළු වීම හෝ ආර්ථික හා චිත්තවේගීය වටිනාකමක් ඇති පුද්ගලික වත්කම් අවදානමට ලක් කිරීමයි. ස්වාමිපුරුෂයන් හෝ පවුලේ සාමාජිකයන් මත ඔවුන්ගේ මූල්‍යමය යැපීම ඔවුන්ගේ ව්‍යාපාර වල ස්වාධිපත්‍යය ද සීමා කරයි. පිරිමින් තම වියදම් සාපේක්ෂව නිදහසේ ක්‍රියාත්මක කරන අතර, තීරණ ගැනීමේදී ප්‍රමාදයන් සහ සීමාව යන දෙකම හඳුන්වා දෙමින්, අරමුදල් වෙත ප්‍රවේශ වීම සඳහා කාන්තාවන් බොහෝ විට නිවෙස් තුළ සාකච්ඡා කළ යුතු වේ. මූල්‍ය ප්‍රාග්ධනය ගැඹුරින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වී සහ දේපළ හිමිකාරිත්වයට බැඳී ඇති ආකාරය මෙම ප්‍රතිවිරෝධය මඟින් අවධාරණය කෙරේ.

## අනුග්‍රාහක ජාල

ස්ථාපිත වී ඇති අනුග්‍රාහක ජාල, විශේෂයෙන් පිරිමින් සඳහා, මැතිවරණ ව්‍යාපාර මූල්‍යයෙහි කේන්ද්‍රීය ස්ථානයක් ගනී. ශ්‍රී ලංකාවේ දේශපාලනය, අන්‍යෝන්‍ය බැඳීම් ජාලයන් තුළ ගැඹුරින් ගැබ්ව ඇති අතර, එහිදී පක්ෂපාතිත්වය, සහයෝගය සහ මූල්‍ය දායකත්වය වෙනුවෙන්, අනුග්‍රහය, සහාය සහ බලපෑම

හුවමාරු වේ. අනුග්‍රහය ක්‍රියාත්මක වන්නේ හුදෙක් ආර්ථික සම්බන්ධතාවයක් ලෙස නොව, සදාචාරාත්මක ආර්ථිකයක් ලෙස, කෘතඥතාව, පිළිගැනීම සහ අන්‍යෝන්‍යතාව පිළිබඳ අඛණ්ඩ කතිකාවක් ලෙස ය. ගම්වැසියෙකුට රෝහල් හමුවීමක් ලබා ගැනීමට, සුභසාධන ප්‍රතිලාභයක් ලබා ගැනීමට හෝ නිලධාරිවාදී ගැටලුවක් විසඳා ගැනීමට උපකාර කිරීම වැනි එදිනෙදා බ්‍රෝකර් ගාස්තු ගෙවීම වැනි ක්‍රියා හරහා, පිරිමින් "දේවල් කර ගැනීමට" හැකි අය ලෙස කීර්තියක් ගොඩනගා ගන්නා අතර, එය පසුව ඡන්ද සහ මැතිවරණ අරමුදල් යන දෙකම බවට පරිවර්තනය වේ.

මඩකලපුවේ, එක් පිරිමි දේශපාලනඥයෙක් ප්‍රාදේශීය රෝහලේ තම සේවය ගම්වැසියන්ට විවිධ ආකාර වලින් උපකාර කිරීමට ඉඩ සැලසූ ආකාරය ගැන මෙනෙහි කළේය:

"මම ගමේ රෝහලේ වැඩ කරනවා. මගේ රැකියාව හේතුවෙන් මට මේ ප්‍රදේශයේ ගොඩක් අයට උදව් කරන්න පුළුවන් වෙලා තියෙනවා. මාව දන්න කෙනෙක් රෝහලට එන්න කලින් මාව සම්බන්ධ කරගත්තොත්, මම ඒ අයට පෝලිමේ ඉන්න දෙන්නේ නැහැ. මම මිනිස්සුන්ට සායන ලැයිස්තුවට නම එකතු කරගන්න උදව් කරනවා. ඒ වගේම, මම රෝහලෙන් නොමිලේ ලැබෙන බෙහෙත් බෙදා දෙනවා..... කොහොමත් මම දේශපාලනය කරන්න හිතන්නත් පෙර මේ දේවල් කරලා තිබෙනවා, ඒ වගේම එයාලට උදව් කර තිබෙනවා."

ඔහුගේ ප්‍රකාශය ඔහු එදිනෙදා සපයන ආධාර කුමන ආකාරයේ ඒවාද යන්න කෙරෙහි අවධානය යොමු කරයි; පෝලිම් මඟ හැරීමට, ඖෂධ ලබා ගැනීමට හෝ පොදු සේවාවන් ලබා ගැනීමට මිනිසුන්ට උපකාර කිරීම. පුද්ගලික ත්‍යාගශීලී ක්‍රියාවන් ලෙස සකස් කර ඇතත්, එවැනි හැසිරීම් රාජ්‍ය සංවිධානය තුළ වෘත්තීය තනතුරු බැඳීම් සහ විශ්වාසය පිළිබඳ කල් පවතින සබඳතා ගොඩනැගීමට මංපෙත් විවර කරන ආකාරය හෙළි කරයි. කාලයත් සමඟ පවත්වාගෙන යන මෙම භාවිතාවන්, රාජකාරියේ කාර්යසාධනය සහ කරුණාව සමාජ ප්‍රාග්ධනයේ ආකාර බවට පරිවර්තනය කරයි. එය පසුව දේශපාලන නීත්‍යානුකූලභාවය තහවුරු කළ හැකිය. එවැනි සන්දර්භයන් තුළ, රාජ්‍ය සේවය සහ දේශපාලන දියුණුව අතර සීමාව බොඳ වේ: උදව් කිරීමට ඇති හැකියාව බලපෑම රාශිභූත කර ගැනීමේ නිහඬ බලවත් මාධ්‍යයක් බවට පත් වේ.

මඩකලපුවේ තවත් දේශපාලනඥයෙක්, පදිංචිකරුවන්ට දැරිය හැකි මිලකට භාණ්ඩ සහතික කරමින්, දේශීය වෙළඳපොලක් යළි අත්පත් කර ගැනීමට උදව් කිරීමෙන් පසු, ඔහුගේ ජනප්‍රියත්වය වර්ධනය වූ ආකාරය සිහිපත් කළේය. ඔහු පැහැදිලි කළ පරිදි, "යම් දේවල් කර ගැනීමට" ඔහුට ඇති හැකියාව ඔහුගේ දේශපාලන පණිවිඩය සහ අරමුදල් රැස් කිරීමේ මෙවලම බවට පත්විය. ඒ හා සමානව, බදුල්ලේදී ද, මිනිසෙක් දේශීය ආධාර ජාල සහ ව්‍යාපාරික සම්බන්ධතා හරහා ඔහු ක්‍රමයෙන් දියුණු වූ අන්දම විස්තර කළේය:

"මම ජීවත් වෙන්න වාහන කුලියට දෙනවා, ඒ වගේම මට ඡායාරූප රාමු කිරීමේ ව්‍යාපාරයක් තියෙනවා. මම 2005 ඉඳන් දේශපාලනයට සම්බන්ධ වෙලා ඉන්නවා. මම කෙලින්ම දේශපාලනයට එන්න කලින් ඉඳන්ම, මම මිනිස්සුන්ට ගොඩක් උදව් කළා."

මෙම පිරිමින් තම දේශපාලනික සම්බන්ධතාවය සකස් කරගෙන ඇත්තේ ඔවුන්ගේ දිගුකාලීන සමාජ භූමිකාවන්හි ස්වාභාවික දිගුවක් ලෙස ය. දේශපාලනයට ඔවුන්ගේ පිවිසීම හදිසි දියුණුවීමේ ආශාවක් නොව, අන්‍යෝන්‍ය බැඳීම මත පදනම් වූ පුද්ගලික ජාල වගා කර ගැනීමට ගත කළ වසරවල කූටප්‍රාප්තියකි. ස්වේච්ඡා ශ්‍රමය, පරිත්‍යාග සහ සැපයුම් සහාය වැනි ක්‍රියා හරහා, ඔවුන් තම ප්‍රජාවන් තුළ විශ්වාසදායක පුද්ගලයින් ලෙස කීර්ති නාමයක් ගොඩනගා ගත්හ. අනෙක් අතට, මෙම සමාජ විශ්වසනීයත්වය, මෙහිදී තමා ලබා දෙන සහය ආපසු ලැබෙනු ඇතැයි විශ්වාස කරන දායකත්වයන්, ආධාරකරුවන් සහ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම මඟින්, එම සහය ආර්ථික සම්පතක් බවට පත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, පිරිමින් මැතිවරණ වලට තරග කරන්නේ විශ්වසනීය ස්ථානයක සිට, ප්‍රජා පක්ෂපාතිත්වය සහ අඛණ්ඩ අනුග්‍රහය නිසැකවම ලැබෙනු ඇතැයි යන පොරොන්දුවෙන් ලැබෙන පිටුබලය මත ය.

ඊට වෙනස්ව, කාන්තාවෝ මෙම මුල් බැසගත් අනුග්‍රහ පරිපථවලට ඇතින් පර්යන්තයේ සිටිති. දේශපාලනයට ඔවුන් ප්‍රවේශ වන්නේ බොහෝ විට මෑතකදී ය. එය 25% කෝටාව හරහා හෝ තරඟ කළ නොහැකි පිරිමි ඥාතීන් ඉදිරිපත් වීමෙන් ලැබෙන පහසුකමකි. කාන්තාවන් බොහෝ විට හැඳුනුම්පත්, සුභසාධන ප්‍රතිලාභ හෝ ප්‍රාදේශීය නිලධාරීන් වෙත ප්‍රවේශය ලබා ගැනීමට මිනිසුන්ට උපකාර කරමින්

ප්‍රජා කටයුතු සිදු කරන අතර, මෙම උත්සාහයන් දේශපාලන ප්‍රාග්ධනය ලෙස පිළිගන්නේ කලාතුරකිනි. ඒ වෙනුවට, ඒවා සලකන්නේ සේවා ක්‍රියාවන් ලෙස මිස, ඔවුන් මැතිවරණ වලට තරඟ කරන විට ඡන්ද ලබා ගැනීම අරමුණු කරගත් ගනුදෙනු හුවමාරුවක් ලෙස නොවේ.

මොණරාගල ප්‍රදේශයේ කාන්තා දේශපාලනඥයෙක් එදිනෙදා ගැටළු විසඳීමේ දී සහ ගම්වැසියන් සඳහා නිලධාරිවාදී මැදිහත්වීමේ දී ඇය ගැඹුරින් සම්බන්ධ වූ අයුරු විස්තර කළේ මෙසේය.

"මම මිනිස්සුන්ට හැඳුනුම්පත් ගන්න, අස්වැසුම ලැයිස්තුවට ඔවුන්ගේ නම් දාන්න ගොඩක් උදව් කරනවා. ලේකම්වරයා පවා කිව්වා මම වගේ අය දේශපාලනයේ ඉන්න ඕනේ කියලා. නමුත් එයාලා මගේ නම කපලා දැම්මා."

සමාජීය වශයෙන් වටිනාකමක් ලැබුවද, කාන්තාවන්ගේ දායකත්වයන් බොහෝ විට විධිමත් දේශපාලන තෑග්ගක් බවට පරිවර්තනය වීමට අපොහොසත් වන ආකාරය ඇගේ අත්දැකීමෙන් ඉස්මතු වේ. ඇය තවදුරටත් මෙසේ විස්තර කළාය:

"මම මැතිවරණයෙන් දිනුවා, නමුත් ඔවුන් මට අවස්ථාවක් දුන්නේ නැහැ. ඒ වෙනුවට, හොඳ චරිතයක්වත් නැති තවත් කාන්තාවක් ඔවුන් පත් කළා, ඇය රා ව්‍යාපාරයේ ඉන්න කෙනෙක්. ඔවුන්ගේ ජාල නිසා ඔවුන් මාව වෙනුවට ඇයව තෝරා ගත්තා. ඔවුන් ඇමතිවරයාට වැලි ලබා දී ඔහුගේ කාර්යාලය ගොඩනැඟීමට උදව් කළා. ඒ නිසා ඔවුන්ට විපාක ලැබුණා."

ඇයගේ ආඛ්‍යානය කාන්තාවන්ගේ දේශපාලනික නීත්‍යානුකූලභාවය පිළිබඳ සදාචාරාත්මක සහ ගනුදෙනුකාර මායිම් හෙළිදරව් කරයි. මෙහිදී හුවමාරුව, තැරැව්කාර ගාස්තු සහ ද්‍රව්‍යමය දායකත්වය හරහා බලපෑම ගලා යන දේශපාලන සංස්කෘතියක් තුළ, සේවය සහ යෝග්‍යතාව තුළ මුල් බැස තිබූ ඇයගේ සදාචාරාත්මක ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීය. සැසඳිය හැකි අනුග්‍රාහක ජාල නොමැති විට, කාන්තා දේශපාලන සහභාගීත්වය බොහෝ විට අස්ථිරව සහ පිරිමි බල තැරැව්කරුවන්ගේ බාහිර වලංගු කිරීම මත රඳා පවතී.

තවද, කීර්ති නාමයට ඇති අවදානම ගැන බියෙන්, මූල්‍ය ආධාර සඳහා ව්‍යාපාරිකයන් හෝ අනුග්‍රාහකයන් වෙත යාමේ අදහස සම්බන්ධයෙන් කාන්තාවන් අපහසුතාව පළ කළහ. මඩකලපුවේ එක් කාන්තා දේශපාලනඥයෙක් පැවසූ පරිදි:

"කාන්තාවක් ව්‍යාපාරිකයෙකුගෙන් මුදල් ඉල්ලුවොත් මිනිස්සු කතා කරන්න පටන් ගන්නවා. ඔවුන් හිතන්නේ ඇයට වෙනත් හේතූන් මත උදව් ලැබෙනවා කියලා. ඒ නිසා අප තියෙන දේවල් වලින් පිරිමසා ගන්න උත්සාහ කරනවා."

බදුල්ලේ තවත් කාන්තා දේශපාලනඥයෙක් මෙසේ පැහැදිලි කළාය:

"පිරිමින්ට නම්, සල්ලි ඉල්ලන එක ලේසියි. අපිට නම්, අපි කෙනෙක් එක්ක කතා කරන්න ගියත්, මිනිස්සු කියන්නේ මොනවාද කියලා හිතන්න වෙනවා." මැතිවරණ ප්‍රචාරණ මූල්‍යකරණයේදී කාන්තාවන් මුහුණ දෙන ව්‍යුහාත්මක බාධක පිළිබඳව ඇය තවදුරටත් අවබෝධයක් ලබා දුන්නාය: "ව්‍යාපාරිකයන් කාන්තාවන් තුළ ආයෝජනය කිරීමට බිය වන්නේ ඔවුන් යොදවන දේ ආපසු ලැබේදැයි ඔවුන්ට විශ්වාස නැති නිසා. ඔවුන් පවසන්නේ කාන්තාවන් ඕනෑවට වඩා අවංක බවයි; ඔවුන් පිරිමින් මෙන් දූෂිත නොවන බැවින් මුදල් ඔවුන් වෙත ආපසු නොඑනු ඇත."

මෙම සාක්ෂි මගින් පෙන්නුම් කරන්නේ, ගෞරවනීයභාවය සහ සදාචාරයේ පරීක්ෂාව පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මත, දේශපාලන මූල්‍යකරණය යටි තහවුරු කරන අවිධිමත් අනුග්‍රහය දක්වන ආර්ථිකයන් තුළ කාන්තාවන්ට සහභාගීවීමට ඇති හැකියාව සීමා කරන ආකාරයයි. ආර්ථික අසමානතාවයෙන් ඔබ්බට, කාන්තාවන්ගේ අන්තර්ක්‍රියා සමාජීයව පාලනය කිරීම මගින්, දේශපාලන ජීවිතය පවත්වා ගෙන යන මුදල්, බලපෑම සහ බැඳීම්වල ප්‍රවාහයන් වෙත ප්‍රවේශ වීම සීමා කරයි. පිරිමින්ට, අනුග්‍රහය යනු දේශපාලන ආයෝජන වල හොඳින් ස්ථාපිත ආකාරයකි; කාන්තාවන් සඳහා, ඔවුන් සදාචාරාත්මකව

පිරිසිදු යැයි අගන කරන සමාජ සංකේතයන්ම එම බල යාන්ත්‍රණයන් සමඟ සම්බන්ධ වීමට ඔවුන්ට ඇති හැකියාව සීමා කරයි.

## දේශපාලන පක්ෂවල සහයෝගය

මැතිවරණ ව්‍යාපාර සඳහා මූල්‍යකරණය තුළ දේශපාලන පක්ෂ තවත් තීරණාත්මක ස්ථරයක් නියෝජනය කරයි. නමුත් ඒවායේ බලපෑම ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ පන්ති රේඛා හරහා බෙහෙවින් වෙනස් වේ. පිරිමින් සඳහා, පක්ෂ සහයෝගය සාමාන්‍යයෙන් අතිරේක කාර්යභාරයක් ඉටු කරයි. ඔවුන්ට බොහෝ විට ව්‍යාපාර, දේපළ හෝ මුල් බැසගත් දේශීය ජාල හරහා රැස්කරගත් ස්වාධීන මූල්‍ය ධාරිතාවක් ඇති අතර, එමගින් ඔවුන්ට ස්වාධිපත්‍යයක් සහිතව ක්‍රියාත්මක වීමට ඉඩ සලසයි. පෝස්ටර් මුද්‍රණය, වාහන කුලියට ගැනීම හෝ ප්‍රචාරණ කටයුතු ආවරණය කරන පක්ෂ සහාය මූල්‍යමය ජීවන මාර්ගයකට වඩා සංකේතාත්මක අනුමත කිරීමක් ලෙස ක්‍රියා කරයි.

කෙසේ වෙතත්, විශේෂයෙන් ග්‍රාමීය සහ කම්කරු පන්ති පසුබිම් වලින් පැමිණෙන කාන්තාවන් සඳහා, පක්ෂ සහයෝගය බොහෝ විට මැතිවරණ ප්‍රචාරක අරමුදල් වල ප්‍රාථමික හෝ එකම මූලාශ්‍රය ලෙස පවතී. මෙම අරමුදල් සාමාන්‍යයෙන් සුළු ප්‍රමාණයක් වන අතර, මැතිවරණවල වඩාත් මූලික වියදම් පමණක් ආවරණය කරයි. එහෙත්, පක්ෂ පිටුබලය ලබා ගැනීමේ ක්‍රියාවම කතිකා කර ගැනීමකි, එය කාන්තාවන්ගේ විශ්වසනීයත්වය, සදාචාරාත්මක කීර්තිය සහ මූල්‍යමය මාර්ග යන සියල්ලම සියුම් පරීක්ෂාවට ලක් කරනු ලබයි.

එක් දේශපාලන විශ්ලේෂකයෙක් ඔහුගේ නිරීක්ෂණය බෙදාහදාගත් පරිදි:

"දේශපාලන පක්ෂ ජයග්‍රහණය කිරීමේ සැබෑ අවස්ථා ඇති කාන්තාවන් හට නාම යෝජනා දීමෙන් වැළකී සිටිනවා; ඔවුන් එවැනි අපේක්ෂිකාවන්ට බිය වෙනවා. කාන්තාවන් බොහෝ විට ඇතුළත් කරනු ලබන්නේ කෝටා අවශ්‍යතාවය සපුරාලීම සඳහා පමණයි. ව්‍යාපාර, සාප්පු හෝ දේපළ ඇති පිරිමින්ට ප්‍රමුඛතාවය ලබාදෙන අතර, කාන්තාවන් සාමාන්‍යයෙන් තෝරා ගනු ලබන්නේ සීමිත සම්පත් හෝ බලපෑමක් ඇති පහළ සමාජ ස්ථරවලින් ය."

මෙම ගතිකය පුළුල් ව්‍යුහාත්මක පක්ෂග්‍රාහී බවක් පිළිබිඹු කරයි: පක්ෂ නියෝජන කෝටා සපුරාලීම සඳහා කාන්තාවන්ගේ සංකේතාත්මක වටිනාකම මත විශ්වාසය තබන නමුත්, ශක්‍ය දේශපාලන ක්‍රියාධරයින් ලෙස ඔවුන් වෙනුවෙන් ආයෝජනය කරන්නේ කලාතුරකිනි. මේ අනුව පක්ෂ නාමයෝජනා ස්ත්‍රී පුරුෂ සමාජභාවී ධූරාවලීන්ට අභියෝග කරනවා වෙනුවට ඒවා ප්‍රතිනිෂ්පාදනය කරයි, කාන්තාවන් සවිබල ගැන්වීමට වඩා යැපීමේ තත්ත්වයන් තුළ තබයි.

මඩකලපුවේ ආබාධිත මුස්ලිම් කාන්තා දේශපාලනඥයෙක් පක්ෂ රේඛා හරහා ඇය නැවත නැවතත් ප්‍රතික්ෂේප වූ ආකාරය විස්තර කළාය:

"මම විවිධ දේශපාලන පක්ෂවලට ගිහින් ඔවුන්ගේ පක්ෂයෙන් තරග කළ හැකිදැයි විමසුවා. මට මූල්‍යමය හැකියාවක් නොමැති බව ඔවුන් දැන සිටි නිසා ඔවුන් මගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. මුස්ලිම් කොංග්‍රසය පැවසුවේ මැතිවරණ ප්‍රචාරණය සඳහා වියදම් කිරීමට මා ළඟ ප්‍රමාණවත් මුදල් නොමැති බවයි, ජාතික ජන බලවේගය පැවසුවේ ඔවුන්ගේ පක්ෂයෙන් තරඟ කිරීමට මට අධ්‍යාපන සුදුසකම් නොමැති බවයි. අවසානයේ සජිත් පමණයි මට අවස්ථාවක් දුන්නේ. ඒකත් ..... මම ආබාධිත නිසා අනුකම්පාව නිසා වෙන්න ඇති."

විධිමත් දේශපාලන අවකාශයන්ට ඇතුළුවීම සීමා කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ මූල්‍යමය ධාරිතාව අන්තර්ක්‍රියා කරන ප්‍රාදේශීය දේශපාලනය තුළ බැහැර කිරීමේ අන්තර්ආංශික ස්වභාවය ඇගේ අත්දැකීම් මගින් ග්‍රහණය කරගනී. දේශපාලන පක්ෂ "ජයග්‍රහණය කිරීමේ හැකියාව" තක්සේරු කරන්නේ ප්‍රජාවේ විශ්වාසය හෝ බිම් මට්ටමේ වැඩ අනුව පමණක් නොව, මූල්‍ය ද්‍රවශීලතාවය සහ සම්බන්ධතා අනුව ය.

මඩකලපුවේ තවත් මුස්ලිම් කාන්තා දේශපාලනඥයෙක් ඇගේ වසර ගණනාවක සමාජ සේවය පක්ෂයේ ප්‍රභූන් විසින් නොසලකා හරින ලද ආකාරය පැහැදිලි කළාය:

"මම දේශපාලනයට පිවිසීමට පෙර, සමාජ සේවා රාශියක් කළා. මේ කාරණා සම්බන්ධයෙන් දේශපාලනඥයන් හමුවීමට මම උත්සාහ කළා, නමුත් ඔවුන් මට කවදාවත් වේලාවක් ලබා දුන්නේ නැහැ. හිස්බුල්ලා හමුවීම කිසිසේත් කළ නොහැකි දෙයක්. දේශපාලනයට පිවිසෙන බොහෝ මුස්ලිම් කාන්තාවන්ට ඔවුන්ගේ බලවත් පවුල් හරහා බලපෑමක් තිබෙනවා. මම *RDS* හි භාණ්ඩාගාරික ලෙස සේවය කළ අතර බොහෝ කාන්තාවන්ට රැකියා සොයා ගැනීමට උදව් කළා, මට දේශපාලනයට පිවිසීමට හැකි වූණේ මේ ප්‍රදේශයේ මුස්ලිම් කාන්තාවන් අතර ඔවුන්ට උදව් කිරීම සම්බන්ධයෙන් මම දැනටමත් ප්‍රසිද්ධ වී සිටි නිසා. දැන්, කලින් මාව මුණගැහෙන්නේ නැති දේශපාලනඥයන් ම ඔවුන්ගේ පක්ෂ සඳහා ඡන්ද ලබා ගැනීමට මා හමුවීමට උත්සාහ කරනවා."

කාන්තාවන්ගේ සමාජ වැඩ දේශපාලනිකව කියවිය හැකිවන්නේ පිරිමින්ගේ මැතිවරණ ඉලක්ක සපුරා ගැනීමට ප්‍රයෝජන වන විට පමණක් බව ඇගේ කතාවෙන් හෙළි වේ. ඔවුන්ගේ සදාචාරාත්මක ශ්‍රමය ඡන්ද ඒකරාශී කිරීමට උපකාරී වන නමුත්, හරයාත්මක බලයක් හෝ මූල්‍යමය සහයෝගයක් ලබන්නේ කලාතුරකිනි. මඩකලපුවේ තවත් කාන්තා දේශපාලනඥයෙක් කෙටියෙන් පැවසූ පරිදි,

"කිසිම දේශපාලන පක්ෂයක කිසිවෙකු කාන්තාවන්ට සමානව සලකන්නේ නැහැ. ඔවුන් සියල්ලෝම කාන්තාවන් වන අපව යොදා ගන්නේ ඔවුන්ගේ ඡන්දය ලබා ගැනීමටයි."

මේ අනුව, පක්ෂ තුළ කාන්තාවන්ගේ අත්දැකීම් පරස්පර විරෝධී බවක් විදහා දක්වයි. ප්‍රජා ගුණධර්ම සහ සේවයේ නියෝජිතයන් ලෙස පොදු ජීවිතයට සහභාගි වීමට ඔවුන් දිරිමත් කරනු ලබයි. නමුත් සම්පත් සහ බලපෑම සංසරණය වන ගනුදෙනු අවකාශයන්ගෙන් ඔවුන් බැහැර කරනු ලබයි. මොණරාගල ප්‍රදේශයේ එක් කාන්තා දේශපාලනඥයෙක් මෙසේ විස්තර කළාය:

"මම 2018 දී දේශපාලනයට පිවිසෙන විට, කිසිවෙකු මට කිසිදු මඟපෙන්වීමක් ලබා දුන්නේ නැහැ. ඔවුන්ට අවශ්‍ය වූයේ ලැයිස්තුවේ කාන්තාවකගේ නමක් තැබීම පමණයි."

කාන්තාවන් අගය කරනු ලබන්නේ පාලනයට වඩා නියෝජනය සඳහා සිදුවන, පක්ෂ තුළ ඇති සමස්තය ඇතුළත් කිරීමේ සංකේතාත්මක ස්වභාවය, ඇයගේ කලකිරීම මඟින් පෙන්නුම් කරයි.

සාරාංශයක් ලෙස, දේශපාලන පක්ෂ කාන්තාවන්ගේ දේශපාලන චාරිකාවලදී බලය හොබවන්නන් සහ දේශපාලනයට ඇතුල්වීම පාලනය කරන දොරටු පාලකයන් ලෙස කටයුතු කරයි. පිරිමින් සඳහා, පක්ෂයෙන් දෙන පිටුබලය සමඟ දැනටමත් ඔවුන් සතුව ඇති ප්‍රාග්ධනය සහ අනුග්‍රාහක ජාලයන් අනුපූරක වන අතර, ඒවා දේශපාලන ක්ෂේත්‍රය තුළ ඔවුන්ගේ අධිකාරිය ශක්තිමත් කරයි. බොහෝ අවස්ථාවල දී පක්ෂය සමඟ ඇති අනුබද්ධය කාන්තාවන් හට දෘශ්‍යතාව ලබා දෙන නමුත් ස්වාධිපත්‍යය ලබා නොදෙයි. ධනය, බලපෑම සහ ගනුදෙනු හුවමාරුව අනුව නිත්‍යානුකූලභාවය නිර්වචනය කරන, පුරුෂ ආධිපත්‍යය සහිත ධූරාවලීන් හරහා ඔවුන්ගේ මූල්‍ය, පිළිගැනීම සහ නායකත්වය සඳහා ඇති ප්‍රවේශය කෙරෙහි මැදිහත් වෙයි. මේ අනුව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ කෝටා සහ පක්ෂ ප්‍රතිසංස්කරණ කාන්තා සහභාගිත්වයට දොර විවර කර ඇතත්, බලයේ මුදල් ඒකකය ලෙස මුදල් සහිත පුරුෂත්වයට වරප්‍රසාද ලබා දුන් ගැඹුරු ඇති දේශපාලන ආර්ථිකය ඔවුන් විසුරුවා හැර නැත.

## මැතිවරණ තරගය තුළ මැතිවරණ ව්‍යාපාර මූල්‍යයෙහි කාර්යභාරය

ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රතිඵල හැඩගැස්වීමේ දී මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය තීරණාත්මක හා බහුවිධ කාර්යභාරයක් ඉටු කරන අතර, එය රැලි සංවිධානය කිරීම හෝ පෝස්ටර් මුද්‍රණය කිරීම වැනි සරල සැපයුම්වලට වඩා බොහෝ සෙයින් වැඩි ය. මූල්‍ය සම්පත් ඒකරාශී කිරීම පිළිබඳව අපේක්ෂකයින්ට ඇති හැකියාව ඔවුන්ගේ දෘශ්‍යතාව සහ විශ්වසනීයත්වය පමණක් නොව, සමාජය තුළ ඇති පිළිගැනීම ඡන්ද බවට පරිවර්තනය කිරීමේ හැකියාව කෙරෙහි ද සෘජුවම බලපායි. මෙම ගතිකය අවධාරණය කරන්නේ, ආර්ථික බලය දේශපාලන බලය සමඟ අන්තර්ඡේදනය වන ආකාරයයි. එය බොහෝ විට පෙර පැවති සමාජ ධූරාවලීන් ශක්තිමත් කරයි.

කොළඹ කාන්තා දේශපාලනඥයෙක් පැහැදිලි කළ පරිදි, දිගුකාලීන ප්‍රජා සම්බන්ධයක් ඇති අපේක්ෂකයින් පවා සැලකිය යුතු මූල්‍ය ආයෝජනයකින් තොරව සාර්ථක වීමට අරගල කරයි. ඇය මෙසේ පැවසුවාය. "ඔබට මිනිසුන්ට උපකාර කිරීමේ වසර දහයක වාර්තාවක් තිබිය හැකිය. නමුත් ඔබ මැතිවරණ ව්‍යාපාරය තුළ වියදම් නොකළහොත්, මිනිසුන්ට ඔබව මතක නැත. ජයග්‍රහණය යනු පසුගිය මාසයේ ඡන්දදායකයින් දකින දේ පිළිබඳව මිස, ඔබ පෙර කළ දේ පිළිබඳව නොවේ." මෙය ශ්‍රී ලංකාවේ මැතිවරණ දේශපාලනයේ කාලීන තර්කනය ඉස්මතු කරයි: දිගුකාලීන සේවය සහ බිම් මට්ටමේ සහභාගීත්වය, සමාජීය වශයෙන් අගය කරන නමුත්, මැතිවරණ ප්‍රචාරක කාලය තුළ ක්ෂණික, දෘශ්‍යමාන මැදිහත්වීම් මගින් ඒවා ඌනපූරණය නොවන්නේ නම්, බොහෝ විට ඒවා ඡන්ද බවට පරිවර්තනය වීමට අපොහොසත් වේ. ඇත්ත වශයෙන්ම, මැතිවරණ සාර්ථකත්වය කෙරෙහි සමුච්චිත සමාජ දායකත්වයන් මැදිහත් වන්නේ අඩුවෙන් වන අතර, එය කෙටි කාලීන, ඉහළ බලපෑමක් ඇති සහයෝගයක් ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂකයින් හට ඇති හැකියාව මගින් වැඩි වේ.

**The Role of Campaign Finance in Electoral Competition**

Elections are often decided not by longstanding service and commitment but by visible interventions in the days leading up to the election day.

| | |
|---|---|
| **Material Intervention** | Male politicians invest in donations or repairs to draw attention to their campaign by leveraging the advantages inherent to them. This eclipses female candidates who invest years into community service |
| **Unreliability of Elections** | A candidates access and ability to mobilize financial resources impacts their visibility and credibility and their electoral success |
| **Financial Inequality** | In an environment where women are already constrained by an amalgamation of social and cultural barriers, financial inequality further deepens the divide between male and female candidates |

**Why is Campaign Finance Regulation Important?**

| | |
|---|---|
| **Fairness Matters** | Campaign finance regulation emerges as a critical mechanism to counterbalance the structural disadvantages that women face. Regulation allows women more feasible opportunities for participation |

පිරිමි දේශපාලනඥයෙකු විසින් අවසාන මොහොතේ කළ ද්‍රව්‍යමය මැදිහත්වීමක් හේතුවෙන්, වසර ගණනාවක පවත්වාගෙන ආ ප්‍රජා සේවය යටපත් වූ ආකාරය කාන්තා දේශපාලනඥයෙක් විස්තර කළ ආකාරයෙන් බදුල්ලේ දී මෙම රටාව තවත් ශක්තිමත් වුණි. ඇය මෙසේ ප්‍රකාශ කළාය, "මගේ සැමියා සහ මම සැමවිටම මිනිසුන්ට උදව් කළා. නමුත් තවත් පිරිමි අපේක්ෂකයෙක් මැතිවරණයට පෙර ජල මාර්ගයේ පැවති ගැටලුවක් විසඳුවා. මැතිවරණයට දින කිහිපයකට පෙර එය සිදු කළ නිසා සැම කෙනෙක්ම ඔහුට ඡන්දය දුන්නා, ඔවුන්ගේ මනසෙහි රැඳී තිබෙන්නේ එයයි." මෙම උදාහරණයෙන් පෙන්නුම් කරන්නේ මැතිවරණ වෙනුවෙන් වියදම් කිරීමේ දී උපායමාර්ගිකව කාලය නියම කිරීම සහ දෘශ්‍යතාව තමා පවත්වා ගෙන ගිය සමාජ සම්බන්ධතාවය අභිබවා යා හැකි ආකාරයයි. ප්‍රජා සේවය සඳහා වසර ගණනාවක් ආයෝජනය කළ ද, සාමාන්‍යයෙන්, පුද්ගලික ධනය, පක්ෂ අරමුදල් සහ පරිත්‍යාගශීලී ජාල වෙත ප්‍රවේශය අඩුවීම නිසා, මහා පරිමාණ හෝ අවසාන මොහොතේ මැදිහත්වීම් කිරීමට ඇති හැකියාව සීමා කිරීම හේතුවෙන්, කාන්තාවෝ පිරිමින්ට වඩා මෙම ගැටලුවට වඩාත් උග්‍ර ලෙස මුහුණ දෙති.

මැතිවරණ තරඟකාරිත්වයේ ද්‍රව්‍යමය මානය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවයන් තවදුරටත් තහවුරු කරයි. බදුල්ලේදී තවත් කාන්තා දේශපාලනඥයෙක් පැහැදිලි කළේ, "ජනතාව භාණ්ඩ හා මුදල් ලබාදුන් අපේක්ෂකයාට ඡන්දය දුන්නා. මා සමඟ තරඟ කරමින් සිටි තවත් අපේක්ෂකයෙක්

සෑම නිවසකටම බත් පැකට් සහ රුපියල් 5,000 ක් ලබා දුන්නා. ඒ නිසා මිනිස්සු මට ඡන්දය දුන්නේ නැහැ.'' ඒ හා සමානව, මඩකලපුවේ දී, ඡන්දදායකයින්ගේ මූල්‍යමය අපේක්ෂාවන් පැහැදිලි සහ ක්ෂණික විය හැකිය. එක් කාන්තා දේශපාලනඥයෙක් තමාට සෘජුවම අභියෝග කළ අයුරු විස්තර කළාය: ''ඔවුන් අපේ මූණටම කියනවා, 'ඔයා දිනුවම, ඔයා ඔයාගෙම මුදල් හම්බ කරගනී. ඒ නිසා ඔයාව බලයට ගේන්න උදව් කරන්න දැන් අපට අඩුම තරමේ දස දහසක් දෙන්න' කියලා.'' යාපනයේ, කාන්තා දේශපාලනඥයින් සඳහන් කළේ සමහර මැතිවරණ ප්‍රචාරක සහායකයින් ඔවුන්ගේ සහයෝගය සඳහා මුදල් වන්දි ඉල්ලා සිටි බවත්, ගෙවීම් ප්‍රතික්ෂේප කළ විට සහය දීමෙන් වැළකුණු බවත් ය. ''අපි උදව් ඉල්ලන විට, ඔවුන්ට ආපසු ලැබෙන්නේ කුමක්දැයි අසනවා. අපි කිසිවක් ලබා නොදුනහොත්, ඔවුන් උදව් කිරීමට එන්නේ නැහැ.... ඒ ආකාරයෙන්ම ඔවුන් අපෙන් ආපසු යමක් ඉල්ලා සිටියොත්, අපිත් ඔවුන්ගෙන් උදව් පිළිගන්නේ නැහැ.''

සෑම ප්‍රදේශයකම කාන්තා දේශපාලනඥයෝ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර අතරතුර මත්පැන් අපේක්ෂා කිරීම ගැන කතා කළහ. මොණරාගල කාන්තා දේශපාලනඥයෙක් පැහැදිලි කළේ, ''මගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයට සහාය වීම සඳහා මම කිසිවෙකුට මත්පැන් දුන්නේ නැහැ. ඒත් මගේ මහත්තයා උදව්වට ආපු එයාගේ යාළුවෝ කීප දෙනෙකුට බොන්න දුන්නා.'' එම දිස්ත්‍රික්කයේම තවත් අයෙක් පැවසුවේ, ''විපක්ෂයෙන් පිරිමියෙක් තරඟ කළා. ඔහු හැමෝටම මත්පැන් දුන්නා, කෑමබීම සඳහා ගොඩක් වියදම් කළා. තරුණයන් අතර, කාන්තාවන්ට උදව් කිරීමෙන් පලක් නැති බවට මතයක් තිබුණා, මොකද ඔවුන්ට බොන්න දෙයක්වත් ලැබෙන්නේ නැහැ.''

මැතිවරණ ප්‍රචාරක මූල්‍යකරණයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විෂමතා සෘජු ඡන්දදායක පෙළඹවීම්වලට පමණක් සීමා නොවේ. කාලයත් සමඟ ප්‍රජා සහයෝගය තහවුරු කිරීම සඳහා, පිරිමි බොහෝ විට උපායමාර්ගිකව ද්‍රව්‍යමය මැදිහත්වීම් උපයෝගී කර ගනිති. බදුල්ලේ දී, පිරිමි දේශපාලනඥයෙක් පාසල් ක්‍රීඩා සඳහා ආයෝජනය කිරීම, ප්‍රදේශයේ පිරිමි ළමයින්ට ක්‍රිකට් උපකරණ සැපයීම, පිළිගැනීමක් ලබා ගැනීමට සහ හොඳ හිත වර්ධනය කිරීමට මාර්ගයක් ලෙස විවෘතව විස්තර කළේය. එවැනි භාවිතාවන් දෘශ්‍යතාව, අනුග්‍රහය සහ ද්‍රව්‍යමය ප්‍රතිලාභ මැතිවරණ සාර්ථකත්වය සමඟ තදින් බැඳී ඇති, වඩා පුළුල් දේශපාලන සංස්කෘතියක් පිළිබිඹු කරයි. එය මූල්‍යමය බලය ඇති අපේක්ෂකයින්ට විසමානුපාතිකව ප්‍රතිලාභ ලබා දෙයි.

මෙම ගතිකත්වයන්ගේ සමුච්චිත බලපෑම වන්නේ පෙර පැවති අසමානතාවයන් විස්තාරණය කිරීමයි. කාන්තාවෝ සංකීර්ණ බාධකවලට මුහුණ දෙති. සමාජ සම්මතයන් බොහෝ විට ඔවුන්ගේ සංචලනය, මහජනයා සමඟ සම්බන්ධ වීම සහ අවිධිමත් දේශපාලන ජාල වෙත ප්‍රවේශය සීමා කරන අතර, මූල්‍යමය සීමා පිරිමි අපේක්ෂකයින් නිතිපතා පාහේ භාවිතා කරන ආකාරයේ උපායමාර්ගික මැදිහත්වීම් යෙදවීමේ හැකියාව සීමා කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වසර ගණනාවක් ප්‍රජාව සමඟ තමා කළ වැඩ, සමාජ විශ්වාසය හෝ සදාචාරාත්මක විශ්වසනීයත්වය මැතිවරණ ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීමට කාන්තාවන්ට අරගල කිරීමට සිදු විය හැකිය.

කෙටියෙන් කිවහොත්, ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍ය මධ්‍යස්ථ යාන්ත්‍රණයකින් බෙහෙවින් දුරස් වේ. එය මැතිවරණ පැවැත්වීම පමණක් නොව, දේශපාලන නියෝජනයේ සමාජ සංයුතිය ද හැඩගස්වන තීරණාත්මක මෙවලමකි. දෘශ්‍යතාව, අනුග්‍රහය සහ ද්‍රව්‍යමය සම්පත් එකිනෙකට වෙළීමෙන්, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය දොරටු පාලකයෙකු සහ විස්තාරකයක් ලෙස ක්‍රියා කරයි. පිරිමින්ගේ වාසිය තහවුරු කර, දේශපාලන තනතුරු අපේක්ෂා කරන කාන්තාවන්ට සැලකිය යුතු බාධක ඇති කරයි.

## මැතිවරණ ව්‍යාපාර මූල්‍ය නියාමනය වැදගත් වන්නේ මන්ද?

ශ්‍රී ලංකාවේ මැතිවරණ තරඟකාරිත්වයේ ව්‍යුහාත්මක අවාසි සමතුලිත කිරීම සඳහා තීරණාත්මක යාන්ත්‍රණයක් ලෙස මැතිවරණ මූල්‍ය නියාමනය මතු වේ. මැතිවරණ ව්‍යාපාර වියදම් සීමා කිරීමෙන්, එවැනි නියාමනයන් පුද්ගලික ධනය හෝ අනුග්‍රාහක ජාල මත යැපීම අඩු කරන අතර, අපේක්ෂකයින් තනිකරම තම මූල්‍ය හැකියාවට වඩා කුසලතා, දෘශ්‍යතාව සහ ප්‍රජාව සමඟ සම්බන්ධ වීම මත පදනම්ව තරඟ කිරීමට දිරිමත් කරයි. මෙම නීතිරීති සෑමට සමාන අවස්ථාවන් සහිත අවකාශයක් නිර්මාණය කිරීමට උපකාරී වේ. විශේෂයෙන් මහා පරිමාණ මැතිවරණ ව්‍යාපාර වියදම් සඳහා අවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශය බොහෝ විට සීමා කර ඇති කාන්තාවන් සඳහා එසේ වේ.

බදුල්ලේ කාන්තා දේශපාලනඥයෙක් සඳහන් කළ පරිදි:

"ප්‍රචාරක කටයුතු සඳහා මුදල් පාලනය කිරීමේ එම නීතිය හොඳයි. මෙම පනත පැමිණීමට පෙර, මුදල් පිරවූ ත්‍රිරෝද රථයකින් ගම් වටා ගොස් සෑම කෙනෙකුටම මුදල් ලබා දුන් ප්‍රසිද්ධ අපේක්ෂකයෙක් සිටියා. මෙම පනත පැමිණීමෙන් පසු, ඒ දේවල් සිදුවන බව අපට පෙනුනේ නැහැ. නමුත් දැනුත් ඔවුන් එම දේම වඩාත් සැඟවුණු ආකාරයකින් සිදු කරනවා."

ඒ හා සමානව, මොණරාගල ප්‍රදේශයේ කාන්තා දේශපාලනඥයෙක් ප්‍රතිසංස්කරණයේ මිශ්‍ර ප්‍රතිඵල පිළිබඳව මෙනෙහි කළාය:

"අභිප්‍රාය හොඳ නමුත් සාර්ථක නැහැ.... මගේම දේශපාලන පක්ෂයේ පිරිමි අපේක්ෂකයෙක් හිටියා, එයාගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා ලක්ෂ 35 කට වඩා වියදම් කළා."

දේශපාලන විශ්ලේෂකයින් සහ මැතිවරණ නිරීක්ෂකයින් ද ශ්‍රී ලංකාවේ වත්මන් මැතිවරණ ප්‍රචාරක මූල්‍ය රාමුව සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සැලකිය යුතු සීමාවන් ඉස්මතු කර ඇත. මැතිවරණ වියදම් නියාමන පනත මඟින් ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවට (ECSL) ඉදිරිපත් කරන ලද වියදම් වාර්තාවල අන්තර්ගතය පරීක්ෂා කිරීමට හෝ ඒවායේ නිරවද්‍යතාවය හරස් අවේක්ෂණය කිරීමට බලය ලබා නොදෙන බව ප්‍රධාන විවේචනාත්මක විග්‍රහයකි. වත්මන් නීතිය යටතේ, කොමිෂන් සභාව වාර්තා පිළිගත යුතු අතර, ඒවා ස්වාධීනව විගණනය කිරීමට එයට බලයක් නොමැත. මෙම පරතරය "ඕනෑම කෙනෙකුට ලබා දී ඇති සීමාවට අනුකූල වන, නමුත් විගණනයට ලක් නොවන, ව්‍යාජ සංඛ්‍යා ලබාදිය හැකි" බවට ඉඩ සලසයි. මෙය විශ්ලේෂකයින් විසින් නැවත නැවතත් මතු කරන ලද ගැටලුවකි.


විශේෂඥයෙකු සමඟ සම්මුඛ සාකච්ඡාවක දී, දේශපාලන විශ්ලේෂකයෙක් තවදුරටත් මෙසේ පැවසුවාය:

"නව පනත යටතේ වාර්තා කිරීමේ අවශ්‍යතා මැතිවරණ කොමිසම බරක් ලෙස සලකන බව පෙනේ. බොහෝ විට අමතර වැඩ ප්‍රමාණය ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට ප්‍රමාණවත් මානව සම්පත් නොමැති බව සඳහන් කරයි." නීතියෙන් තෙවන පාර්ශවීය වියදම් හෝ මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ප්‍රචාරණ වියදම් වැනි අංග නියාමනය නොකරන බවත්, තරඟකාරී අසමතුලිතතාවයක් ඇති කිරීම සඳහා ප්‍රකාශ නොකළ වියදම් සඳහා ඉඩක් ඇති බවත් ඇය තවදුරටත් සඳහන් කළාය.

එක්ව, මෙම ගිණුම් මැතිවරණ ව්‍යාපාර මූල්‍ය නියාමනයේ විභවය සහ සීමාවන් යන දෙකම පෙන්නුම් කරයි. එවැනි පියවරයන් මඟින් වඩාත් විවෘතව කෙරෙන ඡන්ද මිලදී ගැනීමේ ආකාරයන් සීමා කර, මැතිවරණ වියදම් වටා විධිමත් සීමාවන් ස්ථාපිත කර ඇතත්, සම්පත් සහ ජාල වෙත ප්‍රවේශ වීම පිළිබඳව ගැඹුරු ඇති අසමානතාවයන් සම්පූර්ණයෙන් ආමන්ත්‍රණය කර නොමැත. මැතිවරණ තරඟයේ සාධාරණත්වය පවත්වා ගැනීම සඳහා පමණක් නොව, කාන්තාවන්ට වඩාත් සාධාරණ කොන්දේසි මත සහභාගී වීමට හැකියාව ලබාදීම සඳහා ද මැතිවරණ ප්‍රචාරක මූල්‍ය නියාමනය ඉතා වැදගත් වේ. එහෙත්, ශක්තිමත් බලාත්මක කිරීමක් සහ පුළුල් විගණන යාන්ත්‍රණ නොමැතිව, මෙම නීතිවල සඵලතාව සීමා වී ඇති අතර, කාන්තා අපේක්ෂිකාවන් මුහුණ දෙන වඩා පුළුල් ව්‍යුහාත්මක බාධක විපරිවර්තනය කිරීම සඳහා ඔවුන්ට ඇති හැකියාව සීමා කරයි.

## මැතිවරණ ව්‍යාපාර මූල්‍ය රෙගුලාසිවලට අනුකූල වීම

### වියදම් කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කම්




කාන්තා දේශපාලනඥයින් බොහෝ විට නිල වියදම් සීමාව තුළ ක්‍රියාත්මක වන අතර, එය බොහෝ විට හිතාමතා තෝරා ගැනීමෙන් නොව සීමිත මූල්‍ය සම්පත් නිසා ය. මොණරාගල, මඩකලපුව, බදුල්ල සහ යාපනයේ, රෙගුලාසි පිළිබඳව දැනුවත්ව සිටි බොහෝ කාන්තාවන් සඳහන් කළේ ඔවුන් කෙසේ හෝ ඔවුන්ට ලබා දී ඇති වියදම් සීමාවට වඩා බෙහෙවින් අඩුවෙන් වියදම් කළ බවයි. මොනරාගල කාන්තා දේශපාලනඥයෙක් පැවසුවේ, "මම වියදම් සීමාවේ කිට්ටුවටවත් ආවේ නැහැ. මට ඒ වගේ මුදල් නැහැ. මම ගෙයින් ගෙට යන්න පෙට්‍රල් සඳහා පමණක් වියදම් කළා" යනුවෙනි. ඊට වෙනස්ව, පිරිමින් සාමාන්‍යයෙන් වියදම් සීමාවන් සැලකුවේ ඔවුන්ව බැඳ තබන සීමාවන්ට වඩා, නම්‍යශීලී මාර්ගෝපදේශ ලෙසයි. එහිදී ඔවුන් ප්‍රමාණය ඉක්මවා වියදම් කිරීම සැලකුවේ පැහැදිලි උල්ලංඝනයන් ලෙස නොව, ඔවුන් තෑගි බෙදා දෙන හෝ ප්‍රජා උත්සව පවත්වන උදාර ක්‍රියාවන් ලෙස ය. පිරිමින් අතර, උපායමාර්ගිකව වියදම් අඩුවෙන් වාර්තා කිරීම ද නිරීක්ෂණය වූ අතර, අනුකූලතාවය දක්වන බවට පෙනුම පවත්වා ගනිමින්, බලපෑම පුළුල් කිරීමට ඔවුන්ට ඉඩ සලයසි. මඩකලපුවේ පිරිමි දේශපාලනඥයෙක් පැවසුවේ "වාර්තා කිරීම විධිමත්භාවය සඳහා පමණි. සියලු වියදම් ලියා තැබීමට අවශ්‍ය නැත.... කෙසේ වෙතත්, බොහෝ වියදම් කරන්නේ මිනිසුන් වෙනුවෙන්, ඒ වගේම මිනිස්සු අපෙන් එසේ කිරීම බලාපොරොත්තු වෙනවා".

කෙසේ වෙතත්, කාන්තා දේශපාලනඥ කාණ්ඩය තුළ පවා අත්දැකීම් වෙනස් වූ බව සඳහන් කිරීම වැදගත් ය. නාගරික දිස්ත්‍රික්කවලින් හෝ ස්ථාපිත දේශපාලන පවුල් පසුබිම්වලින් පැමිණි කාන්තාවන්ට බොහෝ විට සම්පත්, ජාල සහ පක්ෂ සහයෝගය සඳහා වඩා හොඳ ප්‍රවේශයක් පැවති අතර, එමගින් පිරිමින් සමග වඩාත් සම සමව තරග කිරීමට ඔවුන්ට හැකි විය. කොළඹ කාන්තා දේශපාලනඥයෙක් ඇගේ මැතිවරණ ව්‍යාපාරය විස්තර කළේ, ඇගේ දෛනික වියදම් රුපියල් 100,000 ඉක්මවා ගිය බව සඳහන් කළාය. එහෙත්, ඇය ඉදිරිපත් කළ වියදම් ඇය සැබවින්ම වියදම් කළ ප්‍රමාණය පිළිබිඹු කළේ නැත. මෙම ව්‍යතිරේක තිබියදීත්, බොහෝ කාන්තාවෝ ව්‍යුහාත්මක අවාසිවලට දිගටම මුහුණ දුන්හ.

පිරිමින්ට විශාල සිදුවීම්, විස්තර අඩංගු අත්පත්‍රිකා හෝ කලට වේලාවට සිදු කරන මැදිහත්වීම් හරහා සිය සම්පත් දෘශ්‍යතාව බවට පරිවර්තනය කළ හැකි වුවද, කාන්තාවන් බොහෝ විට ගෙයින් ගෙට කැන්වසින් කිරීම හෝ කුඩා ප්‍රජා රැස්වීම් වැනි අඩු වියදම් උපායමාර්ග වලට සීමා විය. මොණරාගල කාන්තා දේශපාලනඥයෙක් මෙසේ මෙනෙහි කළාය. "මම මගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා වියදම් කළේ රුපියල් 3,500 ක් පමණයි. අන් අයට බැඳීම් වළක්වා ගැනීම සඳහා බාහිර පරිත්‍යාග වළක්වා ගත්තා. එය මට ස්වාධීනව සිටීමට ඉඩ දුන්නද, මගේ මැතිවරණ ව්‍යාපාරය දුටුවේ ස්වල්ප දෙනයි."

## නෛතික සාක්ෂරතාවය සහ දැනුවත්භාවය

මැතිවරණ ප්‍රචාරක මූල්‍ය නීති පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය ද කැපී පෙනෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතාවන්ගෙන් සමන්විත වේ. සෑම දිස්ත්‍රික්කයකම පිරිමින් සාමාන්‍යයෙන් රෙගුලාසි පිළිබඳව වැඩි හුරුපුරුදු කමක් පෙන්නුම් කළ අතර, බොහෝ කාන්තාවන්ට මූලික දැනුමක් පවා නොතිබුණි. සමහර අවස්ථාවලදී, කාන්තාවන් සම්පූර්ණයෙන්ම තම අනුග්‍රාහකයින් මත යැපුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නීතිය පිළිබඳ සාක්ෂරතාවය සහ දැනුවත්භාවය ඉතා අඩු මට්ටමක පැවතුනි. මඩකලපුවේ කාන්තා දේශපාලනඥයින් දෙදෙනෙක් මෙසේ පැහැදිලි කළහ:

"අපි දෙන්නාම නියෝජිතායතනයක වැඩ කරනවා. අපේ සර් අපිට මැතිවරණයට තරඟ කරන්න කිව්වා. අපි අපේ නම් සහ අත්සන් විතරයි දුන්නේ. අනිත් හැම දෙයක්ම එයා තමයි කළේ. මගේ මැතිවරණ ව්‍යාපාරයට කොච්චර වියදම් කළාද කියලා මම දන්නේ නැහැ, මොකද එයා තමයි හැමදේම කළේ."

ඒ හා සමානව, මොණරාගල දිස්ත්‍රික්කයේ, කාන්තා දේශපාලනඥයෙක් මෙසේ පැවසුවාය:

"මැතිවරණ වියදම් පිරවීම සඳහා අපට පෝරමයක් ලැබුණා. මම මගේ නම ලියා අත්සන තබා දේශපාලන පක්ෂයට දුන්නා. දේශපාලන පක්ෂය විස්තර පුරවා යවනවා."

මෙම වාර්තාවලින් පැහැදිලි වන්නේ බොහෝ කාන්තා අපේක්ෂිකාවන්ගේ විධිමත් මැතිවරණ ක්‍රියාපටිපාටිවල නියැලීම මූලික නිලධාරිවාදී අවශ්‍යතා සපුරාලීමට පමණක් සීමා වූ බවත්, ලේඛනගත කිරීමේ සහ අනුකූලතාවයේ හරයාත්මක කටයුතු සාමාන්‍යයෙන් පිරිමි අනුග්‍රාහකයින් හෝ පක්ෂ නිලධාරීන් විසින් සිදු කරන ලද බවත් ය. එබැවින් මෙම ක්‍රියාවලීන්හි ඔවුන්ගේ සහභාගීත්වය බොහෝ දුරට සංකේතාත්මක වූ අතර, ස්වාධීන අවබෝධය හෝ පාලනය මත පදනම් නොවී, පක්ෂ ව්‍යුහයන් හරහා මැදිහත් වීම් සිදු විය.

බදුල්ලේ දී, නාමයෝජනා ලබා දෙන අවස්ථාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සපයන ලද ලියකියවිලි කියවා ඇති බැවින්, පිරිමි සහ කාන්තා දේශපාලනඥයෝ යන දෙපාර්ශවයම මැතිවරණ මූල්‍ය රෙගුලාසි පිළිබඳ සාපේක්ෂව වැඩි දැනුවත්භාවයක් පෙන්නුම් කළහ. කෙසේ වෙතත්, මෙහි පවා භාෂාමය බාධක පැවතුණි. බදුල්ල අපේක්ෂකයින්ට භාෂා තුනෙන්ම මැතිවරණ මූල්‍ය රෙගුලාසි පැහැදිලි කරන තොරතුරු පැකේජයක් ලැබුණද, නිල වියදම් ප්‍රකාශන ආකෘති පත්‍ර ලබා දී තිබුණේ සිංහල භාෂාවෙන් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස, දෙමළ කතා කරන දේශපාලනඥයින් කිහිපදෙනෙකුට, විශේෂයෙන් කාන්තාවන්ට, පෝරම සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට උපකාර කිරීම සඳහා ඔවුන්ගේ දේශපාලන පක්ෂ මත යැපීමට සිදුවිය. ක්‍රියාපටිපාටිමය දැනුවත්භාවය ක්‍රියාපටිපාටිමය ස්වාධීපත්‍යයක් බවට අනිවාර්යයෙන්ම පරිවර්තනය නොවන ආකාරය මෙයින් ඉස්මතු කරයි. සමහර සුළුතර, කණ්ඩායම් වල කාන්තාවන් සඳහා, පක්ෂ ව්‍යුහයන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ධූරාවලීන් සමඟ ඒකාබද්ධව, භාෂාමය සහ නිලධාරිවාදී බාධක වල අඛණ්ඩ පැවැත්ම, මැතිවරණ වල වගවීමේ විධිමත් යාන්ත්‍රණයන් සමඟ සෘජුවම සම්බන්ධවීමට කාන්තාවන්ට ඇති හැකියාව සීමා කරයි. එබැවින්, මතුවන්නේ මැදිහත් වූ සහභාගීත්වයේ ආකාරයකි. එහිදී මැතිවරණ වල කාන්තාවන්ගේ සහභාගීත්වය පක්ෂ ජාල හරහා පහසුකම් සපයනු ලබන නමුත්, සවිබලගැන්වීමට වඩා යැපීම ශක්තිමත් කරන ආයතනික සහ භාෂාමය අතින් බැහැර කිරීම් මගින් සීමා කරනු ලබයි.

සාමාන්‍යයෙන්, මැතිවරණ ප්‍රචාරක මූල්‍ය නීතිය පිළිබඳ දැනුවත්භාවය අපේක්ෂකයින්ගේ අධ්‍යාපන පසුබිම සහ අපේක්ෂකත්වය සඳහා ඔවුන් තෝරා ගන්නා ආකාරය අනුව බොහෝ දුරට වෙනස් විය. සීමිත විධිමත් අධ්‍යාපනයක් ඇති අයට සාපේක්ෂව ඉහළ අධ්‍යාපන මට්ටම් ඇති කාන්තාවන් බොහෝ දුරට නීති සම්පාදනය පිළිබඳව දැනුවත් විය. ඒ හා සමානව, සියයට 25 ක කෝටා අවශ්‍යතාවය සපුරාලීම සඳහා අලුතින් නම් කරන ලද අයට වඩා දිගු කාලයක් දේශපාලනයේ නියැලී සිටි කාන්තාවෝ නීතිය පිළිබඳ වැඩි හුරුපුරුදුකමක් පෙන්නුම් කළහ. සිවිල් සමාජ සංවිධාන විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම ද සමහර දේශපාලනඥයන් අතර ඉහළ මට්ටමේ දැනුවත් භාවයකට දායක විය. කෙසේ වෙතත්, මෙම නිරීක්ෂණ සමස්තය නියෝජනය කෙරෙන සමීක්ෂණයකට වඩා ගුණාත්මක ගිණුම් මත පදනම් වී ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. එබැවින්, දිස්ත්‍රික්ක හරහා සමස්ත දැනුවත්භාවයේ මට්ටම නිරවද්‍යතාවයෙන් ස්ථානගත කිරීමට හෝ සාමාන්‍යකරණය කිරීමට නොහැකිය.

## ආගන්තුක සත්කාර කිරීම් එදිරිව මැතිවරණ ව්‍යාපාර සඳහා වියදම් කිරීම්

ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචාරක ව්‍යාපාරය ආගන්තුක සත්කාරය සහ ත්‍යාගශීලීභාවය පිළිබඳ පුළුල් සංස්කෘතිය භාවිතයන් සමඟ ගැඹුරින් බැඳී ඇත. එදිනෙදා ජීවිතයේදී, අමුත්තන්ට සත්කාර කිරීමේ දී තේ, ආහාර හෝ කුඩා තෑගි පිරිනැමීම අත්‍යවශ්‍ය දෙයක් ලෙස සලකනු ලබන අතර, එවැනි හැසිරීම් ප්‍රතික්ෂේප කිරීම පවා අපහාසාත්මක ලෙස දැකිය හැකිය. මෙම සංස්කෘතික අපේක්ෂාව දේශපාලන ක්ෂේත්‍රයට බාධාවකින් තොරව පැතිරෙන අතර, සාමාන්‍ය ආගන්තුක සත්කාරය සහ මැතිවරණ ප්‍රචාරණය සඳහා වියදම් කිරීම අතර වෙනස හඳුනා ගැනීම දුෂ්කර කරයි. මොණරාගල කාන්තා දේශපාලනඥයෙක් පැහැදිලි කළ පරිදි, "අපේ සංස්කෘතිය අනුව කවුරුහරි ගෙදරට ආවම හිස් අතින් යන්න දෙන්න බැහැ. තේ දෙනවා, කන්න දෙයක් දෙනවා, නමුත් මැතිවරණ කාලයකදී මේ පුරුද්දම මැතිවරණ ප්‍රචාරක පිරිවැයක් බවට පත් වෙනවා."

සංස්කෘතිය සහ දේශපාලනය අතර ඇති නොපැහැදිලි රේඛාව නිසා, ආගමික උත්සවයකදී ආහාර වේලක් සඳහා අනුග්‍රහය දැක්වීම, ක්‍රීඩා තරඟයකදී සංග්‍රහ බෙදා දීම හෝ උපන්දින රැස්වීමක් සංවිධානය කිරීම වැනි ත්‍යාගශීලී ක්‍රියා මැතිවරණ උපායමාර්ග සමඟ එකට වෙළීම සිදුවේ. මෙම හැසිරීම් බොහෝ විට ප්‍රජාවන් විසින් අපේක්ෂා කරන අතර, දේශපාලනඥයින්ට ඒවා වළක්වා ගැනීමට නොහැකි තරම්ය. මඩකලපුවේ කාන්තා දේශපාලනඥයෙක් සඳහන් කළ පරිදි, "පිරිමින්ට මුදල් වෙනුවට මත්පැන් කඩයට ටෝකන් ලබාදීම වැනි දේශපාලන වියදම් සැඟවීමට දක්ෂ ක්‍රම තිබෙනවා. අපි ඒ ගැන දන්නවා, නමුත් අපි පැමිණිලි කළහොත්, දුප්පතුන්ට ප්‍රතිලාභ ලැබීම නැවැත්වීම සම්බන්ධයෙන් මිනිසුන් අපිට දොස් පවරනු ඇති අතර, අපට ඇති ඡන්ද ස්වල්පය ද අපට අහිමි වෙනවා." බොහෝ විට "මිනිසුන්ට උදව් කිරීම" ලෙස සාධාරණීකරණය කරන ලද එවැනි භාවිතාවන්, අධීක්ෂණය සංකීර්ණ කරන අතර සංස්කෘතික බැඳීම, පුද්ගලික ත්‍යාගශීලීභාවය සහ මැතිවරණ වියදම් අතර සීමාවන් බොඳ කරයි.

ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය පිළිබඳ වඩාත්ම තීරණාත්මක සහ නොවිසඳුනු ප්‍රශ්නය වන්නේ වියදම් වාර්තා කරන ආකාරය පමණක් නොව, මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක් සැබවින්ම ආරම්භ වන්නේ කවදාද යන්නයි. විශේෂයෙන් ආගන්තුක සත්කාරය සහ තෑගි දීම එදිනෙදා පිළිවෙත් වන සංස්කෘතික සන්දර්භයක් තුළ, දේශපාලනඥයින් මෙම සීමාව සලකුණු කර ගැනීමට බලවත් පරිශ්‍රමයක් දරති. ආගමික උත්සවයකට අනුග්‍රහය දැක්වීම, පාසල් උත්සවයකදී සංග්‍රහ සැපයීම හෝ විවාහ මංගල්‍යයකදී තෑගි බෙදා දීම යන සියල්ල මැතිවරණයක් ආසන්නව සිදුවුවහොත්, මැතිවරණ ප්‍රචාරක වියදම් ලෙස සැලකිය හැකිය. එහෙත්, මෙම ක්‍රියාකාරකම් සංස්කෘතික බැඳීම් වලට ද ඇතුළත් වී ඇති බැවින්, අපේක්ෂකයින් බොහෝ විට අවධාරණය කරන්නේ ඔවුන් හුදෙක් "ප්‍රජාවට උදව් කරන" බවයි. මෙම අපැහැදිලි බව නියාමනය සහ වාර්තාකරණය යන දෙකටම පළමු ප්‍රධාන අභියෝගය නිර්මාණය කරයි.

ඒ අතරම, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය ඉතා සංකීර්ණ වන අතර, පෝස්ටර් හෝ රැලි වැනි දෘශ්‍යමාන වියදම්වලට වඩා බොහෝ සෙයින් පැතිරී ඇත. මඩකලපුවේදී, කාන්තා දේශපාලනඥයින් පිරිමින් උපායමාර්ගිකව ආගමික අධිකාරිය බලමුලු ගැන්වූ ආකාරය මෙසේ විස්තර කළහ. "ඔවුන් පවුලේ වැඩිමහල් පුරුෂයා මුස්ලිම් පල්ලියට ගෙන ගොස්, ඔහුට යම් මුදලක් ලබාදී, පවුලේ සියලුම ඡන්ද එම දේශපාලනඥයාට ලැබෙන බව සහතික කරන බවට පල්ලිය තුළ පොරොන්දු වීමට සලස්වනවා." මෙහිදී, මුදල් භාවිතය, පවුලේ බලපෑම සහ ආගමික ආයතනයක පූජනීය අවකාශය යන මේවා එකිනෙකට තදින් වෙළී පවතී. කෙසේ වෙතත්, මෙය මැතිවරණ ප්‍රචාරක වියදමක්, පුද්ගලික පරිත්‍යාගයක් හෝ සංස්කෘතික/ආගමික පිළිවෙතක් ලෙස තේරුම් ගත යුතුද? ආගමික අවකාශයන් සහ පක්ෂපාතිත්වය පිළිබඳ පොරොන්දු මූල්‍ය ගනුදෙනු සමඟ අතිච්ඡාදනය වන විට, ව්‍යාපාරයක් යනු කුමක්ද යන්න පිළිබඳ අර්ථ දැක්වීම ම බොඳ වේ.

වාර්තා කිරීම අවශ්‍ය වූ විට පවා, එය බරපතල වගවීමේ යාන්ත්‍රණයක් ලෙස නොව සංකේතාත්මක අභ්‍යාසයක් ලෙස පුළුල්ව ප්‍රත්‍යක්ෂ කර ගනී. මොණරාගල කාන්තා දේශපාලනඥයෙක් කෙලින්ම පැවසුවේ, "නීතියේ අභිප්‍රාය හොඳයි, නමුත් එය සාර්ථක නැහැ." දිස්ත්‍රික්ක පුරා බොහෝ අපේක්ෂකයින් එය විස්තර කළේ "ඕනෑ දෙයක් පුරවා යැවීම" යන කාරණයක් ලෙයසි. මෙම බැරෑරුම්කම නොමැතිකම එම ක්‍රියාවලියේ විනිවිදබවක් නොමැති ස්වභාවය මඟින් ශක්තිමත් වේ. "සංස්කෘතික" හෝ "සමාජීය" ලෙස බැහැර කළ හැකි දේට එරෙහිව නීත්‍යානුකූල ප්‍රචාරක වියදමක්

ලෙස සුදුසුකම් ලබන්නේ කුමක්ද යන්න පිළිබඳව පිරිමින් සහ කාන්තාවන් යන දෙඅංශයෙන්ම දේශපාලනඥයින් ව්‍යාකූලත්වය පළ කළහ. පැහැදිලි මඟ පෙන්වීමක් නොමැතිව, සාමාන්‍ය සමාජීය බැඳීම් සහ ප්‍රචාරක වියදම් අතර රේඛාව බොඳ වී ඇති අතර, නියාමනය සහ භාවිතාව අතර පරතරය පුළුල් කරයි.

ප්‍රායෝගික බාධක කාන්තාවන් සඳහා ඇති ගැටලුව තවදුරටත් උග්‍ර කරයි. උදාහරණයක් ලෙස බදුල්ලේ දී, දේශපාලනඥයින් භාෂා ප්‍රවේශ්‍යතාව පිළිබඳ ගැටළු නැවත නැවතත් මතු කළහ. දේශපාලනඥයින්ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් දෙමළ භාෂාවෙන් පැහැදිලි කිරීමේ ලියකියවිලි ලැබුණද, සැබෑ වියදම් වාර්තා කිරීමේ ආකෘති පත්‍ර නිකුත් කර ඇත්තේ සිංහල භාෂාවෙන් පමණි. එය මැතිවරණ ප්‍රචාරක මූල්‍ය නීති ක්‍රියාත්මක කිරීමේදී සමාජීයව සමස්තය ඇතුළත් කිරීමේ ගැඹුරු අසාර්ථකත්වයක් පෙන්නුම් කරයි. එහි ප්‍රතිඵලය ලෙස, කාන්තාවන්ට අතරමැදියන්, සාමාන්‍යයෙන් පිරිමින්, මත විශ්වාසය තැබීමට සිදුවන අතර, එය ඔවුන්ගේ ස්වාධීනත්වය අඩපණ කරනවා පමණක් නොව, පිරිමි අනුග්‍රාහකයින් හෝ පක්ෂ නිලධාරීන් මත යැපීම ද ශක්තිමත් කරයි.

සියල්ල එකට ගත් කල, මෙම ගැටළු පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වන මූල්‍යකරණය සරල නොවන බවයි. මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක් ආරම්භ වන දිනය පිළිබඳ අවිනිශ්චිතභාවය, සංස්කෘතිය, ආගම සහ දේශපාලනය සම්මිශ්‍රණය වීම සහ වාර්තා කිරීම හුදෙක් විධිමත් ක්‍රියාවක් ලෙස සැලකීම යන සියල්ල නියාමන අභිප්‍රාය අඩපණ කිරීමට ඒකාබද්ධ වේ. අඩු සම්පත් සහ අඩු ආයතනික පිටුබලයක් ඇති කාන්තා දේශපාලනඥයින් සඳහා, මෙම සංකීර්ණතා අසමානුපාතික පිරිවැයක් පනවයි.

# සාරාංශගත කරුණු

කාන්තාවන්ගේ මැතිවරණ ව්‍යාපාර මූල්‍ය යථාර්ථ බොහෝ විට හැඩගැසෙන්නේ ඔවුන්ගේම තේරීම් අනුව නොව, ඔවුන්ව දේශපාලනයට ගනු ලබන කොන්දේසි අනුව ය. කාන්තාවන් සඳහා වන අවස්ථා පුළුල් කිරීමේ අභිප්‍රාය සහිත 25% කෝටාව, ප්‍රායෝගිකව බොහෝ දේශපාලන පක්ෂ විසින් කාන්තාවන් ශක්‍ය අපේක්ෂිකාවන් ලෙස ප්‍රවර්ධනය කිරීමට වඩා, අවශ්‍යතාවය සපුරාලීමේ මාර්ගයක් ලෙස භාවිත කර ඇත. ඊට වෙනස්ව, පිරිමින් සාමාන්‍යයෙන් මූල්‍යමය වශයෙන් හෝ සමාජීය වශයෙන් ශක්තිමත් පසුබිම් වලින් තෝරා ගෙන, ප්‍රධාන ඡන්ද එකතු කරන්නන් ලෙස ස්ථානගත කරනු ලබන අතර, බොහෝ කාන්තාවන් ජයග්‍රහණය කිරීමේ අපේක්ෂාවකින් තොරව නම් කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, කාන්තාවන්ගේ මැතිවරණ වියදම් සාමාන්‍යයෙන් අඩුවන අවස්ථා බොහොමයක් තිබේ, මන්දයත්, ඔවුන්ගේ අපේක්ෂත්වය බරපතල මැතිවරණ ලංසු ලෙස සලකනු ලබන්නේ කලාතුරකින් බැවිනි. ඔවුන්ට ලබාදෙන, සම්පත් ද සීමිතය. මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත්තේ, කොන්කිරීමට ලක්වූ කාන්තාවන්, මූල්‍යමය දුර්වලතාව, ජනවාර්ගිකත්වය, හෝ සීමාකාරී සංස්කෘතික සම්මතයන් හේතුවෙන් අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති කාන්තාන් කෙරෙහි බව ද සැලකිල්ලට ගැනීම වැදගත් ය. එබැවින් මෙම සොයාගැනීම්, දේශපාලන සංස්කෘතිය තුළ වඩා හොඳින් ස්ථානගත වී ඇති, සහ කාලයත් සමග, වඩාත් සාර්ථක දේශපාලන ගමන් පථ සකස් කර ගැනීමට සමත් වූ කාන්තාවන් හට සම්පූර්ණයෙන්ම අදාළ නොවිය හැකිය.

කාන්තාවන් සඳහා සම අවස්ථාවන් සහිත අවකාශයක් නිර්මාණය කිරීම සඳහා මැතිවරණ තරඟයේ ව්‍යුහාත්මක සහ සංස්කෘතික මානයන් දෙකම සමඟ කටයුතු කිරීම අවශ්‍ය වේ. පියවර තුනක් කැපී පෙනේ. පළමුව, වියදම් සීමාවන් ඉක්මවා යන අපේක්ෂකයින්ට අර්ථවත් ප්‍රතිවිපාකවලට මුහුණ දීමට හැකිවන පරිදි මැතිවරණ මූල්‍ය නීති ඵලදායී ලෙස බලාත්මක කළ යුතු ය. වර්තමානයේ, රෙගුලාසි දුර්වල ලෙස ක්‍රියාත්මක කරමින්, දුර්වල ලෙස තේරුම් ගෙන ඇති අතර, එමගින් ඒවා ප්‍රතිඵල රහිත කර ඇත. කාන්තාවන් සඳහා, මෙම දුර්වල බලාත්මක කිරීම විශේෂයෙන් හානිකර වන්නේ, ඔවුන්ගේ සීමිත මූල්‍යමය ස්වාධීනත්වය, සම්පත් සඳහා ඇති වඩාත් දුර්වල ප්‍රවේශය සහ පිරිමි අතරමැදියන් මත යැපීම, සම අවස්ථාවන් සහිත අවකාශයක් නිර්මාණය කිරීම සඳහා වන නීති ක්‍රියාත්මක වීමට අපොහොසත් වන විට ඔවුන් විසමානුපාතිකව අවදානමට ලක් කරන බැවිනි. දෙවනුව, දේශපාලන පක්ෂ කාන්තාවන් සංකේතාත්මක ස්ථාන දරන්නන් ලෙස සැලකීමෙන් ඔබ්බට ගොස්, ඒ වෙනුවට, ජයග්‍රහණ කිරීමේ සැබෑ අපේක්ෂාවන් ඇති කාන්තා දේශපාලනඥයින්ට සහාය විය යුතු ය. එවැනි ආයතනික පිටුබලයක් නොමැතිව, කාන්තාවෝ විධිමත් ලෙස තරගයට පිවිසෙන විට පවා, සම කොන්දේසි මත තරග කිරීමට නොහැකි ව්‍යුහාත්මක අවාසියක සිටිති. තෙවනුව, ඉහළ මැතිවරණ වියදම් පිළිබඳ මුල් බැසගත් අපේක්ෂාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා සමාජය හා දේශපාලන සංස්කෘතිය සමඟ දිගුකාලීනව සම්බන්ධ වීම අත්‍යවශ්‍ය වේ. දිරිගන්වන සුළු ලෙස, සමහර දේශපාලන පක්ෂ කාන්තා දේශපාලන සහභාගිත්වයේ වැදගත්කම හඳුනා ගැනීමට පටන් ගෙන ඇති අතර, මෑත කාලීන ජාතික මට්ටමේ සාකච්ඡා වලින් පෙනී යන්නේ වෙනස, දුෂ්කර වුවද, කළ නොහැකි දෙයක් නොවන බවයි.[1]

නීති ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වුවද, ඒවා හුදකලාව සාර්ථක නොවනු ඇත. ශ්‍රී ලංකාවට කෝටා සපුරාලීම සඳහා පමණක් නොව, කාන්තාවන්ට සම කොන්දේසි මත තරග කිරීමට හැකි දේශපාලන ක්‍රමයක් කරා ගමන් කළ හැකි වන්නේ, සංස්කෘතික වෙනස්කම් සහ පක්ෂ මට්ටමේ වගකීම සමඟ, වඩාත් ශක්තිමත්ව බලාත්මක කිරීම ඒකාබද්ධ කිරීමෙන් පමණකි. අවසාන වශයෙන්, මැතිවරණ මූල්‍යකරණයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී මානයන් සහ බැහැර කිරීම ශක්තිමත් කරන පුළුල් සමාජ සම්මතයන් යන දෙකම ආමන්ත්‍රණය කරන ප්‍රතිසංස්කරණ නොමැතිව, මැතිවරණ තරඟය අයුක්තීන් ප්‍රතිනිෂ්පාදනය කිරීම අඛණ්ඩව කරගෙන යනු ඇත. ශක්තිමත් කරන ලද මැතිවරණ මූල්‍ය නියාමනය, කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය සහ නීත්‍යානුකූලභාවය ඉහළ නැංවීම සඳහා වන ක්‍රියාමාර්ග සමඟ ඒකාබද්ධ කර, නව සම්මතයන් සහ ප්‍රවණතා නිර්මාණය කිරීම සඳහා දේශපාලන පක්ෂ සහ සමාජය සම්බන්ධ වීමත් සමඟ, කාන්තා සහභාගීත්වය සංකේතාත්මක නියෝජනයේ සිට හරයාත්මක දේශපාලන සහභාගීත්වයක් බවට විපරිවර්තනය කිරීමේ හැකියාව ඇති අතර, මැතිවරණ ව්‍යාපාර වෙනුවෙන් මූල්‍ය නීති හඳුන්වා දීමේ මුල් අරමුණු ද සපුරාලයි.

1. Prime Minister Dr. Harini Amarasuriya stated that “no country has yet fully achieved gender equality, and the road ahead demands sustained political commitment” (Prime Minister’s Office, 2025). https://www.pmoffice.gov.lk/news. php?para=RU5vekFVR2dpQTd2VGRiMkZUNE4wRUowaFNidmJPMHBKdmdqU29aZ25CU0t0MDE2b0tEa0luemErMFkyeG-dzUQ==

# නිර්දේශ

කාන්තා දේශපාලන සහභාගීත්වය, මැතිවරණ ව්‍යාපාරවල මූල්‍ය කෙරෙහි ප්‍රවේශය සහ, මැතිවරණ ව්‍යාපාරවල මූල්‍යකරණ නීති ක්‍රියාවට නැංවීම සහ ඒවා පිළිපැදීම සඳහා මෙම අධ්‍යයනයේ වැඩියෙන්ම බලගතු ලෙස හඳුනාගෙන ඇති ප්‍රධාන පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් හතර, එනම්: ඡන්දදායකයින්, කාන්තා දේශපාලනඥයින්, රජයේ බලධාරීන් සහ දේශපාලන පක්ෂ, වටා පහත දක්වා ඇති නිර්දේශ සංවිධානය කර ඇත. සෑම නිර්දේශයක්ම අධ්‍යයනයේ ආනුභාවික සොයාගැනීම් සහ විශ්ලේෂණයන් මත පදනම් වී ඇති අතර, විවිධ කලාප සහ දේශපාලන සන්දර්භ හරහා කාන්තාවන් මුහුණ දෙන යථාර්ථයන් පිළිබිඹු කරයි. මෙම නිර්දේශ හරහා ප්‍රතිපත්ති, උද්දේශනය සහ ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා දරන ප්‍රයත්නයන්ට මඟ පෙන්වීමට අදහස් කරන අතර, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය, මැතිවරණ සහ මැතිවරණ ව්‍යාපාර වල මූල්‍යකරණය පිළිබඳව කටයුතු කරන වෘත්තිකයන්, ශාස්ත්‍රඥයින් සහ විශේෂඥයින් සමඟ සාකච්ඡා කිරීමෙන් තවදුරටත් පිරිපහදු කළ හැකි වේ.

## 1.0 ඡන්දදායකයින් සමඟ සම්බන්ධ වීම

ප්‍රජාතන්ත්‍රවාදී වගවීම ශක්තිමත් කිරීමට සහ දේශපාලනය තුළ මුදල් වල බලපෑම අඩු කිරීමට ඡන්දදායක අධ්‍යාපනය අත්‍යවශ්‍ය වේ. දැනුවත් කිරීමේ වැඩසටහන් කාන්තාවන් තෝරා පත්කර ගැනීමේ වැදගත්කම පමණක් නොව, මැතිවරණ ව්‍යාපාර ප්‍රචාරක වියදම්වල පුළුල් ගම්‍යර්ථ (ප්‍රතියමානයන්) ද ඡන්දදායකයින්ට තේරුම් ගැනීමට උපකාර කළ යුතුය. අධික ප්‍රචාරක වියදම් බොහෝ විට අපේක්ෂකයින් විසින් අනුග්‍රහය මත යැපීම සහ බලයට පත් වූ පසු මැතිවරණ ප්‍රචාරක වියදම් අයකර ගැනීම සඳහා අක්‍රමිකතාවන්හි යෙදීමට ඇති හැකියාව පිළිබඳව සංඥා ලබා දෙයි. එබැවින්, උගත් ඡන්දදායකයෝ ඡන්ද මිලදී ගැනීමෙන් සහ මූල්‍ය ගනුදෙනුකාරත්වයෙන් දේශපාලන සංස්කෘතිය ක්‍රමයෙන් ඉවත් කළ හැකි දැනුවත් තේරීම් කිරීම සඳහා වඩා හොඳින් සන්නද්ධ වී සිටිති.

ක්‍රියාමාර්ග ගත හැකි නිර්දේශ

ක්ෂණික ක්‍රියාමාර්ග (මාස 0-6)

### 1.1 ඡන්දදායකයින්ගේ සංජානන (අවබෝධය) පිළිබඳ සාක්ෂි ජනනය කිරීම

- මැතිවරණ ප්‍රචාරක වියදම්, ඡන්ද මිලදී ගැනීම සහ මැතිවරණ තුළ වගවීම පිළිබඳ මහජන ආකල්ප තක්සේරු කිරීම සඳහා දේශපාලන සහභාගීත්වය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංජානන සහ කාන්තා අපේක්ෂිකාවන් මුහුණ දෙන බාධක කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, රටපුරා ඡන්දදායකයින්ගේ සංජානන (අවබෝධය) පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම.

කෙටි කාලීන ක්‍රියාමාර්ග (මාස 6-24)

### 1.2 සම්බන්ධීකරණය කළ ජාතික ඡන්දදායක අධ්‍යාපන ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම

- ඡන්දදායක සංජානන සමීක්ෂණයෙන් උකහා ගෙන, අධික මැතිවරණ ප්‍රචාරක වියදම්වල අවදානම් සහ ප්‍රතිවිපාක පැහැදිලිව සන්නිවේදනය කරන සම්බන්ධීකරණය කළ ජාතික ඡන්දදායක අධ්‍යාපන ව්‍යාපාර සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාව, සිවිල් සමාජ සංවිධාන සමඟ හවුල්කාරිත්වයෙන්, ජාතික හා පළාත් පාලන මැතිවරණවලට පෙර මෙම ව්‍යාපාර මෙහෙයවිය යුතු අතර, එමගින් අනුකූලතාව, විශ්වසනීයත්වය සහ පුළුල් ප්‍රචාරණයක් සහතික කෙරේ.

## 1.3 ඉලක්කගත බහුභාෂා මාධ්‍ය අන්තර්ගතයන් සකස් කිරීම

- මැතිවරණ කොමිසම, සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගයෙන්, ටෙලි නාට්‍ය, කෙටි වීඩියෝ පට, රාජ්‍ය සේවා වෙළඳ දැන්වීම් සහ වාර්තාමය ආකාරයේ ඛණ්ඩ, සිංහල සහ දෙමළ භාෂාවලින් නිෂ්පාදනය කළ යුතු ය. මුදලට අගයක් දෙන මැතිවරණවල දිගුකාලීන සමාජීය පිරිවැය සහ අවංකත්වය සහ මහජන සේවයට කැපවූ අපේක්ෂකයින් තෝරා පත් කර ගැනීමේ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම මෙම ද්‍රව්‍ය මඟින් අවධාරණය කළ යුතු ය.

- මාධ්‍ය අන්තර්ගතය පැහැදිලිව පෙන්නුම් කළ යුත්තේ:

- ඡන්ද මිලදී ගැනීම සහ අධික ප්‍රචාරක වියදම් රාජ්‍ය සේවා සැපයීම සහ ආණ්ඩුකරණයේ ප්‍රතිඵල විකෘති කරන ආකාරය.

- ඡන්ද මිලදී ගැනීම ක්ෂණික පුද්ගලික ලාභයක් ලෙස සැලකුවද, මුදලට අගයක් දෙන මැතිවරණවල පිරිවැය අවසානයේ දී පුරවැසියන් විසින් දරන ආකාරය.

- මැතිවරණ දේශපාලනය තුළ කාන්තා අපේක්ෂිකාවන් අසමාන මූල්‍ය බාධක සහ ව්‍යුහාත්මක අවාසිවලට මුහුණ දෙන්නේ මන්ද යන්න.

- මැතිවරණයට අවම වශයෙන් මාස හයකට පෙර මෙම ද්‍රව්‍ය බෙදා හැරිය යුතු අතර, රූපවාහිනිය, ගුවන් විදුලිය සහ ඩිජිටල් වේදිකා හරහා උපරිම නැරඹුම් වේලාවන් තුළ නැවත නැවතත් විකාශනය කළ යුතුය.

## 1.4 පාසල් විෂයමාලා තුළ මැතිවරණ ව්‍යාපාර මූල්‍ය පිළිබඳ අධ්‍යාපනය ආයතනගත කිරීම

- ජාතික අධ්‍යාපන ආයතනය (NIE) විසින් මෙහෙයවනු ලබන අඛණ්ඩව කෙරෙන විෂයමාලා ප්‍රතිසංස්කරණ සන්දර්භය තුළ, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය සහ ප්‍රජාතන්ත්‍රවාදී වගවීම විෂයමාලා වලට ඒකාබද්ධ කිරීම පිළිබඳ යෙදවුම් සැපයීම සඳහා NIE, අදාළ අමාත්‍යාංශ, සිවිල් සමාජ සංවිධාන සහ විෂය කරුණු පිළිබඳ විශේෂඥයින් අතර ව්‍යුහගත සංවාද මාලාවක් සංවිධානය කළ යුතු ය. ප්‍රධාන තේමාත්මක ක්ෂේත්‍ර වලට ඇතුළත් විය යුත්තේ:

  - ඡන්දදායකයින්ගේ වගකීම සහ ප්‍රජාතන්ත්‍රවාදී වගවීම

  - කාන්තා දේශපාලන සහභාගිත්වය

  - මැතිවරණ ව්‍යාපාර මූල්‍ය නියාමනය සහ සදාචාරාත්මක මැතිවරණ පිළිවෙත්

  - සියලුම පළාත් පුරාවට ස්ථාවර හා ඵලදායී සැපයුමක් සහතික කිරීම සඳහා, ප්‍රමිතිගත පුහුණු අත්පොත් සහ තක්සේරු කිරීමේ ද්‍රව්‍ය මගින් උපකාරී වන, ප්‍රජා අධ්‍යාපන ගුරුවරුන් වෙනුවෙන් පුහුණුකරුවන් පුහුණු කරන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

## 1.5 විශ්වවිද්‍යාල තුළ ඡන්දදායක අධ්‍යාපන මුලපිරීම් පුළුල් කිරීම

විශ්වවිද්‍යාල තුළ ඡන්දදායක අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ සිවිල් සමාජ සංවිධාන අතර සහයෝගීතාවයට පහසුකම් සැලසීම.

- ප්‍රජාතන්ත්‍රවාදී වගවීම, සදාචාරාත්මක ප්‍රචාරක කටයුතු, මැතිවරණ ව්‍යාපාර මූල්‍ය, සහ කාන්තා දේශපාලන සහභාගීත්වය වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන, විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රේක්ෂකාගාරයන්ට ගැලපෙන පරිදි සකස් කරන ලද වැඩමුළු.

- විවිධ සමාජ-ආර්ථික සහ ආන්තිකකරණය වූ දෘෂ්ටිකෝණයන් ඇතුළත් කිරීම සඳහා විවිධ කලාප හරහා විශ්වවිද්‍යාලවලින් නියෝජනය සහතික කරමින්, මුදලට අගයක් දෙන මැතිවරණ වල සමාජීය හා දේශපාලනික පිරිවැය පිළිබඳ අන්තර් විශ්ව විද්‍යාල සංවාද සහ විවාද.

- තරුණ පුළුල් ප්‍රේක්ෂකාගාර ඉලක්ක කරගත්, මැතිවරණ ව්‍යාපාර මූල්‍ය සහ මැතිවරණ වල අවංකභාවයේ ගැටළු ප්‍රවේශ විය හැකි, මහජනයාට සුදුසු අන්තර්ගතයන් බවට පරිවර්තනය කරන, සිසුන් විසින් මෙහෙයවනු ලබන පර්යේෂණ සහ සමාජ මාධ්‍ය මුලපිරීම්.

### 1.6 ප්‍රජාව පදනම් කරගෙන ඡන්දදායකයින් සඳහා අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීම

- ඡන්දදායක සංජානන සමීක්ෂණ සොයාගැනීම් වලින් උකහා ගෙන, ග්‍රාමීය සංවර්ධන සමිති, තරුණ සංවිධාන සහ කාන්තා සමිති වැනි බිම් මට්ටමේ සංවිධාන හරහා ප්‍රාදේශීය මට්ටමේ ඡන්දදායක අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, මෙම සංවිධාන කල් පවතින ලෙස ඡන්දදායකයින් සම්බන්ධ කර ගැනීම සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථාන ලෙස භාවිතා කිරීම.

- ඡන්ද මිලදී ගැනීම සහ සේවාදායකයින් අරමුණු කරගත් (clientelistic) හුවමාරු සාමාන්‍යකරණයට ක්‍රියාකාරීව අභියෝග කරන ව්‍යුහගත ගම්-මට්ටමේ සාකච්ඡා සහ සහභාගීත්ව ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා ප්‍රජා පහසුකම් සපයන්නන් පුහුණු කිරීම.

- පුද්ගලික අනුග්‍රහයන් වෙනුවෙන් කෙරෙන ඡන්ද හුවමාරුව පැහැදිලිවම අධෛර්යමත් කිරීම සඳහා ගමේ සංවර්ධනය, රාජ්‍ය සේවා සැපයීම සහ සමාජ සාධාරණත්වය සඳහා එවැනි භාවිතයන් සම්බන්ධ කිරීමෙන් දිගුකාලීන ප්‍රතිවිපාක සමග වැඩසටහන් අන්තර්ගතයන් සැලසුම් කිරීම.

- කෙටි කාලීන පුද්ගල ජයග්‍රහණ වලට වඩා, ප්‍රජාව සඳහා වන පුළුල් ප්‍රතිඵල මත පදනම්ව මැතිවරණ තීරණ ගැනීමට ඡන්දදායකයින් දිරිමත් කරමින්, බෙදාහදාගත් සංවර්ධන ප්‍රමුඛතා පිළිබඳ සාමූහික ආවර්ජනයකට පහසුකම් සැලසීම.

- දේශපාලන දැනුවත්භාවය, ප්‍රාදේශීය නායකත්වය සහ ප්‍රජා මට්ටමේ වගවීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම සඳහා කාන්තා සමිති සමග සමීපව කටයුතු කිරීමෙන් කාන්තාවන් සහ ආන්තික කණ්ඩායම් වල සහභාගීත්වයට ප්‍රමුඛතාවය දීම.

## 2.0 කාන්තා දේශපාලනඥයින් සමඟ සම්බන්ධ වීම

මෙම අධ්‍යයනයෙන්, විශේෂයෙන් ආර්ථික වශයෙන් ආන්තිකකරණයට ලක් වූ සහ ග්‍රාමීය කාන්තාවන් අතර, මැතිවරණ ප්‍රචාරක මූල්‍ය නීතිය පිළිබඳ කාන්තාවන්ගේ දැනුවත්භාවයේ සැලකිය යුතු විෂමතා අනාවරණය විය.

බොහෝ කාන්තා දේශපාලනඥයින් වියදම් වාර්තා සම්පූර්ණ කිරීම සඳහා පක්ෂ නිලධාරීන් හෝ අනුග්‍රාහකයින් මත විශ්වාසය තැබූ අතර, එය කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය අඩපණ කරන අතර, ඔවුන් නෛතික අවදානමට නිරාවරණය කරයි. මෙම හිඩැස් ආමන්ත්‍රණය කිරීම සඳහා ඉලක්කගත, ප්‍රායෝගික හ සවිබලගැන්වීම කෙරෙහි දිශානත වූ මැදිහත්වීම් අවශ්‍ය වේ.

ක්‍රියාමාර්ග ගත හැකි නිර්දේශ

කෙටි කාලීන ක්‍රියාමාර්ග (මාස 6-24)

### 2.1 කාන්තා අපේක්ෂිකාවන් සඳහා පූර්ව-මැතිවරණ පුහුණු ස්ථාපිත කිරීම

- මැතිවරණ කොමිෂන් සභාව, සිවිල් සමාජ සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝග යෙන්, පළාත් පාලන සහ ජාතික මැතිවරණ සඳහා තරග වදින කාන්තා අපේක්ෂිකාවන් වෙනුවෙන් දිස්ත්‍රික් මට්ටමේ පූර්ව-මැතිවරණ පුහුණු වැඩමුළු සංවිධානය කළ යුතු ය.

- සියලුම කාන්තා අපේක්ෂිකාවන් දැනුවත් කර මෙම පුහුණුවීම්වලට සහභාගී වීමට අවස්ථාව ලබාදීම සහතික කිරීම වැදගත් වේ. මන්දයත්, සමහර කාන්තාවන්ට බොහෝ විට බහුවිධ මුලපිරීම් සඳහා ආරාධනා කරනු ලබන අතර අනෙක් අය සම්පූර්ණයෙන්ම බැහැර කිරීමට ලක් විය හැකිය.

### 2.2 නෛතික දැනුම දේශපාලන සවිබල ගැන්වීමට සම්බන්ධ කිරීම

- පුහුණු මොඩියුල මඟින් මැතිවරණ ව්‍යාපාර මූල්‍ය සාක්ෂරතාවය පහත සඳහන් දෑ සඳහා මෙවලමක් ලෙස පැහැදිලිව සකස් කළ යුතු ය.
- දේශපාලන අනුග්‍රාහකයින් සහ පක්ෂ තැරැව්කරුවන් මත යැපීම අඩු කිරීම.
- ඡන්දදායකයින් අතර විශ්වසනීයත්වය සහ විශ්වාසය ඉහළ නැංවීම.
- දේශපාලන පක්ෂ තුළ කාන්තා බලය ශක්තිමත් කිරීම සහ සමාන කොන්දේසි මත තරඟ කිරීමට ඔවුන්ගේ හැකියාව ශක්තිමත් කිරීම.
- අධික ප්‍රචාරක වියදම් වළක්වා ගත හැකි ආකාරය පැහැදිලිව පෙන්නුම් කරන වැළැක්වීමේ උපායමාර්ග පිළිබඳව කාන්තා අපේක්ෂිකාවන්ට වැඩසටහන් හඳුන්වා දිය යුතු ය. මෙයට ක්‍රියාකාරකම් උපාය මාර්ගිකව කාල නියම කිරීම, කල් පවතින ප්‍රජා සහභාගීත්වය සහ ස්වේච්ඡා සේවකයින් මත පදනම් වූ ප්‍රචාරණය වැනි නිර්මාණාත්මක, අඩු පිරිවැයක් සහිත සහ නීතියට අනුකූල වන ප්‍රචාරක ක්‍රම ප්‍රදර්ශනය කිරීම ඇතුළත් විය යුතු අතර, එමඟින් අධික හෝ නීති විරෝධී වියදම් වලට යොමු නොවී, දේශපාලන දෘශ්‍යතාව, ඡන්දදායකයින් සම්බන්ධවීම සහ මැතිවරණ විශ්වසනීයත්වය සාක්ෂාත් කරගත හැකි බව ශක්තිමත් කළ යුතුය.

## 3.0 බලධාරීන් සමඟ සම්බන්ධ වීම

දුර්වල බලාත්මක කිරීම මැතිවරණ ව්‍යාපාර මූල්‍ය නියාමනයේ සඵලතාවට ප්‍රධාන බාධකයක් ලෙස පවතී. අනුකූලතාවය අඩපණ කරන පද්ධතිමය ගැටළු ලෙස, අසම්පූර්ණ වාර්තාකරණය, ස්ථාවර නොවන අධීක්ෂණය සහ භාෂාමය බාධක අධ්‍යයනයෙන් හඳුනා ගෙන ඇත.

ක්‍රියාමාර්ග ගත හැකි නිර්දේශ

ක්ෂණික ක්‍රියාමාර්ග (මාස 0-6)

### 3.1 බලාත්මක කිරීමේ අධිකාරිය සහ ක්‍රියාපටිපාටි ශක්තිමත් කිරීම

- මැතිවරණ කොමිෂන් සභාව පහත සඳහන් කරුණු දැක්වෙන පැහැදිලි, ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය හැකි බලාත්මක කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය:

- අධීක්ෂණ ක්‍රියාපටිපාටි
- විගණන නිර්ණායක
- අනුකූල නොවීම සඳහා පනවන සම්බාධක
- ප්‍රමාණය ඉක්මවා කෙරෙන වියදම් සහ අසම්පූර්ණ වාර්තා කිරීම් විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාව තුළ විශේෂිත ඒකකයක් පත් කළ යුතු ය.
- වගවීම සහතික කිරීම සඳහා මැතිවරණ කාලවල දී ස්වාධීන වියදම් විගණන පැවැත්වීම.

### 3.2 විනිවිදභාවය සහ භාෂා වෙත ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම

- සම්පූර්ණ ප්‍රවේශ්‍යතාව සහතික කිරීම සඳහා සියලුම වාර්තාකරණ මාර්ග, මාර්ගෝපදේශ සටහන් සහ නෛතික පැහැදිලි කිරීම් සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂාවෙන් ලබාගත හැකි විය යුතු ය.

කෙටි කාලීන ක්‍රියාමාර්ග (මාස 6-24)

### 3.3 අඛණ්ඩව පවතින නීති සාක්ෂරතාවය සහ උපදේශන යාන්ත්‍රණ නිර්මාණය කිරීම

- කාන්තා අපේක්ෂිකාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, අපේක්ෂකයින්ට තථ්‍ය-කාලීන මගපෙන්වීමක් ලබාදීම සඳහා කැපවූ මැතිවරණ ව්‍යාපාර මූල්‍ය උපකාරක කවුළුවක් හෝ ක්ෂණික දුරකථන අංකයක් ස්ථාපිත කිරීම.
- අපේක්ෂකයින් හට මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය මහ මැතිවරණ ක්‍රියාවලීන්ට අදාළ උල්ලංඝනයන්, බිය ගැන්වීම් හෝ අක්‍රමිකතා වාර්තා කිරීමට ඉඩ සලසන, නිර්නාමිකව එසේ කිරීමේ විකල්පය සමග ප්‍රවේශ විය හැකි, මාර්ගගත පැමිණිලි යාන්ත්‍රණයක් (උදා: Android යෙදුමක්) හඳුන්වා දීම.
- විශ්වසනීයත්වය සහ විශ්වාසය පවත්වා ගැනීම සඳහා, දේශපාලන පක්ෂ වලින් ස්වාධීන පුහුණු නිලධාරීන් හෝ නීති උපදේශකයින් විසින් මෙම යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කරන බවට සහතික වීම.

දිගුකාලීන ක්‍රියාමාර්ග (අවුරුදු 2-5)

### 3.4 ආයතනික ධාරිතාව වෙනුවෙන් ආයෝජනය කිරීම

- මැතිවරණ කොමිෂන් සභාවේ අධීක්ෂණ සහ විමර්ශනය කිරීමේ ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා රජය විසින් කැප කළ අයවැය ශීර්ෂ වැය කළ යුතු අතර, ප්‍රමාණවත් මානව සම්පත් සහතික කිරීම විශේෂයෙන් අවධාරණය කළ යුතු ය.

# 4.0 දේශපාලන පක්ෂ සමඟ සම්බන්ධ වීම

අධ්‍යයනයෙන් පෙනී යන්නේ බොහෝ දේශපාලන පක්ෂවලට කාන්තා දේශපාලනඥයින් ඇතුළත් කරන්නේ ප්‍රධාන වශයෙන් අනිවාර්ය 25% කෝටාව සපුරාලීම සඳහා බවත්, පිරිමින්ට ලබාදෙන සහයෝගය, සම්පත් හෝ පිළිගැනීම ඔවුන්ට ලබා නොදෙන බවත් ය. බොහෝ අවස්ථාවන්හි දී, කාන්තාවන් ජයග්‍රහණය කිරීමේ විභවයක් ඇති බරපතල තරග වදින්නන් ලෙස නොව, සංකේතාත්මක ඇතුළත් කිරීම් ලෙස සලකනු ලැබේ. මෙම අසමතුලිතතාවය ආමන්ත්‍රණය කිරීම සඳහා දේශපාලන පක්ෂ සංකේතාත්මක නියෝජනයෙන් ඔබ්බට ගොස් පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක කොටසක් ලෙස කාන්තා දේශපාලන සහභාගීත්වයට ක්‍රියාකාරීව සහයෝගය දීම අවශ්‍ය වේ.

ක්‍රියාමාර්ග ගත හැකි නිර්දේශ:

ක්ෂණික ක්‍රියාමාර්ග (මාස0-6)

### 4.1 වෙනස්වන දේශපාලන සංස්කෘතිය පිළිබඳව දේශපාලන පක්ෂ සමඟ සම්බන්ධ වීම

- සේවාදායක දෘෂ්ටිකෝණයෙන් බලන, පුරුෂ කේන්ද්‍රීය භාවිතාවන්ගෙන් ඉවත් වී, වඩාත් විනිවිද බවින් යුතු සහ සමස්තය ඇතුළත් කරන දේශපාලන සංස්කෘතියක් කරා පරිවර්තනය වීම ප්‍රවර්ධනය කිරීම සඳහා පක්ෂ නායකත්වය සමඟ ව්‍යුහගත සංවාදයන්ට මුල පිරීම.

- කාන්තා දේශපාලනඥයින්ට සාධාරණ සහයෝගයක් සහ වගකීමෙන් යුතු මැතිවරණ ව්‍යාපාර මූල්‍ය භාවිතාවන් මඟින් පක්ෂ විශ්වසනීයත්වය ඉහළ නැංවිය හැකි ආකාරය සහ ප්‍රතිසංස්කරණ-මනසක් සහිත ඡන්දදායකයින් ආකර්ෂණය කර ගත හැකි ආකාරය, 2022 අරගල ව්‍යාපාරයෙන් පාඩම් උකහා ගනිමින් පෙන්නුම් කිරීම.

කෙටි කාලීන ක්‍රියාමාර්ග (මාස 6-24)

### 4.2 උපදේශකත්වය සහ නායකත්වය සංවර්ධනය කිරීමේ වැඩසටහන් ස්ථාපිත කිරීම

- දේශපාලන විශ්වාසය, අරමුදල් රැස් කිරීමේ කුසලතා සහ මහජන දෘශ්‍යතාව ශක්තිමත් කිරීම සඳහා පළපුරුදු දේශපාලනඥයින් කාන්තා අපේක්ෂිකාවන් සමඟ සම්බන්ධ කරමින් විධිමත් උපදේශකත්ව ජාල නිර්මාණය කිරීම.

- කාන්තාවන්ගේ උපායමාර්ගික, සංවිධානාත්මක සහ මැතිවරණ ප්‍රචාරක හැකියාවන් ගොඩනැගීම සඳහා පක්ෂ තුළ ඉලක්කගත නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 4.3 කාන්තාවන්ගේ දේශපාලනික සවිබල ගැන්වීම කෙරෙහි කාන්තා ශාඛා නව දිශානතියකට යොමු කිරීම සඳහා පුහුණු කිරීම්

- සංකේතාත්මක භූමිකාවන්හි ක්‍රියාත්මක වීමට වඩා, ඔවුන්ගේ පක්ෂ තුළ කාන්තා දේශපාලනඥයින්ට සහාය වීම, සම්පත් සැපයීම සහ ප්‍රගමනය කිරීම සඳහා පවතින ව්‍යුහයන් ලෙස කාන්තා ශාඛාවල දේශපාලන වරම පැහැදිලි කිරීම සඳහා, ඉලක්කගත පුහුණු සහ පහසුකම් සැපයීමේ වැඩසටහන්වලට සහාය වීම.

- ඔවුන් විසින් රැස් කරන අරමුදල් සාමාන්‍ය පක්ෂ මූල්‍යකරණයට හෝ අවිධිමත් අනුග්‍රාහක ජාලවලට අවශෝෂණය කිරීමට වඩා, කාන්තා අපේක්ෂිකාවන්ගේ ව්‍යාපාරවලට සහාය වීම සඳහා විනිවිදභාවයෙන් හා උපායමාර්ගිකව යොමු කරන බව සහතික කරමින්, කාන්තා ශාඛා තුළ අභ්‍යන්තර වගවීම සහ මූල්‍ය පාලන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම.

- කාන්තා අපේක්ෂිකාවන් මුහුණ දෙන ව්‍යුහාත්මක අවාසි අවම කිරීම සඳහා, මැතිවරණ ව්‍යාපාර සම්පත් සඳහා සහයෝගය, ප්‍රචාරක කටයුතු සැලසුම් කිරීම, දැනුමැතිකම් ලබාදීම සහ උපායමාර්ගික මඟපෙන්වීම ඇතුළුව, මැතිවරණ තරඟ තුළ සැමට සමාන අවස්ථාවන් සහිත අවකාශයක් නිර්මාණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ලෙස කාන්තා ශාඛාවලට ක්‍රියා කිරීමට හැකිවන පරිදි ධාරිතා වර්ධනය සහ ආකල්ප වෙනස් කිරීමේ මුලපිරීම් සපයා දීම.

දිගුකාලීන ක්‍රියාමාර්ග (අවුරුදු 2-5)

## 4.4 සාධාරණත්වය සඳහා පක්ෂ වලට අභ්‍යන්තර මාර්ගෝපදේශ හඳුන්වා දීම

- කාන්තා අපේක්ෂිකාවන් සඳහා අරමුදල්, සැපයුම් සහාය සහ මාධ්‍ය ප්‍රවේශය ඇතුළුව මැතිවරණ ව්‍යාපාර සම්පත් සාධාරණ ලෙස වෙන් කිරීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර ප්‍රතිපත්ති සකස් කර බලාත්මක කිරීම.
- කාන්තා දේශපාලනඥයින්ට පිරිමින් හා සමාන කොන්දේසි මත තරඟ කළ හැකි බව සහතික කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ කෙරෙහි ඇති අනුකූලතාව නිරීක්ෂණය කිරීම සහ ඇගයීම.

# REFERENCES


Agrawal, K. (2021). Reforming political finance for more diversity in political office. International IDEA.

Athukorala, S., Ramanathan, S., Applegate, M., & Bibler, S. (2021, September). Women's political representation in Sri Lanka: Electoral system analysis and recommendations. International Foundation for Electoral Systems (IFES). https://www.ifes.org/publications/womens-political-representation-sri-lanka-electoral-system-analysis-and

Bandarage, A. (2010). Women, Armed Conflict and Peacemaking in Sri Lanka: Towards a political economy perspective. Asian Politics & Policy, 2(4), 653–667.

Bari, F. (2010). Women's political participation: Issues and challenges in Pakistan. United Nations Division for the Advancement of Women.

Bjarnegård, E., Håkansson, S., & Zetterberg, P. (2022). Gender and violence against political candidates: Lessons from Sri Lanka. Politics & Gender, 18(1), 33–61.

Bjarnegård, E., & Zetterberg, P. (2020). Gender and violence against political candidates. Routledge.

Campaign for Free and Fair Elections. (2017). Regulation of campaign finances and the electoral process in Sri Lanka.

Crenshaw, K. (1989). Demarginalizing the intersection of race and sex: A Black feminist critique of antidiscrimination doctrine, feminist theory and antiracist politics. University of Chicago Legal Forum, 1989(1), 139–167.

de Alwis, M. (1995). Gender, politics and the "respectable lady." In P. Jeganathan & Q. Ismail (Eds.), Unmaking the Nation: The Politics of Identity and History in Modern Sri Lanka (pp. 137–157). Colombo: Social Scientists' Association.

de Mel, N. (2001). Women and the Nation's Narrative: Gender and Nationalism in Twentieth Century Sri Lanka. Rowman & Littlefield.

de Mel, N., Peiris, P., & Gomez, S. (2013). Broadening gender: Why masculinities matter—Attitudes, practices and gender-based violence in four districts in Sri Lanka. CARE International Sri Lanka.

Department of Census and Statistics. (2023). Sri Lanka Labour Force Survey: Annual Report 2022. Department of Census and Statistics.

Department of Elections, Sri Lanka. (2024). Parliamentary election 2024 results.

Gunatilaka, R. (2013). To work or not to work? Factors holding women back from market work in Sri Lanka (ILO Working Paper No. 994838403402676). International Labour Organization.

Hattotuwa, S. (2024, August 23). Sri Lanka's official election spending cap is a mockery of the law. LinkedIn.

International Foundation for Electoral Systems. (2022). Women’s political representation in Sri Lanka: Electoral system analysis and recommendations [PDF]. https://www.ifes.org/sites/default/files/migrate/ifes_womens_political_representation_in_sri_lanka.pdf

Jalalzai, F. (2013). Shattered, cracked, or firmly intact? Women and the executive glass ceiling worldwide. Oxford University Press.

Jayawardena, K. (1986). Feminism and Nationalism in the Third World. Zed Books.

Jayawardena, K. (2017). Labour, Feminism & Ethnicity in Sri Lanka: Selected Essays. Colombo: Sailfish.

Kodikara, C. (2010, October 18). Why women in politics always matters: A conversation with Chulani Kodikara. Groundviews.

Kodikara, C. (2011, March). Sri Lanka: Where are the women in local government? OpenDemocracy.

Kottegoda, S. (2023). Unpaid care work is work. Polity, 11(1), 85–87.

Krook, M. L. (2010). Why are fewer women than men elected? Gender and the dynamics of candidate selection. Political Research Quarterly, 63(2), 366–380.

Krook, M. L., & Mackay, F. (Eds.). (2011). Gender, politics and institutions: Towards a feminist institutionalism. Palgrave Macmillan.

Liyanage, K. (2018). Women and political parties in Sri Lanka. In A. Shastri & J. Uyangoda (Eds.), Political parties in Sri Lanka: Change and continuity. New Delhi: Oxford University Press.

Muragala Foundation. (2024, February). An assessment of women’s political representation through the 25 percent quota in Sri Lanka: Impact and lessons learnt (S. A. Prabha M. Manuratne, H. B. Dassanayake, R. Gamage, & K. Abeygunawardena, Authors). Muragala Foundation.

Nazneen, S. (2018). Binary framings, Islam and struggle for women's empowerment in Bangladesh. Feminist Dissent, 3, 194–230.

Nazneen, S., & Mahmud, S. (2012). Gendered politics of securing inclusive development. BRAC Development Institute.

Paik, S. (2018). 'New' Dalit women and their 'improper' politics. Economic and Political Weekly, 53(24), 16–18.

Peiris, P., & Lecamwasam, H. (2021). Necessary yet insufficient: Women's quota for wider political representation in Sri Lanka. Women and Media Collective.

Peiris, P. (2023). Sri Lanka’s bipolarized multiparty system: Democratizing the selection of rulers, not their rule. In S. Iwanaga & G. Sardesai (Eds.), Rethinking parties in democratizing Asia (pp. 195–217). Routledge.

Perera, M. (2024, December 22). Campaign finance law: Concerns over EC’s limited powers. The Morning.

Siriwardhana, I. W. (2022). Women’s political representation in Sri Lanka: Does finance matter? (Asian Schools Working Paper No. 6). Bandaranaike Centre for International Studies.

Skanthakumar, B. (2024, November 22). Sri Lanka’s people have kicked out the old political class. Jacobin.

Sritharan, N. (2024). Unveiling the margins: Women, caste, class, and post-war development in Sri Lanka’s North and East. In K. N. Ruwanpura & A. M. Saleem (Eds.), Routledge Handbook of Contemporary Sri Lanka (pp. 194–206). Routledge.

Transparency International Sri Lanka (TISL). (2016). Annual report 2015: Electoral integrity and governance in Sri Lanka.

Transparency International Sri Lanka (TISL). (2023). Recommendations on the Election Campaign Finance Bill.

Transparency International Sri Lanka (TISL). (2023). Review of the Regulation of Election Expenditure Act No. 3 of 2023 as per standards for integrity in political finance.

United Nations Population Fund Sri Lanka. (2025, August 22). Barriers to Women’s Political Participation in Sri Lanka: A literature review.

Uyangoda, J. (2012). Minority rights, political inclusion and state reform: The case of Up-Country Tamil community in Sri Lanka. In Social Scientists' Association (Ed.), Reframing democracy: Perspectives on the culture of inclusion and exclusion in contemporary Sri Lanka (pp. 129–162). Colombo: Social Scientists' Association.

Venugopal, R. (2011). The politics of market reform at a time of civil war: Military fiscalism in Sri Lanka. Economic and Political Weekly, 46(49), 67–75.

Welikala, A. (Ed.). (2012). The Sri Lankan Republic at 40: Reflections on constitutional history, theory and practice (Vols. I–II). Centre for Policy Alternatives.

Wickramasinghe, M., & Kodikara, C. (2012). Representation in politics: Women and gender in the Sri Lankan Republic. In The Sri Lankan Republic at 40: Reflections on constitutional history, theory and practice (Vol. 2, Chapter 20). Centre for Policy Alternatives.

Woodward, C. A. (1969). The Growth of a Party System in Ceylon. Brown University Press.

WEDO (Women’s Environment and Development Organization). (2007). Women candidates and campaign finance: Research and policy recommendations.

Transparency International Sri Lanka
366, Nawala Road, Nawala,
Rajagiriya,
Sri Lanka.

Phone: +94 11 4 369 781
Fax: +94 11 2 865 777
Email: tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

twitter.com/tisrilanka
lk.linkedin.com/company/tisrilanka
facebook.com/tisrilanka
instagram.com/transparency_sri_lanka
youtube.com/user/tisrilankatube